# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2014** ඔක්තෝබර් **07** වන අඟහරුවාදා
2014 ஐப்பசி 07 செவ்வாய்க்கிழமை
Tuesday 07th October 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.43 ට පළාත් සභාව රැස් විය.**
**மு.ப. 09.43 க்கு சபை கூடியது**
*The Provincial Council met at 09.43 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு தவிசாளர் .[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# නිවේදන
## ANNOUNCEMENTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් කටයුතු කරමින් සිටි ජී. නිහාල් ප්‍රේමශාන්ත ගරු මන්ත්‍රීතුමා වෙනුවට, 2014.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමාව මා විසින් නම් කරන ලද බව මේ ගරු සභාවට දැනුම් දෙනවා.*

*ii*

*"විදුලිබල හා බල ශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන හා ජල පවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් කටයුතු කරන ලද යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා වෙනුවට 2014.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජී. නිහාල් ප්‍රේමශාන්ත ගරු මන්ත්‍රීතුමාව මවිසින් නම් කරන ලද බව දැනුම් දෙනවා.*

*iii*

*ගිණුම් කාරක සභාව නියෝජනය කරන ලද සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා වෙනුවට ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමාව 2014.01.07 එනම්, අද දින සිට ගිණුම් කාරක සභාවට පත් කරන ලද බව ප්‍රකාශ කර සිටිනවා.*

*iii*

*මෙම අවස්ථාවේ බස්නාහිර පළාත් සභාව වෙනුවෙන් මම ඉතාමත්ම ගෞරවයෙන් පිළිගනු ලබනවා, උතුරු පළාත් සභාවේ ගරු සභාපති සී.වී.කේ. සිවඥානම් මැතිතුමාව. එතුමා, අද මෙහි පැමිණ ඇති අතර, එතුමාව ඉතාමත් ආදරයෙන්, ගෞරවයෙන් යළිත් පිළිගන්නා අතර, ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් එතුමා අමුත්තන්ගේ ගැලරියේ අසුන්ගෙන ඇති බවත් දැනුම් දෙනවා.*

*iv*

*අද දින සභාගත කරන ලද නිල (හැන්සාඩ්) වාර්තාවේ මුල් පිටුවේ සඳහන්ව ඇති 2014 සැප්තැම්බර් 09 යන දිනය හා කලාප අංක 10 යන්න සහ පැති පිටුවල ඉහළින් සඳහන් එකී දිනයම 2014 සැප්තැම්බර් 23 හා 11 වන කලාපය, යනුවෙන් නිවැරදි විය යුතු බව මෙම සභාවට දැනුම් දෙනවා.*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2014.09.24 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, හොරණ, පානදුර පාර, අංක 151/10 හි පදිංචි ඩබ්ලිව්.එල්. ජයතිලක, හොරණ, පානදුර පාර, අංක 151/6 හි පදිංචි එම්.ජේ. කීර්තිවංශ සහ හොරණ, පානදුර පාර, අංක 151/8 හි පදිංචි එස්. හෙන්දවිතාරණ යන අය විසින් ඉදිරිපත් කර ඇති පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

දෙහිවල, කළුබෝවිල, කන්දවත්ත මහල් නිවාස අංක C/1/7 හි පදිංචි දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික මන්ත්‍රී සමිත නලින්ද යන අය විසින් ඉදිරිපත් කර ඇති පෙත්සම් 02 ක් මම ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, දෙහිවල, රෝහල පාර, ජය ශ්‍රී මාවත, අංක 56 හි පදිංචි කේ. සීතා රංජනී ගුණවර්ධන යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

## පළාත් සභා මාර්ග සංවර්ධනය
PROVINCIAL COUNCIL ROAD DEVELOPMENT

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය ]***
*[ Adjourned Question]*

**01.**

**යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බල ශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභ සාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/14/34)**

අ. පසුගිය පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු එම වකවානුව තුළදී පළාත් සභා මාර්ග කොපමණ ප්‍රමාණයක් සංවර්ධනය කර තිබේද?

ආ. එම පළාත් සභා මාර්ග දිස්ත්‍රික් වශයෙන් හා මැතිවරණ කොට්ඨාශ වශයෙන් නම් කළ හැකිද?

ඇ. එම වකවානුව තුළදී සංවර්ධනය කළ පාරවල් සඳහා සියලුම මුදල් මේ වන විට ගෙවා නිම කර ඇත්ද?

ඈ. එම මුදල් කුමන අමාත්‍යාංශ අරමුදලින් ගෙවීම සිදු කර ඇත්ද?

ඉ. එම වකවානුව තුළදී ගිවිසුම් අත්සන් කර නිම නොකළ පාරවල් තිබේද? එම පාරවල් නම් කළ හැකිද?

ඊ. එම පළාත් සභා පාරවල් සංවර්ධන කටයුතු ආරම්භ කිරීමටත් ප්‍රථම අත්තිකාරම් මුදල් ගෙවා ඇත්ද? එම පාරවල් නම් කළ හැකිද?

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

අ. මාර්ග 02 කි.

ආ. ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන මැතිවරණ කොට්ඨාශයේ අම්බලමුල්ල කටුනායක මාර්ගය හා ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම මැතිවරණ කොට්ඨාශයේ හග්ගල්ල හැඩිදෙණි කන්ද මාර්ගය වේ.

ඇ. නැත. (ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අරමුදල් මගින් කොටස් මුදල් ගෙවීම් සිදු කර ඇත.)

ඈ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ අරමුදල්.

ඉ. ඔව්.

1. නැදුන්ගහහේන ඇඹරළුව මාර්ගය - මහර මැතිවරණ කොට්ඨාශය
2. කටාන මාර්ගය - කටාන මැතිවරණ කොට්ඨාශය සහ කටුනායක කදිරාන මාර්ගය - කටාන මැතිවරණ කොට්ඨාශය.

ඊ. නැත.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, මගේ පළමුවන ප්‍රශ්න මාලාවේ අතුරු ප්‍රශ්න තුනක් මා යොමු කරනවා. මම ඇත්තටම පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් මෙම ප්‍රශ්න මාලාව ඉදිරිපත් කිරීමට හේතුව ගරු සභාපතිතුමනි, පළාත් සභාව විසුරුවාට පස්සේ සිදු වුණු දේවල් ගැන දැන ගන්න අවශ්‍ය නිසයි. ගරු අමාත්‍යතුමා සඳහන් කළ දේවල් මට පිළිගන්න බැහැ. ඒ වාගේම මේ මුදල් ගෙවීම් සිදු කර ඇත්ද කියන පළමුවන අතුරු ප්‍රශ්නය මම ඉදිරිපත් කරනවා. දෙවැනි එක පෙළක් කොන්ත්‍රාත්කරුවන්ට මේ ඇමතිතුමාම පවසනවා ඒ ඇමතිතුමාගෙන්ම අහන්නය කියලා. එතකොට කවුද ඒ ඇමතිතුමා? එහෙම කිව්වා කියලා ඒක පිළිගන්නවාද? එතකොට මේක පරස්පර විරෝධීයි. අමාත්‍යාංශය වෙන් වෙන්න පුළුවන්. මට මේක දැන ගන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

කොහොමත් අතුරු ප්‍රශ්න නැහැ. කොහේද තිබෙන්නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

දැන් ඉදිරියේදී ඔබතුමා ජනාධිපති අපේක්ෂක නේ? මේකට උත්තර දෙන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

තවත් ප්‍රශ්නයක් අහන්න කියන්න. උත්තර දෙන්නම්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඉතින් ඔබතුමන්ලාගේ මණ්ඩලයේ තිබෙන ප්‍රශ්නවලට මේ කොන්ත්‍රාත්කරුවෝ පළි නැහැ. මේ කොයි ඇමතිතුමාගේ කාලයේද කියන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

අපේ මණ්ඩලයේ ප්‍රශ්න නැහැ. මණ්ඩලයේ ප්‍රශ්න තිබෙන්නේ ඔයගොල්ලන්ගේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

කවර ඇමතිතුමාගෙන්ද අහන්න කියන්නේ? ඒ කොන්ත්‍රාත්කරුවන්ට කියන්නේ කොයි ඇමතිතුමාගෙන්ද අහන්න කියලාද? මීට ඉස්සෙල්ලා හිටියේ නිමල් ලන්සා ඇමතිතුමා. මම අහන්නේ ඒක පිළිගන්නවාද? ඔබතුමා එහෙම කියලා තිබෙනවාද?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ප්‍රශ්නයක් නැහැ. දැනුම් දීලත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් වාඩි වෙන්න. දැන් ප්‍රශ්න අහලා ඉවර නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඔබතුමා පිළිගන්නවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. එතුමා උත්තර දෙයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

උත්තර දෙන්න කෝ එහෙම නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න ඇසීමේදී අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ. ඔබතුමා එතුමාට උත්තරයක් දෙන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මේ උත්තරේ එතුමාට පැහැදිලි මදි නම් තව ප්‍රශ්නයක් අහන්න. විස්තර සහිතව. එතකොට මම උත්තර දෙන්නම්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, මම විස්තර සහිතව තමයි ඇහුවේ. මෙතුමා පළාත් මාර්ග විතරක් නොවෙයි, අනන්ත අප්‍රමාණ ප්‍රාදේශීය සභා පාරවල් ගිවිසුම් නැතිව අත්සන් කරලා හදලා. දැන් ගෙවන්න යන කොට තමයි මේ ප්‍රශ්න මතු වෙලා තිබෙන්නේ. මේ ගැන මට සම්පූර්ණ විස්තරයක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මෙතුමාට පොඩ්ඩක් මොලේ වැඩි වුණාට මට කරන්න දෙයක් නැහැ. මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ පළාත් මාර්ග.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඒක තමයි අද කාටුන් එකේ තියෙනවා ඔලුවට ගහනවා. ජනාධිපති අපේක්ෂක වෙන්න යන්නේ. ජනාධිපති අපේක්ෂක. ඉස්සෙල්ලාම නගර සභාවේ නගරාධිපති වෙන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මන්ත්‍රීතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න. පළාත් පාලන මාර්ග පිළිබඳ ප්‍රශ්න ඇහුවා නම්, ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙනවා. පළාත් සභා පාරවල් ගැන ඇහුවාම පළාත් සභා පාරවල්වලට අදාළව අපි උත්තරයක් දුන්නා. ඉතින් එතුමාට අපට උත්තර දෙන්න පුළුවන් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

පළාත් සභා අමාත්‍යාංශය මගින් කියලා වචනය අහලා තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මට අංජනම් එළියෙන් පේන්නේ නැහැ නේ? මෙතුමාගේ ඔලුවේ තිබෙන ඒවා. එහෙම පේනවා ද මට?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඔබතුමා ඉදිරියේදී ඉදිරිපත් කරන්න කෝ. මම අතුරු ප්‍රශ්නය ඇහුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සූදානම් ද එතුමාගේ අතුරු ප්‍රශ්නවලට ලබන සභා වාරයේදී පැහැදිලි උත්තරයක් ලබා දෙන්න. ඔබතුමාට දැන් මේ මොහොතේ අපහසු නම්, ඔබතුමා ලබන සභා වාරයට උත්තරයක් දෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඔබතුමා දන්නේ නැත්නම් නිමල් ලාන්සා ඇමතිතුමාගෙන් අහගෙන හරි ඉල්ලලා දෙන්න.

***න්‍යාය පත්‍රයේ අංක 02, 03 හා 04 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් උදය ප්‍රභාත් ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්න ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The questions in the name of the Hon. Lakshman Nipuna Arachchi., - Member, under item No. 02, 03 and 04 in the agenda was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it by the Hon. Minister, Mr Udaya Prabahath Gammanpila on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 05 යටතේ එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් උදය ප්‍රභාත් ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්න ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. S.M. Marikkar, - Member, under item No. 05 in the agenda was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it by the Hon. Minister, Mr Udaya Prabahath Gammanpila on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීට පෙර පැවති රැස්වීම්වලදී පිළිතුරු ලබා දීමට කල් ගත් ප්‍රශ්නවලට ගරු අමාත්‍යවරු සූදානම් නම්, මේ අවස්ථාවේදී ඒ සඳහා පිළිතුරු ලබා දෙන්න පුළුවන්.

## පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බස්නාහිර පළාතේ සෞඛ්‍යයට අහිතකර ආහාර විකිණීම පිළිබඳව නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. එතුමාට විනාඩි 03 ක කාලයක් ලබා දෙනවා. එතුමා සභා ගර්භයේ නැහැ. ඊළඟට කේ.ඩී. ලාල් කාන්ත ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු කේ.ඩී. ලාල්කාන්ත**
Hon. K.D. Lalkantha

ගරු සභාපතිතුමනි, පළාත් රාජ්‍ය සේවයේ විශාල සේවකයින් ප්‍රමාණයක් ඉන්න බව අපි කවුරුත් දන්නවා. පළාත් රාජ්‍ය සේවකයින් විශාල ප්‍රමාණයක් පසුගිය දිනවල අපත් සමඟ සාකච්ඡා කළා, ඔවුන්ගේ මූලික ගැටළු කිහිපයක් සම්බන්ධයෙන්. එකක්, ඔවුන් විශ්‍රාම යන කොට මුහුණ දෙන ගැටළුවක් සම්බන්ධයෙන්. අනික් කාරණය ඔවුන්ගේ අතිකාල සම්බන්ධ ප්‍රශ්නය. අනික් කාරණය ඔවුන්ගේ දීමනා පිළිබඳ ප්‍රශ්නය. ඉදිරියේදී, මේ මාසේ 24 වැනිදා දැන් ජාතික අයවැය ඉදිරිපත් වෙනවාය කියන අදහසක් ජනමාධ්‍ය වාර්තා කරලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගේත්, මේ සභාවේත් අවධානය යොමු කරන්න කැමැතියි. මෙන්න මේ පළාත් රාජ්‍ය සේවකයන්ගේ තිබෙන ප්‍රශ්න කිහිපය පදනම් කර ගෙන එළඹෙන ජාතික අයවැයේදී ඒ සම්බන්ධයෙන් අපේ පළාත් සභාවේ අවධානය ආණ්ඩුවට යොමු කිරීම අරමුණු කර ගෙන ඒ ප්‍රශ්නවලට උත්තර ලබා ගැනීම සම්බන්ධයෙන් යෝජනාවක් හෝ අපේ සභාවේ දැනුම් දීමක් මධ්‍යම ආණ්ඩුවට කරන්න පුළුවන් නම්, ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කිරීම අරමුණු කර ගෙනයි මම මේ ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ.

ගරු සභාපතිතුමනි, මේ වන කොට ජීවන වියදමේ විශාල ඉහළ යාමක් තිබෙනවා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් දන්නවා. වර්තමාන ආණ්ඩුව 2005 දී බලයට ඇවිල්ලා 2006 ජනවාරිවලදී තමයි ප්‍රථම වැටුප් වැඩි වීම කළේ. ඒ වැටුප් වැඩි කිරීමට අනුව රාජ්‍ය සේවයේ අවම වැටුප රුපියල් එකොළොස් දහස් හත්සිය තිහයි. පළාත් රාජ්‍ය සේවයේ අවම වැටුප වෙන්නේ රු. 11,730 යි. ඒ වන කොට ජීවන වියදම ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දර්ශකවලට අනුව, බඩු මල්ලක මාසික ජීවන වියදම සඳහන් වෙලා තිබෙනවා, රු. 25,344 යි කියලා. නමුත් පසුගිය ජූනි මාසේ 30 වන කොට ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව එය රු. 50,792 ක් දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. එතකොට රු. 25,344 ඉඳන් රු. 50,792 ක් දක්වා ඉහළ යන කොට ජීවන වියදමේ ඉහළ යාම තිබෙනවා, රු. 25,448 කින්. නමුත් රාජ්‍ය සේවකයන්ට 2006 න් පස්සේ විටින් විට, විටින් විට ගෙවන ලද දීමනාවල මුළු එකතුව බවට පත් වෙලා තිබෙන්නේ, රු. 10,146/- යි. ඒ අනුව බැලුවාම වැඩි වුණු ජීවන වියදමට අනුව රාජ්‍ය සේවකයන්ට දීමනා ගෙවලා නැහැ. හිඟයක් තිබෙනවා. ඒ හිඟ ප්‍රමාණය වෙනවා රු. 15,302 ක්. සාමාන්‍යයෙන් ජාත්‍යන්තරවත්, ජාත්‍යන්තර කම්කරු සම්මේලනයත්, අපේ රටෙත් පිළිගත් ප්‍රමිතියක් තිබෙනවා. ජීවන වියදම ඉහළ යන කොට ඊට සමාන්තරව රාජ්‍ය සේවයේ වැටුප් ඉහළ යා යුතුයි කියලා. ඒක පිළිගත් මූල ධර්මයක්. එතකොට ඒ මූල ධර්මයට අනුව තව රු. 15,302 ක් වර්තමාන රජය රාජ්‍ය සේවකයන්ට ගෙවිය යුතුව තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කළ යුතුව තිබෙනවා. මෙවර ජාතික අයවැයේදී රාජ්‍ය සේවකයන්ගේ මේ හිඟ ජීවන වියදම් මුදල රජය මගින් ගෙවන්න කටයුතු කරන්නය කියලා. අවම වශයෙන් මේ වන කොට පොදු අදහසකට ඇවිල්ලා තිබෙනවා, අඩු තරමින් රු. 15,302 න් රු. 10,000 ක වත් වැටුප් වැඩි වීමක් රාජ්‍ය සේවකයන්ට ලබා ගැනීම සුදුසුයි කියලා. එහෙම ඉල්ලීමක් පොදුවේ රාජ්‍ය සේවය තුළ ඉදිරිපත් වෙලා තිබෙනවා.

ඒ වාගේම විශ්‍රාම යන අයට බරපතළ ප්‍රශ්නයක් උදා වී තිබෙනවා. ඔවුන් අද විශ්‍රාම යන කොට විශ්‍රාම යන්නේ, 2006 මූලික වැටුපට. නමුත් ඔවුන් විශ්‍රාම යන්න ඕනෑ අද වැටුපට. නමුත් අද වැටුපට නොවෙයි ඔවුන් විශ්‍රාම යන්නේ 2006 වැටුපට නිසා, පසුගිය කාලය පුරාම රජය මගින් අයවැයෙන් වැඩි කරන ලද සහ ඉන් අනතුරුව වැඩි කරන ලද දීමනා සියල්ල මූලික වැටුපට එකතු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වෙලා තිබෙනවා. මොකද, මූලික වැටුපට එකතු නොකිරීම නිසා ඔවුන් විශ්‍රාම යන කොට අඩු වැටුපකට විශ්‍රාම යන්නේ. විශ්‍රාම පාරිතෝෂිකය ලැබෙන්නේ අඩු මුදලක්. දැන් බැංකුවකින් ණයක් ගන්න යන කොට ලැබෙන්නේ ඉතාම අඩු මුදලක්. අතිකාල සඳහා ලබා ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ අඩු මුදලක්. ඉතින් ඒ නිසා මෙන්න මේ කියන කාරණා සියල්ල සැලකිල්ලට ගත්තාම රාජ්‍ය සේවකයන්ගෙන් වැඩි ප්‍රමාණයක් ඉන්නේ පළාත් රාජ්‍ය සේවයේ තමයි. ලක්ෂ 14 න් වැඩි ප්‍රමාණයක්. එතකොට අපට වගකීමක් තිබෙනවා පළාත් සභාවක් විධියට ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේ වන කොට පළාත් පාලන ආයතන ඉතාම තදින් දූෂිත තත්ත්වයට පත් වෙමින් යනවා. මේවායේ ඉන්න බොහෝ සභාපතිවරු, බොහෝ

[ ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා ]

මන්ත්‍රීවරු අද මහජන සේවයට වඩා කීයක් හරි ගතමනාවක් සොයාගෙන ජීවත් වෙන්නට ඕනෑය කියන තැනට පත් වෙමින් තිබෙනවා. එම තත්ත්වයම හෝමාගම ප්‍රාදේශීය සභාව දිහා බැලුවාමත් අපට පේන්න තිබෙනවා. දැන් පසුගිය කාල පරිච්ඡේදය තුළ මම හිතන්නේ, හෝමාගම ප්‍රාදේශීය සභාව විතර උසාවිය ඉස්සරහ සිටිය වෙනත් ආයතනයක් නැතිව ඇති. සභාපතිවරු හරියට සංගීත පුටු තරඟය වාගේ තමයි. මාසයයි එක්කෙනෙක් ඉන්නේ. තව මාසයක තව කෙනෙක්. මිනිස්සුන්ට මේ මාසේ ඉන්න සභාපතිවරයා කවුද කියලා සොයා ගන්න බැරි තරමටම පත් වෙලා.

මම මේ මතු කරන්නේ ගරු සභාපතිතුමනි, හෝමාගම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර කිහිපයක තීන්ත ආලේප කිරීම සඳහා මේ වන කොට ලක්ෂ 100 කට වඩා වැඩි මුදලක් වියදම් කරලා තිබෙනවා. මේ වියදම් කිරීම නීත්‍යානුකූල නොවන තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. හබරකඩ ආදාහනාගාරයේ වැටේ තීන්ත ආලේප කරන්නත්, ආදාහනාගාරයේ තීන්ත ආලේප කරන්නත්, ලක්ෂ 25 කට වැඩිය මුදලක් අද වියදම් කරලා තිබෙනවා. මේ වියදම් කළා විතරක් නොවෙයි, මේ ඇස්තමේන්තු මහ සභාවට ඉදිරිපත් කළ දිනය, ඇස්තමේන්තු අනුමත කරපු දිනය, ඒ වාගේම වැඩ ආරම්භ කරන්න කොන්ත්‍රාත් සමිති එක්ක ගිවිසුම් ගත දිනය, මේ සියල්ලම එකකට එකක් පරස්පර විරෝධී තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මීගොඩ ආදාහනාගාරයේ වැට අලුතින් සකස් කරලා, ආදාහනාගාරයේ තීන්ත ආලේප කරන්න ලක්ෂ 20 කට ආසන්න මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ ආදාහනාගාරයේ ඒ කටයුත්ත කරද්දී වැට සකස් කරන්න ගියාම පරණ වැටේ තිබුණු දැල සම්පූර්ණයෙන්ම ගලවාගෙන ගිහිල්ලා. අද ඒ වැටේ තිබුණු දැල් ආවරණයට වුණු දෙයක් නැහැ. ඒ වැට අයිනේ තිබුණු ගස් පහක් කපාගෙන ගිහිල්ලා තිබෙනවා. ඒවා ප්‍රාදේශීය සභාවට භාර දීලා නැහැ. ඒ නිසා මේවායෙන් පැහැදැලිව පෙනෙන කාරණය තමයි ගරු සභාපතිතුමනි - මේවා සමිති හරහා ක්‍රියාත්මක වෙනවා. සමිති හරහා ක්‍රියාත්මක වුණාට මේවායේ වැඩ කටයුතු කරන්නේ, කොන්ත්‍රාත් කරන්නේ මන්ත්‍රීවරු. අද 5% ක් ඇතිව මන්ත්‍රීවරු එක්කෝ කොන්ත්‍රාත්කරුවන්ට භාර දෙනවා. එහෙම නැත්නම් සමහර මන්ත්‍රීවරු අද පාලම් බෝක්කු යට කොන්ත්‍රාත් කරනවා. ඒ නිසා මේ පළාත් පාලන ආයතන පිළිබඳව තිබෙන ගෞරවය අද විනාශ වෙලා.

ඒ වාගේම කෝටි ගණනක් වියදම් කරලා අද මෝටර් ග්‍රේඩරයක් අරන් තිබෙනවා. ඒ මෝටර් ග්‍රේඩරයේ තලය මම හිතන්නේ අදාළ පළාත් පාලන ආයතනයට අයිති පාරවල්වලට දාන්න බැහැ. මාර්ග අධිකාරියට ගත්තා නම් ඒක වෙනම දෙයක්. පළාත් පාලන ආයතනවල තිබෙන පාරවල්වලට ඒක පාවිච්චි කරන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේදී මතක් කරන එකම දේ - ගරු ප්‍රධාන අමාත්‍යතුමා නැහැ. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ කාරණාව සම්බන්ධව මීට වඩා අවධානය යොමු කරලා - මම හිතන්නේ, ජරා ජීර්ණ වන පළාත් පාලන ආයතන රැක ගැනීමේ වගකීම ගරු ප්‍රධාන අමාත්‍යවරයාට තිබෙනවා. ඒ නිසා 5% කොන්ත්‍රාත්කරුවෝ ඉවත් කර ගෙන, මන්ත්‍රීවරු කොන්ත්‍රාත් කරන තත්ත්වය වෙනස් කරලා, මේ ආයතනවල ගෞරවයත් රැකෙන්න, මන්ත්‍රී පදවියේ ගෞරවයත් රැකෙන්න - අද හුඟ දෙනෙක් කියනවා, මේ පළාත් සභාවට මන්ත්‍රීවරයෙක් විධියට එනවාට වඩා හොඳයිලු පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙක් වෙලා ඉන්න එක. මීට වඩා හොඳට හම්බ කර ගෙන, ගණනක් සොයා ගෙන කොන්ත්‍රාත් එකත් කරලා, 5% ට වැඩේ දීලා නිදහසේ ඉන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙලාලු. මේක සමාජගත වෙන කොට මේ පළාත් පාලන ආයතනයක තිබෙන කීර්තිමත් භාවය විනාශ වෙමින් යනවා. ඒ නිසා මේ පිළිබඳව මම ගරු සභාපතිතුමාට යෝජනාවක් කරනවා, මේ ප්‍රකාශ කරපු අදහස පිළිබඳව පළාත් පාලන කොමසාරිස්වරයා හරහා විධිමත්ව සොයලා බලලා වැඩ කටයුතු කරන්න අවශ්‍ය පියවර ගන්නය කියලා මම ඉතාම ගෞරවයෙන් යුක්තව ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව තිබෙන්නේ. මම ඔබතුමාට මේ කාරණාවට පෙරාතුව 34(1) රීතිය අනුව මට ඕනෑ නම් ඔබතුමාට මේක නොදී ඉන්නත් පුළුවන්. නමුත් ඔබතුමා මේ කාරණාව සම්බන්ධයෙන් කථා කරන කොට 64(1) රීතිය පිළිබඳව මම දැඩිව අවධානය යොමු කරනවා. ඒ නිසා ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා. 64(1) රීතිය යටතේ ඔබතුමාට කථා කරන්න එපාය කියන එක දැඩිවම ප්‍රකාශ කරනවා. බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ක්‍රිස් නෝනිස් මහතා සමඟ ආරවුලක් ඇති කර රාජ තාන්ත්‍රික අපහසුතාවය පිළිබඳව කනගාටුව පළ කිරීම. ඔබතුමාට විනාඩි 03 ක කාලයක් ලබා දෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ස්තුතියි ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම පසුගියදා නිව්යෝර්ක් නගරයේදී මාධ්‍යවල පළ වුණා අපි දැක්කා, බ්‍රිතාන්‍යයේ තානාපති දොස්තර ක්‍රිස් නෝනිස් මහතාට පහර දීමක් සම්බන්ධයෙන්. ගරු සභාපතිතුමනි, අපට මේකෙන් පේන දේ තමයි අද විදේශ අමාත්‍යාංශයත්, රජයේ විදේශ ප්‍රතිපත්තියත්, මේ රජය, ආණ්ඩුව ආරක්ෂා කරන රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ටත් අද එල්ල වෙලා තිබෙන මේ ගැටළුකාරී තත්ත්වය. පසුගිය කාලයේ මේ වාගේම අභ්‍යන්තර ගැටළුවලට මුහුණ දීලා, මේ වාගේම අභ්‍යන්තර තාඩන පීඩනවලට මුහුණ දීලා මේ රට වෙනුවෙන්, විශේෂයෙන්ම මේ ආණ්ඩුව වෙනුවෙන් රාජ්‍ය තාන්ත්‍රික සේවයේ යෙදුණු තමාරා කුනනායකම්, දයාන් ජයතිලක වාගේ ඒ මහත්ම මහත්මීන්ට තමන්ගේ ඒ රාජතාන්ත්‍රික සේවයෙන් අයින් වෙන්න සිද්ධ වුණා. ඒ සිද්ධ වුණේම, විශේෂයෙන් මේ ආණ්ඩුවේ තිබෙන මේ විදේශ ප්‍රතිපත්තිය හා ඒ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ට, තමන්ට අවශ්‍ය විධියට තමන්ගේ කටයුතු කර ගෙන යාමට මේ ආණ්ඩුවේ ඉන්න ඇතැම් පිරිස් ඉඩ නොදීමයි.

විශේෂයෙන්ම මේ වුණු සිද්ධිය විදේශ මාධ්‍ය තුළින් අපි දැක්කා. මේ දොස්තර නෝනිස් මහත්මයාට පහර දීම විදේශ මාධ්‍යවල පළ වුණා. ඒ පළ වීම තුළ අපි දන්නවා, මේ ආණ්ඩුවට දිගින් දිගටම මානව හිමිකම් චෝදනා එල්ල වෙනවාය කියලා. විශේෂයෙන්ම විදේශීය රටවල්වලින්. යුරෝපයෙන්. ඇමරිකාවෙන්. මුළු ලෝකයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධාන හරහා පසුගිය කාලයේ මේ ආණ්ඩුව මේ රටේ මානව හිමිකම් උල්ලංඝනය කරනවා කියන චෝදනා රාශියකට මුහුණ දෙන ආණ්ඩුවක්. එතකොට මේ ආණ්ඩුව ආරක්ෂා කරන්න මේ රාජ තාන්ත්‍රික නිලධාරීන් විශේෂයෙන්ම දොස්තර නෝනිස් මහත්මයා පසුගිය කාලය පුරාම යුරෝපයේ විශාල වැඩ කොටසක් කළා. එතුමා මේ ආණ්ඩුව ආරක්ෂා කරන්න දිගු වැඩ සටහනක් විතරක් නොවෙයි, නිර්භයව මේ ආණ්ඩුව ආරක්ෂා කරන්න පෙනී හිටපු රාජ්‍ය නිලධාරියෙක්. නමුත් අද ඒ රාජ්‍ය නිලධාරියාව පවා මේ ආණ්ඩුවට ආරක්ෂා කර ගන්න බැරි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ලන්ඩනයේ ගිය අවුරුද්දේ පවත්වපු හොඳම තානාපති නිලධාරියා හැටියට ඒ සම්මානය පවා එතුමාට ලබා ගන්න පුළුවන් වුණා, එතුමාගේ තිබෙන ඒ රාජ තාන්ත්‍රික සේවය හරහා. නමුත් ඒ වාගේ මේ රට වෙනුවෙන් සේවය කරපු, ඒ විතරක් නොවෙයි, මේ ආණ්ඩුව ආරක්ෂා කරන්න දිගින් දිගටම බ්‍රිතාන්‍යයේ ඉඳගෙන විදේශ මාධ්‍යවලට උත්තර දීගෙන මේ ආණ්ඩුව කොයි තරම් මේ රටේ මානව හිමිකම් උල්ලංඝනය කලත්, ඒවා වසන් කර ගෙන මේ ආණ්ඩුවට හොඳට කඩේ ගිය ඒ රාජ්‍ය තාන්ත්‍රිකයා පවා මේ ආණ්ඩුවට ආරක්ෂා කර ගන්න බැරි වුණා. අන්තිමට ඒ පහර දීපු මන්ත්‍රීතුමාව, එතුමා පිළිබඳව පරීක්ෂණයක් කරන්නේ නැතිව, ජනාධිපතිතුමා එතුමාව රෝමයට පවා එක්ක ගෙන ගියා, පාප් වහන්සේ මුණ ගැහෙන්න. අන්තිමට වතිකානුවෙන් පණිවිඩයක් දුන්නා ජනාධිපතිතුමාට. වතිකානුවට වණ්ඩින්ව එක්ක ගෙන එන්න එපාය කියලා. අන්තිමට ඒ මන්ත්‍රීතුමාව රෝමයේ නවත්වලා ජනාධිපතිතුමා ගියා පාප් වහන්සේ හමු වෙන්න. එතකොට අද මේ රටේ තිබෙන මේ විදේශ ප්‍රතිපත්තිය, විදේශ අමාත්‍යාංශයේ කඩා වැටීම මේක මුළු රටටම අගෞරවයක් විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, මේ රට වෙනුවෙන්, මේ ආණ්ඩුව වෙනුවෙන් යම්කිසි කාර්යභාරයක් කරන රාජ්‍ය නිලධාරීන්ටවත්, ඒ නිලධාරීන් ටිකවත් ආරක්ෂා කර ගන්න මේ ආණ්ඩුවට උවමනාවක් නැද්ද? එහෙම නැත්නම් මේක ආරක්ෂා කර ගන්න මේ ආණ්ඩුවට බැරිද කියන ප්‍රශ්නය අද ජනතාව ඉදිරියේ තිබෙනවාය කියන එක මතක් කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

## බස්නාහිර පළාත් මහ නගර සභා නගරාධිපතිවරුන්ට උප නගරාධිපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ නියෝග
## RULES FOR TRAVELLING EXPENSES PAYMENTS TO MAYORS, DEPUTY MAYORS AND COUNCILORS OF MUNICIPAL COUNCILS OF WESTERN PROVINCE

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industry, Environmental Affairs and Cultural and Art Affairs.) [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, *"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 289 වැනි වගන්තිය යටතේ, එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත්*

[ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා ]

*පරිපාලන, විදුලිබල හා බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා හා ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/19 දරන හා 2014.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද "බස්නාහිර පළාත් මහ නගර සභා නගරාධිපතිවරුන්ට උප නගරාධිපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ නියෝග" ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 289 වැනි වගන්තියේම වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන අතර, එකී නියෝගයන් අනුමත කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධව විස්තරාත්මකව සාකච්ඡා කිරීමට අපට ඕනෑ නම් කාලය වෙන් කරන්නත් පුළුවන්. එහෙම නැත්නම් අපට ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරලා ඒ ගැන තීන්දුවක් ගන්නත් පුළුවන්. මම හිතන්නේ එය අවශ්‍ය නැහැ. මේක ගෙවීමක් තිබෙන්නේ, නගරාධිපතිවරුන්ට, සභාපතිවරුන්ට සහ සභිකයන්ට. ඒ නිසා මේ අවස්ථාවේදී අපට ඒක සභා සම්මත කරන්නත් පුළුවන්. එකඟතාවය ඇතිව.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟයිද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

අපි එකඟයි. කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි එකඟයි. යොජනා තුනක් තිබෙනවා. මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා. අපිත් ප්‍රාදේශීය සභාවෙන් මේ තත්ත්වයට ආපු මන්ත්‍රීවරු වශයෙන් කියන්න කැමැතියි. ජනතාව අතරම ඉන්න උදවිය තමයි මේ පළාත් පාලන ක්ෂේත්‍රයේ ඉන්නේ. කිසිම ප්‍රශ්නයක් නැහැ. පළාත් සභා මන්ත්‍රීවරු වශයෙන් අපට දැන ගන්න ඕනෑ, මේ නියෝග, ඒ රීති මාලාවල් ඔබතුමන්ලා ළඟ අතේ තිබෙනවාද? නැත්නම් ඒ දීමනා ගෙවන කොට ආණ්ඩු පක්ෂයේ සභිකයන්ට, නගරාධිපතිවරුන්ට, සභාපතිවරුන්ට එක විධියක් වෙයිද? (බාධා කිරීම්) විපක්ෂයේ අයට තව විධියක් වෙයිද? එහෙම වෙලා තිබෙනවා. එම නිසා මේක පොඩ්ඩක් අපට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධව සාකච්ඡා කිරීමේදී සභා කටයුතු කාරක සභාවේදී අපි දෙපැත්තම මේ සම්බන්ධව තීන්දු කළා. සභාවට ඉදිරිපත් කරලා අපි තීන්දුවක් ගනිමු කියලා. ඒ නිසා කිසිම භේදයක්, ප්‍රශ්නයක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

නැහැ. භේදයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිසිම කෙනෙකුට හානියක් සිද්ධ වෙන්නේ නැහැ. මන්ත්‍රීවරු කිව්වාම දෙපැත්තම එකයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඒ රීති මාලාව අපට ලබා දෙන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මේ ප්‍රාදේශීය සභා පනතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එතැනට එනවා දැන්. එතැනදී අපි ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එහෙමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## බස්නාහිර පළාත් නගර සභා සභාපතිවරුන්ට උප සභාපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ රීති
RULES FOR TRAVELLING EXPENSES PAYMENTS TO CHAIRMEN, DEPUTY CHAIRMEN AND COUNCILORS OF URBAN COUNCILS OF WESTERN PROVINCE

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා** [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, *"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 193(1) (උඋ) වැනි උප වගන්තිය යටතේ, එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා හා ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/19 දරන හා 2014.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද "බස්නාහිර පළාත් නගර සභා සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ රීතීන්" ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 194 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන අනුව මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන අතර, එකී රීතීන් අනුමත කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට උප සභාපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ රීති
RULES FOR TRAVELLING EXPENSES PAYMENTS TO CHAIRMEN, DEPUTY CHAIRMEN AND COUNCILORS OF PRADESHIYA SABHA OF WESTERN PROVINCE

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා** [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, *"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184(1) උප වගන්තිය යටතේ, එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා හා ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/19 දරන හා 2014.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද "බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට උප සභාපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ රීතීන්" ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184(2) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන අතර, එකී රීතීන් අනුමත කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මේ තුන් වන යෝජනාවට අදාළව ප්‍රාදේශීය සභා පනතේ 184(1) (ඇ) යන්න යටතේ තමයි මේ කාරණය සඳහන් කරන්නේ. නමුත් ගැටළුව. මම දැන ගන්න කැමැතියි. මහ නගර සභා, නගර සභාවලට වඩා ඉතා විශාල භූමි ප්‍රදේශයක් තිබෙන්නේ ප්‍රාදේශීය සභාවට. එතකොට ඒ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ලැබෙන්නේ මාසයකට රුපියල් 2500 යි. ඒ නිසා 2500 ක් කියන ප්‍රමාණය යම්කිසි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන කාරණය ගැන අපි දිගින් දිගටම සාකච්ඡා කළා. අපි සභා කටයුතු කාරක සභාවේ සාකච්ඡා කළා. නමුත් එතැනදී අපට ලැබුණු උපදෙස තමයි සමහර ප්‍රාදේශීය සභාවල ලැබෙන ආදායම මදී. ඒ ලැබෙන ආදායමෙන් තමයි ඒ දීමනා ගෙවන්නේ. ඒ නිසා නගර සභාවලට දීමනා වැඩි කරලා තිබෙන්නේ. සමහර ප්‍රාදේශීය සභාවලට, වලල්ලාවිට ප්‍රාදේශීය සභාව වගේ ඒවාට ඒ දීමනා ගෙවන්න මුදල් නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දැන් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව වන කොට ලංකාවේ ජනගහනයට සහ භූමියට සමානුපාතික ලොකුම ප්‍රාදේශීය සභාව. සභිකයෝ ඉන්නේ 18 දෙනයි. අති විශාල ප්‍රදේශයක්. දිස්ත්‍රික්ක 05 කට වට වුණු ප්‍රදේශයක්. අනික් කාරණය තමයි දැන් මේ මුදල් ලබා ගැනීමට මන්ත්‍රීවරු - මම උදෙත් මේ කාරණය ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගෙන් විමසුවා. මේ මුදල ලබා ගැනීමට අති විශාල ලේඛන ප්‍රමාණයක් සම්පූර්ණ කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. දැන් අවශ්‍ය නැහැ. මේ යෝජනාවේ එහෙම අවශ්‍ය වෙන්නේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එතකොට මේකේ කාර්ය පටිපාටියක් සභාවට ගිහිල්ලා නැහැ. ලේකම්තුමිය සඳහන් කරන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කලින් නම් ඒ වාගේ පොඩි ගැටළු තිබුණා. පොඩි පොඩි ප්‍රශ්න. නමුත් මේ රීතිවල අපි එහෙම සඳහන් කරලා නැහැ. මේක බොහොම පහසුවෙන්ම ලබා ගන්න පුළුවන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ ක්‍රමවේදයත් මේ සමගම සභාවට දැනුම් දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. නැත්නම් අර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගැසට් එකේ පැහැදිලිව අපි ඒ සම්බන්ධව -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු මන්ත්‍රීතුමා, මේ කාරණයේදී මුදල නිශ්චිත කරලා තිබෙනවා. ඒක කරන්නේ දීමනාවක් හැටියට. එහෙම නැත්නම් වියදම් ප්‍රතිපූරණයක් නොවෙයි. ඒ නිසා වෙන කිසිම දෙයක් අවශ්‍ය වන්නේ නැහැ. ගමන් වියදම් දීමනාව විධියට අදාළ මන්ත්‍රීවරයාගේ දීමනාවලට එකතු කරලා මේක ලබා දෙනවා. ඔබතුමා කිව්වා වාගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ දීමනාව වැඩි කරන්න පුළුවන් නම් හොඳයි. නමුත් මේකට අපි පළාත් සභාවෙන් අරමුදල් දෙන්නේ නැහැ. ඒ නිසා ප්‍රාදේශීය සභාවලට ඒ හැකියාව අනුව තමයි කටයුතු කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපට වැඩි වෙන්නේ නැද්ද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඒක තීරණය කරන්න ඕනෑ පාර්ලිමේන්තුව. අපි අපේ යටතේ ඉන්න කට්ටිය බලා ගන්නවා. උඩ බලා ගන්න ඕනෑ අපිව.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු වැඩ බලන මහ ඇමතිතුමාගෙන් මම දැන ගන්න කැමැතියි. මේකට කිසිදු ලේඛනයක් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය නැහැ? දීමනාවට එකතු වෙනවා?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔව්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ අවස්ථාවේදී පෙරවරු තේ විවේකය සඳහා මෙම සභාව විනාඩි 15 කට කල් තබනවා.

*ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. **10.58** ට යළිත් රැස් විය.*
*Sitting, accordingly suspened untill 10.58 a.m. and then resumed.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : PRIVATE MEMBERS MOTION:

## අති භයානක ලෙස වර්ධනය වී ඇති මත්ද්‍රව්‍ය උවදුර රටින් තුරන් කිරීමට විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස රජයට යෝජනා කිරීම

PROPOSING TO THE GOVERNMENT TO IMPLEMENT A FORMAL AND IMMEDIATE PROGRAMME TO ERADICATE THE DANGEROUSLY SPREAD DRUG MENACE FROM THE COUNTRY

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ මත්ද්‍රව්‍ය බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස පත්ව ඇති බවට පොලිස් වාර්තාවලින් හෙළි වන බව මාධ්‍ය තුළින් වාර්තා වී ඇත.*

*ලෝකයේ යහ පැවැත්මට බරපතළ තර්ජනයක් වූ, මත්ද්‍රව්‍ය දිවයිනේ අස්සක් මුල්ලක් නොහැර සීඝ්‍ර ලෙස පැතිර ඇති අතර, පාසල් දරුවන් ඇතුළු තරුණ පරපුර දිනෙන් දින මීට ඇබ්බැහි වෙමින් පවතී. මෙහිදී බරපතළ අවදානමකට ලක්ව ඇත්තේ බස්නාහිර පළාතේ ළමා හා තරුණ පරපුරයි.*

*දකුණු ආසියාවේ විශාලතම මත්කුඩු තොග ශ්‍රී ලංකාවේදී අත්අඩංගුවට ගත්තද, ඒ පිළිබඳව විධිමත් නීතිමය ක්‍රියාමාර්ගයක් නොගැනීම මෙන්ම වරාය තුළදී බහාලුම් නිසි පරීක්ෂාවකින් තොරව මුදා හැරීම ද මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට විශාල අනුබලයක් වී ඇත.*

*මෙම සියලු තත්ත්වයන්ට රජය වගකිව යුතු අතර, උදාසීන බවින් මීදී දිවයිනේ අති භයානක ලෙස වර්ධනය වී ඇති මත්ද්‍රව්‍ය උවදුර මෙරටින් තුරන් කරලීම සඳහා විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

[ පූ.භා. 11.17 ]

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, බොහොමත්ම ස්තූතියි මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට අවසර ලබා දීම පිළිබඳව. විශේෂයෙන්ම මේ දවස්වල අපි ප්‍රවෘත්තියක් බැලුවොතින් හැම වෙලාවේම අහන්න, දකින්න ලැබෙන ප්‍රධානතම කරුණක් බවට පත් වෙලා තිබෙනවා, මේ මත්ද්‍රව්‍ය උවදුර. මෙය, අපේ රටේ අනාගත පරම්පරාව විශාල ගැටළුවකට පත් වන, මේ රටේ අනාගතයම සූරා කන උවදුරක් බවට පත් වෙලා තිබෙනවා. ඒ, මේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් පසුගිය වසර කිහිපය තුළ දකුණු ආසියාවේ මත්ද්‍රව්‍ය බෙදා දීමේ ප්‍රධානතම කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කර ගෙන ඇති නිසා. විශේෂයෙන්ම පකිස්ථානය, ඉන්දියාව ඇතුළු මේ දකුණු ආසියාවේ මත්ද්‍රව්‍ය බෙදා හැරීමේ වැඩ පිළිවෙළේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත් වෙලා තිබෙන්නේ, ශ්‍රී ලංකාව. දත්ත දිහා බලන කොට අපට ඒක හොඳට පෙන්නුම් කරනවා. ගරු සභාපතිතුමනි, මත්ද්‍රව්‍ය සම්බන්ධව අත්අඩංගුවට අරගැනීම් පිළිබඳව. මගේ ළඟ දත්ත තිබෙනවා. 2009, 2010, 2011 හා 2012 කියන මේ වර්ෂ කිහිපයේ. 2009 දී මුළු ලංකාවේම 18,743 දෙනෙක් අත්අඩංගුවට අරන් තිබෙනවා. එය 2009 සිට 2010 දක්වා වෙන කොට 18,000 ක ප්‍රමාණය 29,796 කට ඉහළ ගිහිල්ලා තිබෙනවා. 2010 සිට 2011 වර්ෂය වන කොට එය 29,000 සිට 42,503 කට ඉහළ ගිහිල්ලා තිබෙනවා. 2011 සිට 2012 වර්ෂය වන කොට එය 42,000 සිට 47,926 කට ඉහළ ගිහිල්ලා තිබෙනවා. එතකොට මේ රටේම මේ මත්ද්‍රව්‍ය ප්‍රශ්නය කොපමණ ඉක්මණට සීඝ්‍රයෙන් පැතිරී යනවාද කියන එක මේ දත්තවලින් හොඳට දැනෙනවා. හැබැයි, අපට තිබෙන තවත් ප්‍රධානතම ගැටළුවක් වෙන්නේ අපේ බස්නාහිර පළාත. මේ රටේ මෙවැනි මත්ද්‍රව්‍ය විශාල වශයෙන් පැතිරෙන කොට මෙම අත්අඩංගුවට ගැනීමෙන් 90% ක් පමණ බස්නාහිර පළාතේ

[ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

ඇති වෙලා තිබීම ප්‍රශ්නයක් හැටියට වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මෙම අත්අඩංගුවට ගැනීම් අපි පළාත් හැටියට බලන කොට උතුරු පළාතේ 194 ක්. මේ 2012 වර්ෂයේ. ඒ වාගේම උතුරු මැද පළාතේ 1161 ක්. නැගෙනහිර පළාතේ 1949 ක්. ඌව පළාතේ 980 ක්. දකුණු පළාතේ 4316 ක්. සබරගමුව පළාතේ 1332 ක්. ඒ වාගේම මධ්‍යම පළාතේ 2009 ක්. වයඹ පළාතේ 2074 ක් අත්අඩංගුවට ගන්න කොට, බස්නාහිර පළාතේ, අපි නියෝජනය කරන අපේ පළාතේ 33,911 දෙනෙක් අත්අඩංගුවට පත් වෙලා තිබෙනවා, 2012 වර්ෂයේදී. එය ඇත්තටම ජනගහනය දිහා බලන කොටත් එහෙම සිදු විය යුතුයි. මොකද, බස්නාහිර පළාතේ තමයි වැඩිම ජනගහනයක් ඉන්නේ. නමුත් අපි මෙම දත්ත දිහා බලන විට පැහැදිලි වෙනවා, මෙය අපේ පළාතට විශේෂ වූ ගැටළුවක්ව තිබෙන ප්‍රශ්නයක් බව.

අද කල්පනා කරලා බලන්න, ගරු සභාපතිතුමනි, දැන් වසර කිහිපයකට කලින් මත් ද්‍රව්‍ය ටිකක් ලංකාවට ගෙනාවා නම් ගේන්නේ කොපමණ අමාරුවකින්ද? එක්කෝ බෝට්ටුවලින්. එහෙම නැත්නම් අර විදේශිකයන් එන කොට ගුද මාර්ගයේ හංගාගෙන ඇවිල්ලා මේ රටට ඇතුළත් වුණාම තමයි මෙවැනි මත් ද්‍රව්‍ය අපේ ලංකාවට ගෙනාවේ. නමුත් අද ඇති වෙලා තිබෙන තත්ත්වය දිහා බලන්න. අද අපේ ආරක්ෂාව වැඩියෙන්ම තිබෙන ගුවන් තොටුපලවල්වලින්, අපේ ආරක්ෂාව වැඩියෙන්ම තිබෙන වරායෙන් මෙවැනි මත්ද්‍රව්‍ය ගෙනෙන කාල වකවානුවක් බවට අද උදා වෙලා තිබෙනවා. පසුගිය වසර කිහිපය තුළ අපි ගත්තොත් මේ වැටලීම් බහුතරයක් සිදු වෙලා තිබෙන්නේ වරායෙන්. එහෙම නැත්නම් ගුවන් තොටුපලෙන්. එදා අපි කවුරුත් දන්නවා, මේ හෙරොයින් වාගේ මත් ද්‍රව්‍යය කන් හැන්දක වාගේ ප්‍රමාණයක් තමයි පාවිච්චියට ගන්නේ. නමුත් අද කිලෝ 100 කට වඩා එක පාර අල්ලනවා. එක පාර කිලෝ 30, 40 කට වඩා වැඩි මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අත් අඩංගුවට අරගන්නවා අපි මාධ්‍යයෙන් දැකලා තිබෙනවා.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, අද ඇති වෙලා තිබෙන තත්ත්වය. මෙයට රාජ්‍ය අනුග්‍රහයක් තිබෙනවාද නැද්ද කියන ප්‍රශ්නය. මම පෞද්ගලිකව හිතන්නේ නැහැ, අපේ රටේ අගමැතිතුමා මේ මත්ද්‍රව්‍යවලට හවුල් කියලා. නමුත් ගරු සභාපතිතුමනි, මේක අපේ රටට ලොකු ගැටළුවක්ව තිබෙනවා. අගමැතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක් ලියුමක් ලියලා අවසර ගත්තාම මෙම නැවේ තිබෙන කන්ටේනරය ඉතා ඉක්මණින් එළියට දාන්නය කියලා. එතකොට ඒවාට මොනවාද කරලා තිබෙන්නේ? මේ සම්බන්ධීකරණ ලේකම්වරයා වෙනුවෙන් මොකක්ද අරගෙන තිබෙන පියවර? මේ රටේ අගමැතිවරයාගේ කාර්යාලයෙන් ලියුමක්, මෙහෙම මත්ද්‍රව්‍ය පිළිබඳව ලියුමක් ඇරියාම එතකොට අද ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව අපි කාටත් සාධාරණ සැකයක් එනවා. මේවා රජයේ ඉන්න ප්‍රධානීන් එකතු වෙලා, මේ රජයේ ඉන්න මැති ඇමතිවරුන් එකතු වෙලා කරන කටයුත්තක් දෝ කියන සැකය ඇති වෙලා තිබෙනවා. මම ඉල්ලීමක් කරන්නේ, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා අපේ ගරු මන්ත්‍රීතුමන්ලාව දැනුවත් කරන්න. අපේ පළාතට ඇති වෙලා තිබෙන මේ ගැටළුව විසඳාගන්න අපි හැමෝම එකතු වෙලා මෙම කටයුත්ත පුළුවන් තරම් ඉක්මණින් අඩු කරන්න අපි සියලු දෙනාම එකතු වෙලා මහන්සි වෙමුයි කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[ පූ.භා. 11.24 ]

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මේ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳ කාරණාව වර්තමානය වන කොට අපේ හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා සඳහන් කළ ආකාරයට ජනමාධ්‍ය ඔස්සේ වාගේම විපක්ෂය විශාල වශයෙන් මාතෘකාවක් බවට පත් කර ගෙන තිබෙනවා. එතුමා සඳහන් කරනු ලැබුවා. 2009 වර්ෂයේ ඉඳලා අත්අඩංගුවට ගත් පිරිස ප්‍රමාණාත්මකව වැඩි වීමක් තිබෙනවාය කියලා. ඒක ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වෙගෙන ඇවිල්ලා තිබෙනවාය කියලත් එතුමා පෙන්නුම් කරලා දුන්නා. මම ඊයේ මේ පිළිබඳව දත්ත ලබා ගත්තා. මේ වසරේ මේ මාස 10 තුළ මෙසේ අත්අඩංගුවට ගත් ප්‍රමාණය 17,000 ක් බවට පත් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, එතුමාගේ දත්ත - එතුමා ඉදිරිපත් කළේ 2012 වන කල් පමණයි. එතකොට මේ වසරේදී යම්කිසි අඩුවක් තිබෙන බවක් පෙන්නුම් කරනවා. නමුත් මම කියන්න උත්සාහ කරන්නේ, මේ කාරණාව නොවෙයි. මත්ද්‍රව්‍ය එහෙම නැත්නම්, මූලික වශයෙන් හෙරොයින් මුල් කර

ගනිමින් මත්ද්‍රව්‍ය මේ ආකාරයට අත්අඩංගුවට ගැනීම පසුබිම පිළිබඳවයි. මේ සාකච්ඡාවේදී, මේ විවාදයේදී ගරු සභාපතිතුමනි, මෙහි ඉතිහාසය පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කරන්නට අවශ්‍යයි. පොලිස් වාර්තාවලට අනුව 2014 දී කිලෝ 292 ක් හෙරොයින් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. නමුත් 2013 වසරේදී කිලෝ 330 ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඊට පෙර වසරවලදී මේ තත්ත්වය බැලුවොත් කිලෝ 130 යි, 85 යි, 45 යි ආදී වශයෙන් මෙහි අඩු ප්‍රමාණයක් දක්නට ලැබෙනවා. දැන් මේක දැකපු ගමන්ම විපක්ෂය චෝදනා කරනවා, වර්තමානය වන කොට අපේ රටට දැඩි ලෙස මත්ද්‍රව්‍ය ගේන්න පටන් අරගෙන තිබෙනවාය කියලා. නමුත් මීන් ඔබ්බට ගිහිල්ලා, මෙහි පසුබිම, මෙයට මූලික වෙලා තිබෙන පදනම අපි සොයා බැලිය යුතු වෙනවා ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, අපේ රටට මත්ද්‍රව්‍ය පැමිණෙන ප්‍රධානතම මාර්ගය බවට බුද්ධි අංශ සහ ආරක්ෂක අංශ හඳුනාගෙන තිබුණේ, මුහුදු මාර්ගයෙන් බෝට්ටුවලින් මත්ද්‍රව්‍ය ගෙන එනවාය කියන කාරණාව. විශේෂයෙන්ම එල්.ටී.ටී.ඊ. සංවිධානය සමග යුද්ධය පැවති සමයේ යුද්ධයට මුවා වෙලා බෝට්ටු මාර්ගයෙන් මත්ද්‍රව්‍ය එනවාය කියලා විශ්වාස කළා. ඒ වාගේම ශ්‍රී ලංකාව වටා මුහුදු තීරය තිබෙනවා. ධීවර කර්මාන්තය තිබෙනවා. මේ ධීවර බෝට්ටු හරහාත් නීති විරෝධීව මේ රට ආසන්නයේ සිදු කරනු ලබන මත්ස්‍ය මැරීම පදනම් කර ගනිමින්, ඒ බෝට්ටු හරහාත් මෙරටට මත්ද්‍රව්‍ය පැමිණෙනවාය කියලා බුද්ධි අංශ විශ්වාස කරනු ලැබුවා. නමුත්, 2009 දී යුද්ධය අවසන් වුණාට පස්සේ බුද්ධි අංශවලට වැඩි කාල සීමාවක් ලැබුණා මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න. එතැනදී බුද්ධි අංශ හඳුනා ගන්නවා බෝට්ටු මාර්ගයෙන් නොවෙයි, ගුදම් හරහා, එහෙම නැත්නම් බහාලුම් හරහා, ඒ කියන්නේ කන්ටේනර් හරහා තමයි ශ්‍රී ලංකාවට වැඩි වශයෙන් මත්ද්‍රව්‍ය පැමිණෙන්නේ කියලා. එහි ප්‍රතිඵලයක් විධියට විශේෂ කාර්ය බලකාය රට තුළ විශාල වශයෙන් ක්‍රියාත්මක වුණා. රේගුව විශේෂ කාර්යංශයන් පිහිටුවලා මේ පිළිබඳව පරීක්ෂණ පවත්වන්න කටයුතු කළා. ඒ විධියට මේ පිළිබඳව වැඩි වශයෙන් සොයා බැලීම සඳහා පරීක්ෂණ කිරීම සඳහා රජය විසින් බුද්ධි අංශ ශක්තිමත් කරනු ලබනවා. දැන් මේ ආකාරයට අපේ රටට බුද්ධි අංශ මේ වෙනුවෙන් යොමු කරන්නට ලැබෙන්නේ, එස්.ටී.එෆ් එක, එහෙම නැත්නම් විශේෂ කාර්ය බලකාය ඉස්සර ට්‍රාන්ස්ෆෝමර් ආරක්ෂා කරමින් නැගෙනහිර පළාතේ සේවයේ හිටපු ඒ විශේෂ කාර්ය බලකාය මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම සඳහා. අද රට පුරා විශේෂ මෙහෙයුම් දියත් කරනවා. මේක තමයි අද වන කොට වැඩි වශයෙන් මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගන්නවාය කියන කාරණාව පිටුපස තිබෙන යථාර්ථය. රජයත් ආරක්ෂක අංශත් හඳුනා ගන්නවා, මේ රටට මත්ද්‍රව්‍ය එන්නේ කොහොමද කියලා. නමුත් මේ ආකාරයට කන්ටේනර් හරහා ලෝකයේ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සිදු කිරීම සඳහා පදනම් වන කාරණා තිබෙනවා ගරු සභාපතිතුමනි. මම ඒ පිළිබඳව අවධානය යොමු කිරීමට පෙර රේගුවෙන් ලබා ගත් වාර්තා මම ඉදිරිපත් කරන්නම්. 2014 දී මේ දක්වා හෙරොයින් කිලෝ 130 ක් රේගුවේදී අත්අඩංගුවට ගන්නවා. 2013 දී ඒක 293 යි. 2012 දී ග්‍රෑම් 750 යි. 2011 දී කිලෝ එකහාමාරයි. 2010 දී කිලෝ 36 යි. එතකොට පැහැදිලිවම බුද්ධි අංශ විසින් හඳුනාගනු ලැබූ මේ කාරණයත් එක්ක රජය විසින් වැඩිපුර මුදල් යොදවලා, වැඩිපුර කණ්ඩායම් යොදවලා, වැඩිපුර පිරිස් බලය යොදවලා මේ ආකාරයට රටට මත්ද්‍රව්‍ය එන මාර්ගය හඳුනා ගත්තාට පස්සේ සහ අත්අඩංගුවට ගැනීම සඳහා විධිමත්, තියුණු ක්‍රියාමාර්ගයක් ගැනීම තුළින් තමයි මේ ආකාරයට මත්ද්‍රව්‍ය වර්තමානයේදී වැඩි වශයෙන් අත්අඩංගුවට ගැනීමට හැකි වෙලා තිබෙන්නේ. වැඩිපුර අත්අඩංගුවට ගැනීම ඇතුළේ තිබෙන ධනාත්මක සාධකය අපි අමතක කරලා, රට ඇතුළට මත්ද්‍රව්‍ය ගොඩක් එනවාය කියලා කෑ ගැසීම තුළ කිසිම පදනමක් නැහැ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම මෙතැනදී අවධානය යොමු කරනවා මේ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාලය පිළිබඳව. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාලය පිළිබඳව අපි බලද්දී එක්සත් ජාතීන්ගේ සංවිධානය පැහැදිලිව සඳහන් කරනවා, 2004 අවුරුද්ද වන කොට ලෝක මත්ද්‍රව්‍ය නිෂ්පාදිතයෙන් 87% ක් හදන්නේ ඇෆ්ගනිස්ථානයේ. ඇෆ්ගනිස්ථානයේ වර්ග කිලෝ මීටර 910 ක ඕපියම් වගා කරනවා. ඒ වාගේම 1999 තලෙයිබාන් පාලනය අතට ගත්තාට පස්සේ ඇෆ්ගනිස්ථානයේ තලෙයිබාන්වරු ඕපියම් වගාව තහනම් කරනවා. 910 ක් වුණු වර්ග කිලෝමීටර ගණන 38 ක් දක්වා පල්ලෙහාට වැටෙනවා. ඊට පස්සේ ඇමරිකාවයි බ්‍රිතාන්‍යයි ඇෆ්ගනිස්තානයේ නැවත වාරයක් යටත් කර ගත්තාට පස්සේ, යුද්ධය පටන් ගත්තාට පස්සේ නැවත වාරයක් ඇෆ්ගනිස්ථානයේ ඕපියම් වගාව වැඩි වෙලා 2004 වන කොට නැවත වාරයක් වර්ග කිලෝ මීටර් 800 ක් දක්වා මේ ඕපියම් වර්ධනය වැඩි වෙනවා. ඇයි මම

[ගරු සුසාර දිනාල් සිල්වා ]

මේ ඇෆ්ගනිස්ථානය ගැන කථා කරන්නේ. ඇෆ්ගනිස්ථානයට අමතරව පකිස්ථානයෙත් මේ ආකාරයට ඕපියම් වගාව තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ලෝකයේ මත්ද්‍රව්‍ය හදන ප්‍රධාන තැන් තුනක් තිබෙනවා. එකක් තමයි ඇෆ්ගනිස්ථානය සහ පකිස්ථානය. ඇෆ්ගනිස්ථානය තමයි අද ලෝක මත්ද්‍රව්‍ය නිෂ්පාදිතයෙන් 87% ක් හදන්නේ. දෙවැනියට රන් ත්‍රිකෝණය. බුරුමය, ලාඕසය, වියට්නාමය සහ තායිලන්තය පදනම් කර ගත්ත රන් ත්‍රිකෝණය. ඊළඟට හදනවා කොලොම්බියාවේ සහ මෙක්සිකෝවේ. කොලොම්බියාවේ ඩොලර් 10 ක් වන කිලෝ එකක් මෙක්සිකෝවට යද්දී ඩොලර් 1000 යි. ඒක ඇමරිකාවට යද්දී ඩොලර් 10,000 යි. කැනඩාවට යන කොට ඩොලර් ලක්ෂයයි. ඒ පැත්තේ මත්ද්‍රව්‍ය නිෂ්පාදිතය. දැන් මේ තැන් තුනේ මත්ද්‍රව්‍ය නිෂ්පාදිතය ලෝකය පුරා ව්‍යාප්ත වෙලා යන්නේ කොහොමද කියලා අපි බලන්න ඕනෑ. රන් ත්‍රිකෝණයේ හදන මත්ද්‍රව්‍ය ටික ආසියානු පැසිපික් කලාපය හරහා බෙදා හරිනවා. ඇමරිකාවට පල්ලෙහායින් හදන මත්ද්‍රව්‍ය ටික ඇමරිකාවට ඇතුළු වෙනවා. හැබැයි, ඇෆ්ගනිස්ථානයේ හදන මත්ද්‍රව්‍ය ටික යුරෝපයට තමයි ලෝක ඉතිහාසය පුරා ගමන් කළේ. කොහොමද ඇෆ්ගනිස්ථානයෙයි, පකිස්ථානයෙයි හදපු මේ මත්ද්‍රව්‍ය ටික යුරෝපයට ගියේ. ගරු සභාපතිතුමනි, තජිකිස්ථානය, ටර්ක්මෙනිස්ථානය, කසකස්ථානය වාගේ රටවල් හරහා මේගොල්ලෝ කැස්පියන් මුහුදට ගිහිල්ලා, කැස්පියන් මුහුද හරහා ජෝර්ජියාව, තුර්කිය, යුක්රේනය පහු කර ගෙන කළු මුහුද හරහා නැගෙනහිර යුරෝපා රටවල්වලට මේ මත්ද්‍රව්‍ය ටික අරගෙන ගියා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

අපට මේවා වැඩක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලෝකේ හදන්න පුළුවන්ද? ලංකාව ගැන කථා කරන්න.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා මම ඉල්ලීමක් කරනවා. මම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ කථාවේදී ආණ්ඩු පක්ෂය කිසිම බාධාවක් කළේ නැහැ. කරුණාකරලා මේක ජාතිකමය වශයෙන් වැදගත් කාරණාවක්. වැදගත් විධියට අහගෙන ඉන්නය කියලා මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මේ ආකාරයට නැගෙනහිර යුරෝපය හරහා යුරෝපයට මේ මත්ද්‍රව්‍ය ටික ගියා. හැබැයි, යුරෝපා සංගමය ඇති වීමත් සමඟ යුරෝපා සංගමයට මේ නැගෙනහිර යුරෝපා රටවල් එකතු වීමත් සමඟ නේටෝ සංවිධානය යූරෝ මිලියන ගණන්, බිලියන ගණන්, ට්‍රිලියන ගණන් වියදම් කරලා ඒ පැත්තෙන් වැට කඩොළු බැන්දා, මේ ඇෆ්ගනිස්ථානයෙන් යුරෝපයට එන මත්ද්‍රව්‍ය ටික නවත්වන්න. හැබැයි, 1999 වන කොට ලෝකයේ වැඩිපුරම මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කළේ ගුවන් මගින්. නමුත් 2001 අවුරුද්දේ සැප්තැම්බර් මාසේ 11 වැනිදා ඇමරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල වූ ප්‍රහාරයත්, ඊට අවුරුදු දෙකකට පස්සේ ජෝර්දානයේ ගුවන් තොටුපලකදී ඇති වුණු සිද්ධියත් පදනම් කර ගෙන ලෝකයේ ගුවන් යානා ක්ෂේත්‍රය තුළ දැඩි ආරක්ෂක වැට කඩොළු බැඳුණා. සෑම ගුවන් තොටුපලකම දැඩි ආරක්ෂක වැට කඩොළු බැන්දා. අන්න එතකොට ඇෆ්ගනිස්ථානයේ මත්ද්‍රව්‍ය ටික, පකිස්ථානයේ මත්ද්‍රව්‍ය ටික ලෝකය පුරා ව්‍යාප්ත කිරීමේ ගැටළුවක් ඇති වුණා. ගරු සභාපතිතුමනි, මේ ගැටළුව නිසා මොකක්ද සිද්ධ වුණේ? මේ මත්ද්‍රව්‍ය ටික ලෝකය පුරා ව්‍යාප්ත කරන්න මේ අය විකල්ප මාර්ග සොයා ගෙන ගියා. මේ අය බැලුවා, මේ ඇෆ්ගනිස්ථානයේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරය කරන්නේ අතිශය දරුණු ත්‍රස්තවාදී සංවිධාන. අතිශය දරුණු දැඩි මතධාරී ත්‍රස්තවාදී සංවිධාන. මේ අය බැලුවා කොහොමද මේ මත්ද්‍රව්‍ය ටික ලෝකය වටේට යවන්නේ. ඒ අය හඳුනා ගත්තා ආර්ථික වශයෙන් සීඝ්‍ර සංවර්ධනයකට ලක් වන රටවල් මොනවාද කියලා. ඒ රටවල්වල වරායන් මොනවාද? ඒ වරායන් ආශ්‍රිතව බහාලුම්වලට මුවා වෙලා කන්ටේනර්වලට මුවා වෙලා, ආනයන අපනයන ආර්ථිකයක් තිබෙන රටවල්වල ආනයන අපනයන ද්‍රව්‍යවලට, භාණ්ඩවලට මුවා වෙලා මේ මත්ද්‍රව්‍ය ටික ලෝකය පුරා ව්‍යාප්ත කරන්න ඒ අය කටයුතු කළා. අපි දන්නවා, 2004 වන කොට ඇමරිකාවේ මත්ද්‍රව්‍ය භාවිතයෙන් 60% ක් ගියේ ඇෆ්ගනිස්ථානයෙන්. 60% ක්. ඒ කියන්නේ ඔවුන් ගුවන් මගින් තමයි ඇමරිකාවට ඔවුන්ගේ හෙරොයින් යැව්වේ. නමුත් මේ ගුවන්

ප්‍රතිපත්තිවල තිබෙන දැඩි භාවය නිසා යුද්ධ ආශ්‍රිත තත්ත්වයක් ලෝකයේ ඇති වීමත් සමඟ අලුත් තත්ත්වයක් ඇති වුණා. ඒ තමයි වරාය හරහා මේක ව්‍යාප්ත කිරීමට. ඒ අනුව ගරු සභාපතිතුමනි, අපට පැහැදිලි වෙනවා, මේ වන කොට මොන ආකාරයටද මේ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සිද්ධ වෙන්නේ කියලා. (බාධා කිරීම්)

ගරු සභාපතිතුමනි, ඒ වාගේම තමයි මම දැන් මේ කාරණාව ගේනවා ශ්‍රී ලංකාවට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. කථා කරන්න දෙන්න.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ගරු සභාපතිතුමනි, මේ සඳහා මට කාලය අවශ්‍යයි. මේ බාධාකිරීම්වලට මට කාලය අවශ්‍යයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ගරු සභාපතිතුමනි, මත්ද්‍රව්‍ය ව්‍යාපාරය මේ රටේ ආරම්භ වුණේ කොහොමද කියලා ඊළඟට අපි කථා කරන්න ඕනෑ. මේ රටට මත්ද්‍රව්‍ය පැමිණීම ආරම්භ වෙන්නේ, 1977 විවෘත ආර්ථිකයත් එක්කලා. එදා ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ප්‍රකාශයක් කළා. මොකක්ද ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ප්‍රකාශය. Let the robber barons come කොල්ලකාරී සිටුවරුන්ට එන්නට ඉඩ හරින්නය කියලා. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා විවෘත ආර්ථිකය හඳුන්වලා දෙද්දී කිව්වා, කවුද? මේ කොල්ලකාරී සිටුවරු. මත්ද්‍රව්‍ය මේ රටට අරගෙන ආපු ව්‍යාපාරිකයෝ. එදා විවෘත ආර්ථිකය නිසා ඒ අය මේ රටට මත්ද්‍රව්‍ය ගෙනාවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ මේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයින් ඇල්ලුවේ නැහැ. මිනිස්සුන්ට මේ රටට මත්ද්‍රව්‍ය එන්න ඉඩ දීලා හිටියා. අන්න ඒක නිසා මේ රට ඇතුළේ මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වුණා. 1977 ට කලින් මේ රටේ මත්ද්‍රව්‍ය තිබුණේ නැහැ. දෙවැනි ලෝක යුද්ධය කාලෙන් පස්සේ මේ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය නැවතිලා තිබුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 05 ක කාලයක් වෙන් කරලා තිබෙනවා.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ස්තුතියි ගරු සභාපතිතුමනි. මේ සම්බන්ධව ඉතාම වැදගත් කාරණාවක් තිබෙනවා ගරු සභාපතිතුමනි. ශ්‍රී ලංකාවට මේ ආකාරයට මත්ද්‍රව්‍ය පැමිණීම ආරම්භ වන්නේ 1978 විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් එක්කලා, හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමන්ලා අපි ඉස්කෝලේ යන කාලයේ 1990 ට කලින් අපි සිංදුවක් ඇහුවා. හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමාට මතක ඇති. නිහාල් නෙල්සන් මහත්තයා ගීතයක් ගායනා කළා, 1990 දී. මේ කුඩු අත්හැරියේ නැත්නම් මගේ රට කුඩේ කුඩු කියලා. එහෙම කිව්වේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ. 1990 දී තමයි කලාකරුවන් කිව්වේ මේ රටේ කුඩු නවත්වන්න ඕනෑය කියලා. ඒ කියන්නේ මේ රටට කුඩු එන්න ගත්තේ ඊයේ පෙරෙයිදා නොවෙයි. මේ රටට කුඩු එන්න ගත්තේ 1990 ට කලින්. මේ රටට කුඩු එන්න ගත්තේ එක්සත් ජාතික පක්ෂ පාලනය යටතේ. හැබැයි, අපි කිසිම තැනක දැක්කේ නැහැ, ඒවා අත්අඩංගුවට ගන්නවා. අද ඉතා විශාල වශයෙන් අත්අඩංගුවට ගන්නවා. එතකොට මේ විශාල වශයෙන් අත්අඩංගුවට ගැනීම පිටුපස තිබෙන යාන්ත්‍රණය මොකක්ද? රජය විසින් ඉතාමත්ම පුළුල් වැඩ පිළිවෙළක් දියත් කරමින් බුද්ධි අංශත්, ආරක්ෂක අංශත්, ජාත්‍යන්තර පොලීසියත් එකතු වෙලා මේ අත්අඩංගුවට ගැනීම් සිද්ධ කරනවා. ගරු සභාපතිතුමනි, රජය මේ සිදු කරන අත්අඩංගුවට ගැනීම් සිදු කරනු ලබන්නේ, අපේ රටේ යහපත ගැන විතරක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙන් අනාගත පරපුරේ යහපත ගැන හිතලා. ඒ නිසා තමයි මේ සා විශාල වශයෙන් අත්අඩංගුවට ගැනීම් සිද්ධ වෙන්නේ. ඒ අනුව අපට බොහොම පැහැදිලි වෙනවා, මේ රටට මත්ද්‍රව්‍ය පැමිණීම ආරම්භ වුණේ, මේ රටේ මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වෙන්නේ, මේ රටේ මිනිස්සු, තරුණ තරුණියන් මත්ද්‍රව්‍ය භාවිතය පටන් ගන්නේ එක්සත් ජාතික පක්ෂ පාලන කාලයේ. නමුත් ඒ කාලේ මේවා අත්අඩංගුවට ගත්තේ නැහැ. මේවා අත්අඩංගුවට ගත්තේ නැහැ. අත්අඩංගුවට ගන්න යාන්ත්‍රණයක් තිබුණෙත් නැහැ. ඒගොල්ලෝ අත්අඩංගුවට ගන්න භය වුණා. ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ඒක endorse කරලා තිබුණේ. let the robber

[ගරු සුසාර දිනාල් සිල්වා ]

barons come කියලා. කොල්ලකාරී සිටුවරුන්ට එන්න දෙන්න කියලා තමයි මේ රටට විවෘත ආර්ථිකය ගෙනැල්ලා දැම්මේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, බොහොම පැහැදිලියි මේ කාරණාව. මේ රටේ මත්ද්‍රව්‍ය නතර කිරීම සඳහා මේ රජය ඉතාමත්ම වැදගත් වැඩ පිළිවෙළක් කර ගෙන යනවා. යුද්ධය අවසාන වුණාට පස්සේ බුද්ධි අංශ යොදවලා තිබෙනවා. මේ රටේ බුද්ධි අංශවල කොන්ද කඩලා, බුද්ධි අංශ විනාශ කරපු එක්සත් ජාතික පක්ෂයට අයිතියක් නැහැ මේ රටේ මත්ද්‍රව්‍ය අල්ලා ගැනීම සඳහා බුද්ධි අංශ කටයුතු කර ගෙන යනු ලබන මේ කාර්යය පිළිබඳව කථා කරන්න. ඉතා විශාල ලෙස, ඉතා පුළුල් ලෙස මේ ආකාරයේ යාන්ත්‍රණයක් මේ රටේ ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, තවත් වැදගත් කාරණාවක් තිබෙනවා. මේ ලෝකයේ මත්ද්‍රව්‍ය ව්‍යාප්ත කිරීම සඳහා ඇෆ්ගනිස්ථානය ප්‍රමුඛ රටවල් ශ්‍රී ලංකාව යොදා ගැනීමට ප්‍රධානතම හේතුවක් වෙලා තිබෙනවා, නාවික කේන්ද්‍රස්ථානයක් බවට, ආසියාවේ නාවික කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් වීම.

අපි දන්නවා. මොනවා හරි හොඳ වැඩක් කරන කොට ඒ හොඳ වැඩේ වටේට තවත් අයහපත් දේවල් ඇති වෙමින් පවතිනවා. ඒවා පාලනය කර ගැනීම, ඒ වෙනුවෙන් කටයුතු කිරීම තමයි වගකිවයුතු රජයක වගකීම වෙන්නේ. ඒ අනුව මේ රජය ඉතාමත් පැහැදිලි ලෙස මේ නාවුක කටයුතුවල දියුණුවත් එක්ක සිදු වන මේ මත්ද්‍රව්‍ය ජාත්‍යන්තර ප්‍රවාහනයට ශ්‍රී ලංකාව යොදා ගැනීමට වැට කඩොළු බැඳීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග කර ගෙන යන බව අපට පේනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු විශේෂ කාරණාවක් වෙතට මෙතැනදී අවධානය යොමු කරනවා. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, විශාල ප්‍රමාණයක් මේවා අත්අඩංගුවට ගන්නේ බස්නාහිර පළාත මුල් කර ගෙන කියලා. ඔව්. ඒක ඇත්ත. ඒකට හේතු දෙකක් තිබෙනවා. එකක් තමයි දේශීය මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ මේක ව්‍යාප්ත කළේ මැද කොළඹ සහ කොළඹ දිස්ත්‍රික්කය පදනම් කර ගෙන. නමුත් දෙවැනි කාරණය තමයි වැදගත්ම කාරණය. වරාය තිබෙන්නේ බස්නාහිර පළාතේ. ගුවන් තොටුපළ තියෙන්නේ බස්නාහිර පළාතේ. ඒක නිසා මේ අත්අඩංගුවට ගැනීම් සිදු වෙන්නේ බස්නාහිර පළාතේ. ගරු සභාපතිතුමනි, මම මෙහිදී බොහොම වැදගත් කාරණයක් කියනවා. ඒ තමයි මේ රජය මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම සඳහා ඉතාමත් විධිමත් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඉතාම සාධනීය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ සඳහා රාජ්‍ය සම්පත් විශාල වශයෙන් යොදවලා තිබෙනවා. එවැනි තත්ත්වයක් හමුවේ මේ පවතින තත්ත්වය පිළිබඳව මහජන නියෝජිතයින් වශයෙන් අපි සතුටු විය යුතුයි. නමුත් මම මන්ත්‍රීතුමාගේ යෝජනාවේ එක යහපත් කාරණාවක් දකිනවා ගරු සභාපතිතුමනි. මහජන නියෝජිතයින් විධියට අපි හැම කෙනෙක්ම මේකට එකතු වෙලා මේ කාරණාව පිළිබඳව ධනාත්මකව කටයුතු කළ යුතුයි කියන එක. ඒ කාරණාවත් සමගින් මට කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී යසපාල කෝරලගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[ පූ.භා. 11.40 ]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක හර්ෂණ රාජකරුණා මැතිතුමා විසින් රටට වැදගත්, ඒ වාගේම අපේ ජන ජීවිතයට වැදගත් යෝජනාවක් විධියට මේ යෝජනාව ගෙන ආවා කියන කාරණාවත්, මේ යෝජනාවේ පුළුල් අපේක්ෂාවක්, බලාපොරොත්තුවක් ඇතැයි කියන කාරණාවත් මම විශ්වාස කරනවා. මොකද, අපි කවුරුත් රටට ආදරය කරන අය විධියට, රටේ ජනතාව නිරෝගීව ජීවත් වෙන්න ඕනෑ කියලා විශ්වාස කරනවා. ඒ වාගේම හොඳින් ප්‍රීතියෙන් ජීවත් වෙන්න ඕනෑය කියලා

අපි විශ්වාස කරනවා. එහෙම ජීවත් වෙන්න නම්, මිනිස්සු එක් පැත්තකින් යම් ආර්ථික ශක්තියක් මත ජීවත් වෙන්න ඕනෑ. අනෙක් අතට නිරෝගීව ජීවත් වෙන්න ඕනෑ. නිරෝගීව ජීවත් වෙන්නත්, ආර්ථික ශක්තිය යම් ප්‍රමාණයකට තියාගන්නත් බැරි හේතුවක් විධියට මේ ජනතාව මත්පැන්, මත්ද්‍රව්‍යාවලට පෙළඹීම අපි දකිනවා. විශේෂයෙන් අඩු ආදායම් ලබන ජනතාව අතර වැඩිම දරිද්‍රතාවයකට හේතුව වෙලා තිබෙන්නේ, ඔවුන්ගේ පවුල්වල හම්බ කරන මුදලෙන් සෑහෙන ප්‍රමාණයක් මත්පැන්, මත්ද්‍රව්‍යාවලට යොදන්න සිද්ධ වීමයි. ඒ වාගේම මත්පැන්, මත්ද්‍රව්‍යාවලට යෙදවීම තුළ අනෙක් අතට ඔවුන් රෝගී භාවයන්ට පත් වෙලා අවසානයේ රටට බරක් වෙනවා. රටේ ජාතික අරමුදලින්, ජාතික අයවැයෙන්, රෝහල් නඩත්තු කරන්න, රෝගී තත්ත්වයට පත් වන අය නඩත්තු කිරීම සඳහා අතිවිශාල මුදල් කන්දරාවක් වියදම් කරන්න සිද්ධ වෙනවා.

ඒ නිසා මේ යෝජනාව අපි පක්ෂ පාට භේදයෙන් තොරව පුළුල් අර්ථයෙන්, හිතුවොත් මම හිතන්නේ ඉතාමත් වැදගත් යෝජනාවක්. රටේ ජනතාව මතින් තොර අනාගතයකට ගෙනිහිල්ලා, නිරෝගී පිරිසක් කරන්න වාගේම විශේෂයෙන් අඩු ආදායම් ලබන ජනතාවට ආර්ථික ශක්තීන් ඇතුව ජීවත් වෙන්න අවශ්‍ය වටපිටාව සකස් කිරීම සිදු කෙරෙනවා. නමුත් අපි මේ යෝජනාව තුළ, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂය විධියට විරුද්ධ නොවෙන්නේ, මේ යෝජනාවේ සැබෑ අරුතක් තිබෙන නිසා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව තුළ අපි ආසියාවේ මත්ද්‍රව්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙලා ඒ තුළ ආණ්ඩුවේ, රජයේ වගකීම බරපතළ විධියට ඇති වෙලා කියන කාරණාව පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, රටක් විධියට ගත්තාම අපි විවිධ මට්ටමින් අද ආසියාවේ කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙලා. ඒ තුළ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන අයත් යම් ප්‍රමාණයකට මේ වාසිය ගනිමින් තිබෙනවා. නමුත් මෙහි වගකීම රජයට සම්පූර්ණයෙන් ගන්න පුළුවන්කමක් නැහැ. කවුරුත් දන්නවා, අපි උඩ බලාගෙන කෙල ගහගන්න ඕනෑ නැහැ. මේ කොයි ආණ්ඩු කාලයේත් මත්පැන්, මත්ද්‍රව්‍ය යම් ප්‍රමාණයකට ව්‍යාප්ත වුණු අවස්ථා තිබුණා. විශේෂයෙන්ම අපි කවුරුත් තර්කයක් නැතුව පිළිගන්නවා. විවෘත ආර්ථිකය මේ රටේ ස්ථාපිත වීමත් එක්ක ජාත්‍යන්තර වශයෙන් තිබුණු මත්පැන් මත්ද්‍රව්‍යාවල සම්බන්ධතාවය, බැඳීම වැඩි වෙලා මේ රටට ආවා කියන කාරණාව අපි කවුරුත් පිළිගන්නවා. ඒ තුළ මේ රටේ විවිධ දූෂිත ගණුදෙනු, විවිධ දූෂිත ව්‍යාපාර ඇති වුණා වාගේම ජනතාව කුඩුවලට ඇබ්බැහි වෙන්නත්, වෙනත් විශාල හානිකර මත්පැන්, මත්ද්‍රව්‍යාවලට ඇබ්බැහි වෙන්නත් හේතු වුණා. ඒක එදා මොන රජය යටතේ කළත් යම් වැරැද්දක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම අද එහි වගකීමෙන් මේ රජය විධියට අපට සම්පූර්ණයෙන් මිදෙන්න බැහැ. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ වෙලාවේ මත්පැන්, මත්ද්‍රව්‍ය පාලනයක් කරන්න, මේ රටෙන් තුරන් කරන්න රජය විධියට අපට වගකීමක් තිබෙනවා කියලා. ඒ වගකීම තිබෙන නිසාම තමයි අතිගරු ජනාධිපතිතුමා මහින්ද චින්තන වැඩ පිළිවෙළ තුළත් විශාල ප්‍රමුඛතාවයක් ලබා දීලා මතට තිත වැඩ සටහන ක්‍රියාත්මක කරන්න කටයුතු කළේ.

ඔබතුමන්ලා දන්නවා, පසුගිය කාල පරිච්ඡේදය තුළ මේ රටේ බස් රථයක ගියත්, පොදු ස්ථානයකට ගියත් සිගරට් බොමින් ජනතාවට හානි කරන තත්ත්වයට යම් පිරිස් කටයුතු කළා. නමුත් මේ රජය තුළ අතිගරු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ තුළ ඒ ප්‍රතිපත්තිය තුළ පොදු ස්ථානවල, බස් රථවල සිගරට් බීලා ඒ සිගරට් දුම තවත් කෙනෙකුට ආග්‍රහණය වෙන්න තිබෙන ඉඩකඩ නැති කරන්න නීති ගෙනැල්ලා ඒ තත්ත්වය ඇති කළා. ඒ වාගේම 2006 වර්ෂය වනකොට දුම්කොළ සහ මධ්‍යසාර පනත සම්මත කරලා, මත්පැන්, මත්ද්‍රව්‍යාවලට තිබෙන ඉඩ යම් ප්‍රමාණයකට සීමා කළා විතරක් නොවෙයි, ඔබට මතක ඇති පසුගිය වකවානුව වනකොට රූපමය අවවාද සිගරට් පැකට් තුළට ඇතුල් කරලා ඒ තුළ දුම් බිව්වොත්, සිගරට් බිව්වොත් මෙවැනි හානිකර තත්ත්වයක් ඇති කරනවා. මේ විධියට පිළිකා ඇති වෙලා ජීවිතේ විනාශ වන තත්ත්වයට, රෝගී තත්ත්වයට පත් වෙනවා කියන කාරණා දැනුවත් කරන්න මේ රජය කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මේ රජය, ජනාධිපතිතුමාගේ පැත්තෙන් මේ වගකීම් නීත්‍යානුකූලව කටයුතු කරන්න මැදිහත් වුණා විතරක් නොවෙයි, පසුගිය කාලයේ ජනාධිපතිතුමාගේ මැදිහත්වීමෙන් විවිධ කමිටු ඇති කරලා ඒ කමිටු හරහාත් මත්පැන්, මත්ද්‍රව්‍ය මේ රට තුළ ව්‍යාප්ත වීම අඩු කරන්න උත්සාහයන් දැරුවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාල පරිච්ඡේදය තුළ අපි නිරන්තරයෙන් කියන්නේ රට මත්පැන්, මත්ද්‍රව්‍යාවලට කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙලා කියන්නේ, අපි රට තුළ වැඩි ප්‍රමාණයක් මෙවා අල්ලන්න

[ගරු ජගත් කුමාර ]

පටන් ගත්තු නිසා. නමුත් මේවා ඇල්ලුවේ එක්සත් ජාතික පක්ෂයෙන්වත්, මාධ්‍යවලින්වත් නොවෙයි. මේවා ඇල්ලුවේ රජය. රජයේ නායකත්වය සෘජුව ලබා දීපු නිසා. අපි එදා අවුරුදු තිහක් යුද්ධ කළා. ඒ යුද්ධයට විවිධ නායකයෝ, විවිධ රජයන් නායකත්වය දුන්නා. විවිධ හමුදාපතිවරු නායකත්වය දුන්නා. නමුත් ඒ යුද්ධය අවසන් වුණේ නැහැ. නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තමයි නිදහස් රටක, මර බියෙන් තොරව, බෝම්බ බියෙන් තොරව, ජීවිත අවධානමෙන් තොරව, ලේ ගංගා මිනී කඳු නැති නිදහස් රටක් හදන්න නායකත්වය දුන්නේ. ප්‍රමුඛත්වය දුන්නේ. ඒ වාගේම තමයි අද එතුමාගේ මැදිහත් වීමෙන් රටට එන මත්පැන්, මත්ද්‍රව්‍ය නීත්‍යානුකූල නොවන සියල්ල අල්ලන්න පුළුවන් වෙලා තිබෙනවා. එහිදී රජයේ වගකීම යම් ප්‍රමාණයකට ඉෂ්ට සිද්ධ වනකොට මහජන නියෝජිතයෝ විධියට අපට විශාල කාර්ය භාරයක් තිබෙනවා. මොකද, ගොඩක් වෙලාවට අපි අපේ මැතිවරණ කාල පරිච්ඡේදයන්වල සුලභ දෙයක් විධියට යොදා ගන්නේ මත්පැන්, මත්ද්‍රව්‍ය. ඒ නිසා සමහර විට අපට ජනතාව ආකර්ශණය කර ගන්න, අපට ජනතාවගේ ඡන්දය ගන්න, කැන්වසින් යන්න මේවා යොදා ගන්නවා. මම විශ්වාස කරනවා හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මේ යෝජනාව ගෙන එන්න ඇත්තේ එතුමා එවැනි කාර්යයන්වල නිරත නොවන කෙනෙක් විධියට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඊයේ පෙරේදා පෙර පාසලක උත්සවයකට ගියාම මම දුටු පුංචි දරුවෝ දෙන්නෙකුගේ රංගනයක් මතක් වුණා. මාමයි, බෑනයි සින්දුව රඟපාමින් දරුවෝ දෙන්නෙක් කියනවා

"*අපේ පැත්තේ මහ කකුළුවෝ පොඩි එවුන්ට කෙළින් යන්න කියලා දෙනවා*" කිව්වාම අනෙක් පොඩි එකා ඇහුවා, ආ ... ඇත්තද? ඒ කියන්නේ පොඩි එවුන් කෙළින් යනවා කියලාද? නැහැ. මොන පිස්සුද? දෙගොල්ලෝම යන්නේ හරහාට කියලා කිව්වා.

ඒ වාගේ මට මතක් වෙන්නේ අපි කොපමණ යෝජනා ගෙනාවත් වැඩක් නැහැ. නමුත් රටට නායකත්වය දෙන, ජනතාවට නායකත්වය දෙන මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු විධියට අපි පටන් ගත්තොත්, සමහර වෙලාවට අපි අතර එවැනි වගකීමක් ඇති වෙනවා නම් මේක ක්‍රමානුකූලව ගමට, බිම් මට්ටමට ඇති වෙන්න පුළුවන්කම තිබෙනවා. නමුත් අපිත් මෙවැනි යෝජනා ගොඩක් වෙලාවට ගෙනැල්ලා, සාකච්ඡා කරලා, ඊට පස්සේ අපේ කාර්ය භාරයන් කරනකොට අපිත් මේවාවලට වැඩි ඉඩක් දෙනවා. අපි පාසලේ දරුවා ගැන කථා කරනවා. ඇත්ත. හැබැයි, අපි තාත්තාව කැන්වසින් එකට ගන්නේ අරක්කු ටිකක් දීලා. සිගරට් දීලා. මත්පැන්වලින් හොඳට හෙම්බත් කරලා. එහෙම නැත්නම් අපි දරුවන්ගේ පාසල්වලට ගෙන්වා ගන්නේ මත්පැන් විකුණන, මත්ද්‍රව්‍යවල නිරත වන ව්‍යාපාරිකයන් හා සමාන මහජන නියෝජිතයන්. පාර්ලිමේන්තුවේ වුණත්, පළාත් සභාවේ වුණත් පක්ෂ විපක්ෂ එවැනි අය ඉන්නවා නම්, එවැනි අය තුළින් යම්කිසි හැදියාවක් ආවොත් වෙනසක් වුණොත් තමයි අපි හිතන්නේ, මේ කියන යෝජනාව වඩාත් සාර්ථක කරන්න පුළුවන් කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා මහජන නියෝජිතයාගේ වගකීම හරියට ඉෂ්ට සිද්ධ කරනවා නම් අපි තනි තනිව අපේ වගකීම ඉෂ්ට සිද්ධ කළොත් රටක් විධියට පාර්ලිමේන්තුවේ ඒ කටයුත්ත ඉෂ්ට කරනවා නම් අපට එතැනින් එහාට යන්න පුළුවන්. ඒ වාගේම මේ වෙලාවේ මම මතක් කරනවා. පාර්ලිමේන්තුව තමයි රටේ නීති සම්පාදනය කරන්නේ. නීති සම්පාදනය කරන ආයතනය තුළ කොයිම අවස්ථාවකවත් මත්ද්‍රව්‍යවලට, මත්පැන්වලට විරෝධය දක්වලා එක්සත් ජාතික පක්ෂයෙන් යෝජනාවක් ගෙනාවේ නැහැ එහෙම ගේනවා මම දැක්කේ නැහැ. අපි හිතන්නේ එහෙම යෝජනාවක් ගෙන එන්න. රජයට ඒ සම්බන්ධව අවස්ථාව -

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගෙනාවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා කියනවා නම් මම පිළිගන්නම්. එහෙම ගෙනැල්ලා රජයත් එක්ක එකඟතාවයක් හදාගෙන මේ රටෙන් සහමුලින්ම මත්පැන්, මත්ද්‍රව්‍ය තුරන් වෙනවා නම්, මගේ පෞද්ගලික මතය අත් දෙකම උස්සලා එවැනි යෝජනාවකට අපේ සහාය, ශක්තිය දෙනවා. මොකද, රටේ යුද්ධය හා සමානවම ඊළඟට අපි ජයග්‍රහණය කරන්න ඕනෑ රටේ තිබෙන දිළිඳුකම අඩු කරන්න. හැබැයි, දිළිඳුකම අඩු කරන්න කියලා දුප්පත් පවුල්වල තමයි මේ මත්පැන්, කුඩු

හෝ මොනවා හරි බීලා හිහන්නෝ බවට පත් වෙලා, නන්නත්තාර වෙලා අභිංසක පවුල් ජීවිත විනාශ වෙන්නේ. දරු පැටව් මහ පාරට වැටෙන්නේ, තාත්තලා මෙවැනි තැනට පත් වීමෙන්. ඒ තැනට වැටෙන්නේ සමාජයේ ඉහළ ඉන්න බොහෝ අයගේ වගකීම හරියට ඉෂ්ට වෙන්නේ නැති නිසා. ඒ නිසා ඒක රජයකට විතරක් සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ නිසා අපි හැමෝගෙම වගකීමක් විධියට කියනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාවට ආණ්ඩු පක්ෂය පැත්තෙන් අපේ එකඟතාවය තිබෙනවා. නමුත් මේ යෝජනාවේ හතර වැනි ඡේදයේ මුල් වගන්තිය මේ විධියට සංශෝධනය කරන්න කියලා මම ගරු විපක්ෂයේ සංවිධායකතුමාගෙන් ඉල්ලනවා. මෙම සියලු තත්ත්වයන්ට රජය වගකිව යුතුයි කියලා යෝජනාවේ තියෙනවා. මම ඉල්ලීමක් කරනවා "*මෙම සියලු තත්ත්වයන්ට රජය වගකිව යුතුයි*"යන්න වෙනුවට "*මෙම සියලු තත්ත්වයන්ට රජය මැදිහත්ව උදාසීන භාවයෙන් මිදී මෙම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කළ යුතුයි*" කියන කොටස එකතු කරලා අපි සියලු දෙනාගේ එකඟත්වයෙන් මේ සම්බන්ධව රජය දැනුවත් කරමුයි කියලා ප්‍රකාශ කරනවා. මේ සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[ පූ.භා. 11.51 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, (බාධා කිරීම්) සද්ධ නොකර හිටියා. මම හිතනවා, මේ අයට මගේ කථාවටත් ඉඩ දෙන්න පුළුවන් වෙයි කියලා. මේ අවස්ථාවේදී අපේ හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ යෝජනාව ඉතාමත් කාලීන යෝජනාවක්. අද මේ පළාත් සභාවට මෙම යෝජනාව ඉදිරිපත් කර සාකච්ඡාවට ඉඩ ලබා දීම සම්බන්ධවත් ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාටම අපි ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මට පෙර කථා කරපු සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාගේ කථාව ඇහුවාම මට තේරුම් ගන්න බැරුව ගියා එතුමා නියෝජනය කරන්නේ බස්නාහිර පළාත් සභාවද, එහෙම නැත්නම් වෙන මොකක් හරි ජාත්‍යන්තර - අර ඇමරිකාවේ තිබෙනවා නාකොටි බියුරෝ එකක්. ඒකේ උපදේශකවරයෙක් හැටියට ඇවිල්ලා මෙතැන දේශනයක් දුන්නාවත්ද කියලා මට පොඩි සැකයක් තිබෙනවා. ඒක ලියලා දුන්නේ කවුද කියන එකත් මට තේරුම් ගන්න බැහැ. කෙසේ වෙතත් මේ කථාවල් දෙකෙන්ම ප්‍රධාන වශයෙන් කියැවුණේ එක්සත් ජාතික පක්ෂය තමයි මේකට වග කියන්න ඕනෑ කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ සභාවේ අවධානයට යොමු කරන්න කැමැතියි 2005 මහින්ද චින්තන පොතේ තිබෙනවා,

"*නීතිය, පොලීසිය සහ සමාජ ආයතන සම්බන්ධීකරණය කරමින් ශ්‍රී ලංකාවේ මත්කුඩු උවදුර වසර තුනක් තුළදී සහමුලින් පිටුදැකීම සඳහා අධිෂ්ඨානශීලීව කැප වෙමි*" කියලා.

දැන් මෙදා ඉඳලා සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එක කොටසකට මම එකඟ වෙනවා. ඒ කොටසේ කිව්වේ මේ මත්කුඩු ජාවාරමත් එක්ක ත්‍රස්තවාදී සංවිධාන සම්බන්ධයක් තිබෙනවා කියලා. ඒකට මම සියයට සියයක්ම එකඟ වෙනවා. 2005 ඉඳලා මේ රජය, රාජපක්ෂ ආණ්ඩුව කරගෙන යන්නේ. 2009 කොටි ත්‍රස්තවාදය අවසන් කිරීමත් සමගම මේ රට තුළත්, ආසියානු කලාපය තුළම කුඩු ජාවාරමේ යෙදුණා කියලා සැක කරන ඉන්දියාවත්, ඒ වාගේම පකිස්ථානයේ බුද්ධි අංශත් ඒ ආශ්‍රිත කලාපයේ සියලුම බුද්ධි අංශ ප්‍රකාශ කර සිටින්නේ L.T.T.E සංවිධානය තමන්ගේ මූල්‍යමය අවශ්‍යතා ඉටු කර ගන්න මේ කුඩු ජාවාරමේ යෙදුණා කියන එක. ඉතින් අපේ සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයත් සමග ඒ ටිකට මම එකඟ වෙනවා. දැන් 2009 ඉඳලා පටන් ගත්තොත් L.T.T.E සංවිධානයේ මූල්‍යමය කළමනාකරණය කළේ කවුද? කුමරන් පද්මනාදන් කියන, අපි කවුරුත් දන්න කේ.පී. කියන පුද්ගලයා. මෙයා තමයි සියලුම අවශ්‍ය මුදල් මේ L.T.T.E සංවිධානයට සැපයුවේ. මේ මුදල් සැපයුවේ කොහොමද? මත්ද්‍රව්‍ය, කුඩු ජාවාරමේ කෙනෙක් හැටියට අද ඉන්දියාවේ බුද්ධි අංශයෙන්, පකිස්ථානයේ බුද්ධි අංශයෙන් ඉල්ලා සිටිද්දී අද වනකොටත් මේ රාජපක්ෂ ආණ්ඩුව මේ කේ.පී. කියන කුඩු ගෝඩ් ෆාදර්ව ආරක්ෂා කරගෙන ඉන්නවා. දැන් කේ.පී. අත්අඩංගුවට ගත්තා කිව්වා. මේ රටට බලහත්කාරයෙන් මැලේසියාවේ ඉඳලා අල්ලගෙන ආවා. අද වෙනකනුත් කවුරුත් දන්නේ නැහැ, කේ.පී. කොහේද ඉන්නේ කියලා. කේ.පී. ගේ කුඩු ජාවාරම තවමත් සිදු වෙනවා කියලා විශ්වාස කරනවා. එහෙම මේ ආණ්ඩුවේ වගකීමක් තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මත්ද්‍රව්‍ය බෙදා හරින කේන්ද්‍රස්ථානය

[ගරු ශ්‍රීනාත් පෙරේරා ]

බවට ලංකාව පත් වෙලා තිබෙන්නේ මෙතුමාත් රජයට සම්බන්ධ වෙලා, රජයේ අනුග්‍රහය ඇතුව මේ කුඩු ව්‍යාපාරය ලංකාව කේන්ද්‍රස්ථානයක් කරගෙන ලෝකය පුරා බෙදා හරිනවා කියන එක -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

බොරු කියන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රාජ්‍ය අනුග්‍රහය ඇතුව.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එකමුතුකමට තියෙන ගොන් කථාවක් කිව්වා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔහොම සහයෝගයක් ගන්න පුළුවන්ද මන්ත්‍රීතුමා? ගොන් කථා කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රාජ්‍ය අනුග්‍රහය ඇතිව කියන්නේ හේතුවක් නිසා. තමුන්නාන්සේලා කවුරුත් දන්නවා අද පුවත්පත්වල ඕනෑ තරම් ලිපි පළ වෙලා තිබෙනවා. වෙබ් අඩවියකත් තිබෙනවා. මේ Sunday Times. මේකේ සම්පූර්ණයෙන් කියලා තිබෙන්නේ, VVIP ඒ කියන්නේ, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ VVIP Lane එක හරහා නිල ඇඳුම් නැති ආරක්ෂක පුද්ගලයන් මාර්ගයෙන් කිලෝ 30 ක් ගෙනැල්ලා තිබෙනවා. Ecstacy කියන ටැබ්ලට් කිලෝ 30 ක් ගෙනැල්ලා මේ රට පුරා බෙදා හරිනවා. අද හෙරොයින් පමණක් නොවෙයි.

[සභාවේ ඝෝෂා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ 2005 - 2009 ඉඳලා ඇති වෙලා තිබෙන මේ මත්ද්‍රව්‍ය ජාවාරමට දේශපාලනයත් සම්බන්ධයි කියන එක ඉතා පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා. අපි නොවෙයි. තමන්ගේ ආණ්ඩුවේම අග්‍රාමාත්‍යවරයා කියලා තිබෙනවා. විමල් වීරවංශ ඇමැතිතුමා කියලා තිබෙනවා. අපේ හෙළ උරුමයේ ස්වාමීන් වහන්සේ කියලා තිබෙනවා. පාඨලී චම්පික ඇමැතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා. බොදුබල සේනාවේ ඥාණසාර හාමුදුරුවෝ ප්‍රකාශ කරලා තිබෙනවා. ඉතින් මේවා අපි නොවෙයි කියන්නේ. මීගමුවේ නියෝජ්‍ය ඇමැතිවරයා කියනවා මීගමුව හරහා - මීගමුව ප්‍රදේශයේ ගෝඩ් ෆාදර් කෙනෙක් ඉන්නවා කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද ඒ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් මේවා කියන්නේ, එක්සත් ජාතික පක්ෂයේ අය නොවෙයි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද? කවුද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේවා කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ අය නොවෙයි. දැන් සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා කිව්වා විශේෂ කාර්ය බලකාය සම්බන්ධ වෙලා මේවා වටලනවා කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

හෙලිකොප්ටර් එකෙන් බැහැලා ගිහිල්ලා, ඉඹගෙන අරන් ගියේ.

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

ඒ බොරු හින්දා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොරු හරි, වැරදි හරි පරීක්ෂණයක් තියෙන්න එපැයි. මොනවා හරි පරීක්ෂණයක් තියෙන්න එපැයි. එහෙම

පරීක්ෂණයක් වුණාද? මම අහනවා මොන රටේද ජනාධිපතිවරයෙක් ගිහිල්ලා තිබෙන්නේ කුඩු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව බොහොම සද්භාවයෙන් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඉතාමත් සද්භාවයෙන් මේවා ප්‍රකාශ කරන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හර්ෂණ රාජකරුණා සංවිධායකතුමා ගෙනාවේ. ඒ නිසා ඔබතුමා මේක වෙනත් පැත්තකට හරවලා ජනාධිපතිතුමාගේ නම කියලා - ඒවා ආරක්ෂා වන ආකාරයෙන් මේ යෝජනාව ගැන කථා කරන්න කියලා මම මේ අවස්ථාවේ කියනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජනාධිපතිතුමා -

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඔය මැක්කා කොහේ ගියත් හැමදාම එක තැනකට එන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉතාමත් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ කාලය ලබා දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉතාමත් සතුටු වුණා, හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව. ඉතින් මේ යෝජනාව හරහා එකිනෙකාට පරිභව කරන්න, මඩ ගහන්න ඕනෑ කාරණාවක් නොවෙයි. විශේෂයෙන් රීති ප්‍රකාරව 64 වැනි වගන්තියේ තිබෙනවා මේ විධියට මඩ ගහන්න, අනවශ්‍ය දේවල් ප්‍රකාශ කරන්න බැහැ. මත්ද්‍රව්‍ය සම්බන්ධව තිබෙන ගැටළුවේ අත්දැකීම් අපි කවුරුත් විඳිමින් ඉන්නේ. හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ගෙනාපු යෝජනාව, අපි සන්තෝෂයෙන් විවාද කරන්නේ. ඒ නිසා එකිනෙකාට මඩ ගහන්න, පරණ දේවල් කියමින් ජනාධිපතිතුමාට මඩ ගහන්න එහෙම නැත්නම් ඇමැතිතුමෙකුට මඩ ගහන්න මේක පාවිච්චි කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මොකක්ද කථා කරන රීතිය?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණු පෙන්වා දීමක් කරන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම කථා කරන්නේ 36 (1) රීතිය යටතේ. සියලුම මන්ත්‍රීවරුන්ට බලපාන රීතියක් කඩ කරලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ කථා කරන්නේ සභා කටයුතු ඇමැතිතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභා කටයුතු ඇමැතිතුමාට අවස්ථාව ලබා දීමේ අයිතිය සභාවට තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඔබතුමාගෙන් අහනවා, අපේ ඇමැතිතුමා කියන විධියට ජනාධිපතිතුමා ඒ ස්ථානයට ගියේ නැද්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රශ්නවලට උත්තර දෙන කථා නොවෙයි.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිසිම වැරැදි ප්‍රකාශයක් කළේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එකිනෙකාට මඩ ගහන්න පාවිච්චි කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිසිම කෙනෙකුට මඩ ගැහුවේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමැතිතුමා කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කිසි කෙනෙකුට මඩ ගැහුවේ නැහැ. තමුන්නාන්සේලා සියලු දෙනාම සියලුම රූපවාහිනී නාලිකාවලින් දැක්කා. රූපවාහිනී නාලිකාවලින් දැක්ක දෙයක් තමයි මම කිව්වේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමැතිතුමාට පස්සේ අවස්ථාව දෙන්නම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය කියන්නේ පරණ දේවල්. ඒවත් කියන්න බැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු ඇමැතිතුමාට පස්සේ අවස්ථාව දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මත්ද්‍රව්‍ය ගැන එතුමන්ලා කථා කරනවා. අපට සන්තෝෂයි. මත්ද්‍රව්‍යවලට අපි ඔක්කෝම විරුද්ධයි. හැබැයි අපේ සභාවේ කටයුතු පවත්වාගෙන යා යුත්තේ සභාව සම්මත කර ගත්තු රීතිවලට අනුකූලවයි. 64 (1) රීතිය යටතේ ජනාධිපතිවරයා හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙක් ගැන සඳහන් කරමින් කථා කරන්න බැහැ. පළාත් සභා මන්ත්‍රීවරයෙක් සම්බන්ධයෙන් ගෙන එනවා නම් විශේෂයෙන් ඔහු සම්බන්ධ යෝජනාවකදී විතරයි ඔහු ගැන කථා කරන්න පුළුවන්. මේ 64 (1) රීතියට -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ, නැහැ. මම ගරු ඇමැතිතුමා -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

අනුව විවාද කරමු. මේ විවාදයට අපි එකඟයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ප්‍රකාශ කළේ, වුණු සිද්ධියක් ගැන.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

එහෙම කථා කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇයි බැරි? කවුද කියන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා වෙනත් පැත්තකට හරවන්න හැදුවා. ඒක නිසා ඒ අවස්ථාවේදී -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ, නැහැ. හරවන්න හැදුවාට හැරෙව්වේ නැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභා රීතිවල තිබෙනවා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැරෙව්වේ නැහැ නේ? හරවන්න හැදුවා විතර නේ? පොඩ්ඩක් ඉඩ දෙන්න කෝ හරවන්න. හරවලා පෙන්වන්නම්.

**ගරු නිමල් ලාන්සා** (ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථා කරලා අවසන් කරන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමැතිතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

එතුමාට වාඩි වෙන්න කියන්න. කාලය ඉවරයි නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තව විනාඩියක් තියෙනවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්නේ. තමුන්නාන්සේ ඉඳගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ආ ... කියන්න ඇමැතිතුමා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

කියන්න තමයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සභා රීතිවල 64 (1) යටතේ තිබෙනවා පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ හෝ හැසිරීම සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡා කිරීම තහනම් කියන එක. මෙතුමා නම සඳහන් කරනවා විතරක් නොවෙයි, අභූත චෝදනාවක් කරනවා ජනාධිපතිතුමා STF එකෙන් ඇවිල්ලා ඒක නැවැත්තුවා කියන එක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. එහෙම කිව්වේ නැහැ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා කිව්වා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ, නැහැ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා කිව්වා. ගරු මන්ත්‍රීතුමා කාට හරි ඇඟිල්ල දික් කරද්දී ඉතාමත් සාධාරණව, නීත්‍යානුකූලව ඇඟිල්ල දික් කරනවා නම් හොඳයි. මොකද, මට වුණු අසාධාරණය පිළිබඳව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් ඒක තමයි මම කිව්වේ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

පොඩ්ඩක් ඉන්න ගරු මන්ත්‍රීතුමා. මට වුණු අසාධාරණය පිළිබඳව ඊළඟ දවසේ සියලුම මාධ්‍යවල පළ වුණා. පොලිස්පතිතුමාගේ මාධ්‍ය ප්‍රකාශක පැහැදිලිව සඳහන් කළා තොරතුරක් අනුව බව් වාහන චෙක් කරන්න මගේ ගෙදරට ආවා. මගේ හිතවත් අයගේ ගෙවල් නවයක් චෙක් කරලා. මගේ විතරක් නොවෙයි. මීගමුවේ ඉන්න ප්‍රධාන පෙළේ ප්‍රභූවරුන්ගේ ගෙවල් නවයක් චෙක් කරලා, එක වාහනයක්වත් හම්බ වුණේ නැහැ. ඒක නිසා නිමල් ලාන්සා ඇමැතිතුමාට වෙනත් කිසිදු චෝදනාවක් නැහැ. තොරතුරක් මත ආවා කියන එක. ඊට පස්සේ දවසක් පහු වෙලා අතිගරු ජනාධිපතිතුමා ගෙදරට ආවා. ඒ මට වුණු අපහසුතාවය පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරන්න තමයි ආවේ. එතකොට තමුන්නාන්සේ දන්නවා මම මේ රටේ ඇමැතිවරයෙක් වෙලත් නිකම් තොරතුරකට මගේ ගේ 180 ක් - ඒ කියන්නේ මේ රටේ සියයට සියයක් නීතිය ක්‍රියාත්මක වෙනවා. තමුන්නාන්සේලාගේ කාලයේ වාගේ නොවෙයි.

[සභාවේ ඝෝෂා]

මගේ 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නය -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මෙතුමාට චෝදනා කළේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා තමුන්නාන්සේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට කාලය දෙන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම වුණු සිදුවීමක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට කාලය දෙන්නම්. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ගරු ඇමැතිතුමාගේ නම ප්‍රකාශ කරපු නිසා තමයි ඇමැතිතුමා පිළිතුරු දුන්නේ. ඔබතුමා ඒ ආකාරයට සාකච්ඡාව හරවන්නේ නැතුව ඔබතුමා කථා කරන්න. තව විනාඩි 02 ක කාලයක් ලබා දෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊට වැඩිය මගේ කාලය ඉතුරු වෙන්න ඕනෑ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, එතුමා එහෙම ප්‍රකාශ කළේ නැහැ කියලා. අපි එතුමාගේ ඒ වචනයට ගරු කරනවා. එහෙම ප්‍රකාශයක් තියෙනවා නම් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම වුණු සිද්ධිය කිව්වේ. එහෙම සිද්ධියක් වුණේ නැත්නම් ඔබතුමා කියන්න වුණේ නැහැ කියලා. වෙච්ච සිද්ධියක් කියන්න බැරි කමක් නැහැ නේ ඇමැතිතුමා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නම් කියන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මට වැඩිය රීති දන්නවා නේ? ඔබතුමා නීතිඥයෙක් නේ? ඔබතුමාට ඕනෑ ඕනෑ විධියට හරවන්නත් ඔබතුමා දන්නවා කියලා මම දන්නවා. ඔබතුමා රූපවාහිනයේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා රූපවාහිනීයේ කිව්වා හරීන් ප්‍රනාන්දු 50,000 කට වැඩිය ගත්තොත් මම ඉල්ලා අස් වෙනවා කියලා. දැන් ඔබතුමා කියනවා පෝස්ටර් ගැහුවේ නැත්නම් කියලා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

එහෙම කිව්වේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් ඔබතුමාගේ නීතිය අර මේ රටේ රාජපක්ෂ නීතිය වගේ තමයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕනෑ, ඕනෑ විධියට හරව ගන්න නීතියක් මෙතුමාට තියෙන්නේ. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ එක සිද්ධියක් මම කිව්වේ. එදා කොට්කාවත්තේ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මැතිතුමාගේ සිද්ධිය -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඊට පස්සේ මොකක්ද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ආ ... කියන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

වරප්‍රසාද ප්‍රශ්නයක්. 64 (2) වගන්තිය යටතේම මම ගැන කරපු සඳහන හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකක්ද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

64 (2) වගන්තිය යටතේ මා පිළිබඳව එතුමා කරපු ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා රූපවාහිනීයේ නේ ප්‍රකාශය කළේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔබතුමා ඉස්සෙල්ලාම රීති පොත කියවලා එන්න. රීති පොත කියවන්න. ඔබතුමා මේ දෙවැනි වතාවේ සභාවට පත් වෙලා ඉන්නේ. ඔබතුමාව පත් කරපු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔය රීති පොතේ තිබෙනවා, නමක් සඳහන් කරන්න බැහැ කියලා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

රීතියක් කියවන්න බැරි කෙනෙක්ව පත් කරපු ඡන්ද දායකයන්ට ඔය අපහාස කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

50,000 ට වැඩිය ගත්තොත් ඉල්ලා අස් වෙනවා කිව්වේ නැද්ද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

කිව්වේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කිව්වේ නැද්ද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔබතුමා තවම පුංචි බබෙක්. තාම රූපවාහිනී සංවාදයක් අහගෙන ඉඳලා තේරුම් ගන්න හැකියාවක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ කාලය ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තවත් කාලය දෙන්න බැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔළුව දෙන්න පුළුවන්. හැබැයි කරුණු තේරුම් ගන්න මොලය ලබා දෙන්න බැහැ. ඒ ගැන අපි කනගාටු වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ කියන්නේ මම නොවෙයි. මීගමුවේ ගෝඩ් ෆාදර් ගැන මේ කියන්නේ. මේ තියන්නේ. ඔන්න බලාගන්න. මේ මම කියන එක නොවෙයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ සරත් කුමාර ගුණරත්න කියන කථාවක්. මීගමුවේ ගෝඩ් ෆාදර්. දැන් ගෝඩ් ෆාදර්ලා ඉන්නේ කොහේද? කුඩු ජාවාරම් කරන තැනක ලොක්කාට තමයි ගෝඩ් ෆාදර් කියන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය පෞද්ගලික තරහවල්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මීගමුවේ කුඩු තිබෙනවා. ඒ කියන්නේ මීගමුවේ කුඩු තියෙනවා. මීගමුව අද ප්‍රධාන කුඩු බෙදා හරින මධ්‍යස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කල්පිටිය වෙරළෙන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බෝට්ටුවලින් තමයි අද කුඩු ගේන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔබතුමාගේ තාත්තා නේ මීගමුවට කුඩු ගෙනාවේ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක තමයි ඇත්ත කථාව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔබතුමාගේ තාත්තා ගෙනාපු කුඩු ගැනද කථා කරන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක සභාගත කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැමදාම ඔබතුමා (බාධා කිරීම්) එතුමන්ලාට බාධා කරන්න අවස්ථාව දීලා මගේ කාලය කපා හරිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථාවට බාධා ඇති කර ගත්තා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම විනාඩි 05 ක් කථා කළේ නැහැ. ඔබතුමා මගේ කථාව අතරේ නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාට කථා කරන්න දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විනාඩි 11 ක් ලබා දීලා තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සෞඛ්‍ය ඇමැතිතුමාට කථා කරන්න දුන්නා. මගේ කාලය -

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඕනෑම මාධ්‍යවේදියෙකුට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හොඳට අහගන්න -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

කුඩු පැටියා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතාමත් පැහැදිලිව බස්නාහිර පළාතේ කුඩු නිමල්ලා -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වගකීමෙන් කියන්නේ. ඔන්න අහගන්න. අපි හය වෙන්නේ නැහැ ඔය කෑගැහුවාට. අපි හය වෙන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂය කුඩු නෙවෙයි ගේන්නේ. කවුද කුඩු ගේන්නේ? කවුද කුඩු බෙදා හරින් නේ? තමුන්නාන්සේලාගේ ආණ්ඩුව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කුඩු බෙදා හරින් නේ නැද්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාවේ වැදගත් විධියට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාවේ වැදගත් විධියට නොවෙයි, රටේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් කථා කරන්නේ. ආණ්ඩුවේ ඉන්න ඇමැතිවරු, මන්ත්‍රීවරු ආරක්ෂා කරන්න නොවෙයි අපි කථා කරන්නේ. අපි කථා කරන්නේ රටේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන්. ඒ නිසා පොඩ්ඩක් අහගෙන ඉන්න.

[සභාවේ ඝෝෂා]

අහගෙන ඉන්න. අහගෙන ඉන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. ගාමිණී තිලකසිරි ගරු සභානායකතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් වෙන් වී තිබෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට වැඩිපුර විනාඩි 02 ක් දීලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා විනාඩි 12 ක් කථා කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විනාඩි 02 ක් දීලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අනෙක් කථිකයාව මම දැන් නම් කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා නම් කළාට එතුමා සභාවේ කියන එක ඔබතුමා අහගෙන ඉන්න එපැයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් මම නම් කළේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ වුණාට එතුමා කිව්වා නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කලින් කියන්න ඕනෑ. පස්සේ දෙන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඉවර කරන්නම්. කුඩු ආරක්ෂා කරන්න ඔබතුමා මගේ කාලය කැපීම සම්බන්ධව මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගාමිණී තිලකසිරි ගරු සභානායකතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 12.09 ]

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ රටේ -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

හෝමාගම කුඩු අඩුයි.

[සභාවේ ඝෝෂා]

හෝමාගම කුඩු නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ඉතාමත් වැදගත් යෝජනාවක් අපේ හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ගෙන ආවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැන් ආණ්ඩුවට කියන්න දෙයක් නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඔබතුමිය පොඩ්ඩක් නිශ්ශබ්දව හිටියොත් හොඳයි. කථා කරන්න දෙන්න කෝ? (බාධා කිරීමක්) මම ඉතාමත්ම ආඩම්බරයෙන් මේ මාතෘකාව ගැන කථා කරන්නේ. මොකද, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙකුගේ යුතුකමක් තමයි -

[සභාවේ ඝෝෂා]

කාලයෙන් විනාඩියක් විතර ගිහිල්ලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉතාමත් සතුටු වෙනවා හර්ෂණ රාජපකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඉතාමත් වැදගත් යෝජනාවක් ගෙනාවේ. ඇත්තෙන්ම මේ යෝජනාවට හිතට එකඟව කථා කළ යුතුයි. මම නම් සාමාන්‍යයෙන් එහෙමයි. හිතට එකඟව මම මේ ප්‍රශ්නයට කථා කරන්නේ. මම විපක්ෂයෙන් අත්පුඩි ගන්න කථා කළා නොවෙයි. ඒ මගේ හැටි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

සභානායකකමත් නැති වෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

වැරැද්දක් තිබුණා නම් මම ඒ වැරැද්ද ඕනෑම වෙලාවක ඕනෑම ඇමැතිවරයෙකුට ප්‍රකාශ කරනවා. ඒක මගේ හැටියක්. අද විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ගෙනාපු වැදගත් යෝජනාවට මම හිතන්නේ අපි කිසිම - අපේ ගරු මන්ත්‍රීතුමා පොඩි සංශෝධනයක් කළා. මේ යෝජනාව ගැන අපි සියලු දෙනාම කථා කරන්න ඕනෑ. අද රාත්‍රී 07.00 වනකොට තමුන්නාන්සේලා දන්නවා මේ සියලුම කථා ටික රූපවාහිනී මාධ්‍ය තුළ යනවා. ඒ චැනල්වලින් කාගේ එක හරි යයි. කාගේ එක ගියත් බස්නාහිර පළාත් සභාවක් මේ රටේ තිබෙනවා කියන එක ඒ මාධ්‍ය විතරක් මුළු රටටම හෙළි කරලා තිබෙනවා. අපට වෙනත් මාධ්‍ය නැහැ නේ? වෙන කිසිම මාධ්‍යයක් නැහැ. ඒ දෙතුන් දෙනාගේ කථා දුන්නත් බස්නාහිර පළාත් සභාවක් තිබෙනවා කියන එක ජනතාව දැනුවත් කිරීම පිළිබඳව අපි ඒ මාධ්‍යයට සතුටු වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මූණ පොඩ්ඩක් අර පැත්තට හරවන්න.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එහෙම කිව්වේ මට මාධ්‍යයේ කථාව දාගන්න නොවෙයි. 1991 ඉඳලා මම මාධ්‍යයේ කථා දාපු මිනිහෙක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවුරුදු 40 ක් දේශපාලනය කරපු මිනිහෙක් මම. 1970 ඉඳලා දේශපාලනය කරපු කෙනෙක්. ඒ නිසා

[ ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා ]

අපට මේ රට ගැන, පක්ෂය ගැන, අපේ රටේ ආගම ගැන අපට ලොකු කැක්කුමක් තිබෙනවා. අපි හිතට එකඟව ජීවිතයේ කවදාවත් කිසි වැරැද්දක් නොකරපු දේශපාලඥයෙක්. අද පක්ෂ විපක්ෂ වැඩි පිරිසක් දේශපාලඥයෝ මන්ත්‍රීවරු වෙන්න බලාපොරොත්තු වෙන්නේ මොකටද? අපි මැතිවරණයකදී බොහොම අමාරුවෙන් වාහනෙකුත් විකුණගෙන, ලක්ෂ 50 ක්, 60 ක්, 70 ක් වියදම් කරලා ඒ තරගයට ගිහිල්ලා යාන්තම් මනාප ටිකක් අරගෙන මෙහාට එනවා. සමහර මිනිස්සු වියදම් කරන ප්‍රමාණය ඉලක්කම්වලින් කියන්න බැහැ. අනන්ත අප්‍රමාණ ලක්ෂ කෝටි ගණන් මේ මිනිස්සු වියදම් කරලා මේ සභාවලට එන්නේ මොකටද? මොකක් හරි දෙයක් කරගෙන හම්බ කරගන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනාව ගැන කථා කරනකොට මේ රටේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා 2005 දී බලයට පත් වුණා. ඒ 2005 බලයට පත් වනකොට බාධක, කරදර මැද්දේ මේ මැතිවරණය ජයග්‍රහණය කළා. එතුමා එදා මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා. මම මේ රටේ තිබෙන උතුරු - නැගෙනහිර යුද්ධය අවසන් කරන්න කටයුතු කරනවා කියලා. එතුමා ඒක කළා. අපි පිළිගන්නවා. මේ රටේ එතුමාට -

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon. Indika Maheesha Bandara

එතුමා කළේ නැහැ. එතුමා කොහේද කළේ? එතුමා යුද්ධය කළාද?

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එතුමා යුද්ධය කළේ නැහැ. රණවිරුවෝ යුද්ධය කළේ. එතුමා ලකුණු දාගත්තා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාවට බාධා කරන්න එපා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එතකොට මේතුමාට පුළුවන්ද ජනාධිපතිතුමාගේ නම කියන්න?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යම්කිසි කෙනෙකුගේ නම බලෙන් කියවන්න බැහැ. එතුමා ඒ ප්‍රකාශය නොකළා නම්, මම ෆොන්සේකා මහත්තයාගේ නමත් මේ කථාවේදී කියනවා. ඒකයි මේ කථාව අහගෙන ඉන්න කිව්වේ. ෆොන්සේකාගේ මහත්තයාගේ හොඳ ගතිගුණ, ඒ මනුස්සයා කරපු දේවල් අපි දන්නවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

යුද්ධය දිනනකොට හොඳයි. දැන් තමයි හොඳ නැත්තේ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

මම නමවත් කියන්නේ නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රට තුළ අපි දන්නවා 1960 ගණන්වල 70 ගණන්වල යම්කිසි කුඩු ප්‍රමාණයක් මේ රටට ආවා. අද විපක්ෂය යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ, ආණ්ඩුවට බැණලා කරලා නොවෙයි. මේ පළාත් සභාවේ තීන්දුවක් අරගෙන, මේක නතර කරන්න අපි සියලු දෙනාම එකතු වෙලා කටයුතු කරමුයි කියලා. අපි දන්නවා සමහර තැන්වල - උදාහරණයක් ගන්න පොලීසිය. පොලීසිය ගැන කථා කළොත් ලක්ෂයක් හිටියොත් එක්කෙනෙක් දෙන්නෙක් අතින් හරි වැරැදි වැඩ කෙරන්නේ නැද්ද? කෙරෙනවා. අනන්ත අප්‍රමාණ මේ කුඩුවලට සහයෝගය දෙන නිලධාරීන් මේ රටේ හිටියේ නැද්ද? හිටියා. අද බන්ධනාගාරයට ගිහිල්ලා බලන්න. බන්ධනාගාරය ගැන අපි කථා කරනවා. කොහොමද කුඩු ගෙනියන්නේ? බන්ධනාගාර නිලධාරීන් 1000 ක් හිටියත් එක පුද්ගලයෙක්, දෙන්නෙක් හරි වැරැද්දක් කළොත් ඔය කුඩු බන්ධනාගාරයට යන්නේ නැද්ද? සමස්ත බන්ධනාගාරයටම මිනිස්සු බනිනවා. මේකයි සත්‍යය. අපට මේ සත්‍ය හොරකම් කරලා කථා කරන්න පුළුවන්කමක් නැහැ. අද හැම තැනම මේක ව්‍යාප්ත වෙලා. මම එකක් කියනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, එතුමා ගැන මම කථා කරන්නේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ කටයුත්ත නවත්වන්න එතුමාගේ ශක්ති ප්‍රමාණයෙන් වැඩ කටයුතු කළා. අද අපි දන්නවා -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

නම කියන්න බැහැ. නම කියන්න බැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගේ නීතිය -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

බනින්න විතරයි බැරි. හොඳ කියන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගම්මන්පිල ඇමැතිතුමා කෝ රීති?

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගම්මන්පිල ඇමැතිතුමාගේ අර රීතිය නැද්ද? එතුමාගේ රීතියට මොකද වුණේ?

[සභාවේ ඝෝෂා]

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශ්ශබ්ද වෙන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

කෝ රීති? ඇහුණේ නැහැ වාගේ ඉන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

36 (1) යටතේ ඔබතුමාට කථා කරන්න අයිතියක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගේ නීතිය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ යෝජනාව සද්භාවයෙන් කථා කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විපක්ෂයට විතරද? ඔබතුමා මහින්ද රාජපක්ෂ කියද්දී නැගිට්ටා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් නැගිට්ටේ නැති එකයි මට තියෙන ප්‍රශ්නය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ යෝජනාවේ හොඳ පැත්තක් ගැන පෙන්නලා හර්ෂණ රාජකරුණා මැතිතුමා ගෙනාපු යෝජනාවට කරුණු ටිකක් තමයි මම හිතන්නේ මෙතුමා බොහොම සද්භාවයෙන් පෙන්නලා දෙන්න හැදුවේ. ඒක අවුල් කරන්න එපා. කථා කරන්න ඉඩ දෙන්න. නම් නොකියා ඔබතුමා කරුණු ටික හරියාකාරව ඉදිරිපත් කරන්න. යෝජනාවට අවශ්‍ය තොරතුරු ටිකයි ලැබෙන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පුද්ගලයින්ගේ නම් නොකියාද කථා කරන්න වෙලා තිබෙන්නේ? කොයි හැටියට වෙතත් අද මේ කුඩු ව්‍යාපාරය සමස්ත රටේම ව්‍යාප්ත වෙලා තිබෙනවා. අපට ඒක නැහැයි කියන්න බැහැ. හැබැයි, මේක මර්දනය කරන්න අතිගරු ජනාධිපති මහින්ද

[ ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා ]

රාජපක්ෂ මැතිතුමා විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා කියන එක මම කියනවා.

[සභාවේ ඝෝෂා]

මේ කුඩු මර්දනය නොකළා නම් කොහොමද මේ මිනිස්සු අහු වෙන්නේ? දැන් මේ ප්‍රශ්නය -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

රීති ප්‍රශ්නයක්.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

මේ කුඩු වසංගතය මර්දනය කරන්න විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා කියන එක -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

රීති ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජනාධිපතිතුමා ගැන කථා කරන්නත් බැහැ නේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

රීති ප්‍රශ්නයට අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කියන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභා රීතිවල 64 (1) සඳහන් වෙන්නේ, පුද්ගලයෝ හතර දෙනෙක් පිළිබඳව. ජනාධිපතිතුමා, ආණ්ඩුකාරවරයා, විනිශ්චයකාරවරු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිළිබඳව. මෙහි සඳහන් වෙන්නේ නැහැ හොඳ කථා කරන්න පුළුවන්, නරක කථා කරන්න බැහැයි කියලා. මෙහි කියනවා හොඳ හෝ නරක සම්බන්ධයෙන්, හැසිරීම සම්බන්ධයෙන් කථා කරන්න බැහැයි කියලා. සරත් ෆොන්සේකා මහත්තයාගේ නම කියන්නත් එපා. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ නම කියන්නත් බැහැ. සභා රීති 64 (1) අනුව පැහැදිලිව සඳහන් වෙනවා මේ රීතිය දැඩි ලෙස පිළිපැදිය යුතුයි කියලා. නිකම් නොවෙයි. දැඩි ලෙස මේ රීතිය පිළිපැදිය යුතුයි. (බාධා කිරීම්) පිළිපදින්න අපි බැඳිලා ඉන්නවා. හැසිරීම සම්බන්ධයෙන්.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ගරු මන්ත්‍රීතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. සරත් ෆොන්සේකා මැතිතුමා 64 (1) රීතියට වැටෙන ක්‍රමවේදය පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න පුළුවන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ, නැහැ. සරත් ෆොන්සේකා මහත්මයාගේ නම කියන්නේම නැහැ කියලා කිව්වා නේ?

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒ අයගේ වාසිය විතරයි අහන්නේ. අනෙක් පැත්තට කිව්වාම ඇහුණේ නැහැ වාගේ ඉන්නවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒකට වැටෙන්න තිබුණු විධියට 2010 දී හොරකම් කළා. නැත්නම් 2010 දී ඔතැනට තමයි වැටෙන්නේ. හොරකම් කළා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභානායකතුමා කථා කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ඉන්න රාජ්‍ය නායකතුමා මේ මත්ද්‍රව්‍ය, කුඩු වසංගතය ඉතාමත්

ඉක්මණින් මේ රටෙන් තුරන් කරන්නට විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා කියන එක මම සඳහන් කරනවා. හැබැයි, මෙතැනදී පක්ෂ පාට භේදයක් බැලුවේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මෙතැන පක්ෂයක් පාටක් බැලුවේ නැහැ. අපේ ප්‍රවාහන ඇමැතිතුමා පෙත්සමක් ගැහුවා. ඒ පෙත්සම විභාග කරන්න පොලීසියෙන් කවුරු හරි ඇවිල්ලා බැලුවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි හිතා ගන්න ඕනෑ, අපේ පක්ෂයේ කෙනෙක් කියලා අපව පැත්තකට දැම්මේ නැහැ. එතුමාගේ නිර්දෝෂීභාවය නිසා තමයි අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා එතුමාගේ ගෙදර ඇවිල්ලා - (බාධා කිරීම්) නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා පක්ෂය වෙනුවෙන් වැඩ කරන කෙනෙක්. නොගිහින් ඉන්න තිබුණා. පක්ෂය වෙනුවෙන්. අද බලන්න අපේ සෞඛ්‍ය ඇමැතිතුමා යෝජනාව ගෙනාවේ සිගරට් බීමෙන් වෙන හානිය පිළිබඳව ජනතාව දැනුවත් කරන්න. මේ පින්තූර ඇතුල් කරන්න හරි. උසාවියෙන් තීන්දුව දුන්නේ 60% යි. ඇමැතිතුමා ඉදිරිපත් කළේ 80% යි. අද වනකොටත් ඒ සිගරට් බීම නැවැත්වීම සඳහා අපේ රජය කටයුතු කරලා. අපි බොහොම සතුටින් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද බස් එකක යන්න පුළුවන්. බස් එකක සිගරට් එකක් බොන්නේ නැහැ. පාරක සිගරට් එකක් බොන්නේ නැහැ. සිගරට් එකක් බොන මිනිස්සු දැක්කාම අපි පිළිකුල් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

උන් කුඩු ගහනවා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

කුඩු ගහන එක ගැන මම දන්නේ නැහැ. ඒක වෙනම දෙයක්. කුඩු ගහනවා ඇති සිගරට් ගහන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අවංකව පිළිගන්න ඕනෑ. මම ඒකයි කිව්වේ, අපි පිළිගන්නවා. අද අධ්‍යාපනය ගැන බලන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අද අධ්‍යාපනය දිහා බලන්න. අද දෙමව්පියෝ ගැන බලන්න. තමුන්නාන්සේලා දකින්න ඇති ඊයේ පෙරේදා පත්තරේක තිබුණා තමන්ගේ දරුවාව මාස ගණනාවක් අපචාරයට යොදාගෙන වෙනත් රෝගයකට දරුවා රෝහලට ගියාම රෝහලේ වෛද්‍යවරයා කියනවා මේ දරුවා ගැබ් අරගෙන කියලා. ඒ පියා මාස ගණනාවක් තිස්සේ ඒ වැරැදි වැඩේ කරන්න ඇත්තේ මොකක් නිසාද? මේ ජාතියේ කුඩු පාවිච්චි කරපු මිනිහෙකුට හැර, පියෙකුට තමන්ගේ දරුවෙකුට ඒ වැඩේ කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා පක්ෂ පාට පැත්තකට දාන්න. මේ වැඩේ අවසන් කරන්නට, බස්නාහිර පළාත් සභාව පෙරමුණ ගන්නට ඕනෑ. බස්නාහිර පළාත් සභාවේ අපි සියලු දෙනාම එකමුතු වෙන්න ඕනෑ. රාජ්‍ය නායකයා කියන පුද්ගලයා - මේ රටේ ජනාධිපතිවරයාගේ නම කියන්න බැහැයි කියන කථාව මේ සභාව වෙනුවෙන් මම පිළිගන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වැඩ බලන මහ ඇමැතිතුමා කිව්වේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අපි නොවෙයි කිව්වේ. ඔබතුමන්ලාගේ පැත්තෙන් කිව්වේ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

අපි පිළිගන්නේ නැහැ. එතුමා මේ රටේ යුද්ධය අවසන් කළා. එතුමාට කරන්න බැරි දෙයක් නැහැ. අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අපි නොවෙයි, වැඩ බලන මහ ඇමැතිතුමා කිව්වේ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

තමුන්නාන්සේලා හිතාගන්න. තව වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා මේ කුඩු වසංගතය මේ රටෙන් තුරන් කරන්නට අපේ රජය කටයුතු කරනවා කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ස්තුතියි.

[ අ.භා. 12.24 ]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා මට කාලය වෙන් කිරීම සම්බන්ධව.

[ ගරු එස්.එම්. මරික්කාර් ]

විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධව අපි හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. හැබැයි, මම පෞද්ගලිකව විශ්වාස කරන කාරණාවක් තමයි මේ යෝජනාව බස්නාහිර පළාත් සභාවේදී ඒකඡන්දයෙන් සම්මත වුණත්, මේකෙන් කිසිම වැඩක් වෙන්නේ නැහැ කියන එක. ඒක තමයි මගේ හැඟීම. මොකද, මේ ආණ්ඩුව ඒ විධියට තමයි පළාත් සභාවට සලකන්නේ. කෙසේ නමුත් මහජන නියෝජිතයෝ හැටියට අපේ විරුද්ධත්වය සහ ඒ පිළිබඳව අපේ මතය ප්‍රකාශ කිරීම සිදු කළ යුතුමයි. විශේෂයෙන්ම දැන් අපට මේ යෝජනාව ගෙන එන්න සිද්ධ වෙලා තිබෙන්නේ, ශ්‍රී ලංකාව මතින් තොර රටක් බවට පත් කරනවා කියලා, ආසියාවේ ආශ්චර්ය කරා ගෙන යනවා කියපු ආඩම්බරකාර තාත්තාගේ ආණ්ඩුව යටතේ ආසියාවේ කුඩු කේන්ද්‍රස්ථානය බවට ශ්‍රී ලංකාව පත්වීම සම්බන්ධව තමයි අපට අද කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම හෙට දින උපදින දරුවාවත් ණයකාරයෙක් කරපු රටක තමන්ගේ දරුවන්ට විතරක් සැප ලබා දෙන රටක අනුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය විනාශ වෙන්නට ඉඩ දීලා බලාගෙන ඉන්න, අනුන්ගේ දරුවන්ගේ සෞඛ්‍ය විනාශ වෙන්න ඉඩ දීලා බලාගෙන ඉන්න -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කුඩු අල්ලන හින්දාද ඕවා කියන්නේ?

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අනුන්ගේ දරුවන්ගේ අනාගතය විනාශ වෙන්න ඉඩ දීලා බලාගෙන ඉන්න මේ රාජපක්ෂ ආණ්ඩුවේ කුඩු ව්‍යාප්තිය සිද්ධ වෙනවා හැර, වෙන බලාගෙන ඉන්න කිසි දෙයක් අපට ඉතුරු වෙලා නැහැ. අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ. දැන් කිව්වා මුහුදු මාර්ගයෙන් තමයි කුඩු ආවේ කියලා. ඒක L.T.T.E සංවිධානය පිට දාලා බේරුණා. දැන් යුද්ධය ඉවර වෙලා අවුරුදු 05 ක් ගත වෙලා තිබෙනවා. අද ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට L.T.T.E යේ ජාත්‍යන්තර ජාලය මෙහෙයවපු, ඒ මුදල් ජාලය මෙහෙයවපු, L.T.T.E දේපළ ටික කොහේද තියෙන්නේ, කොතැනද තියෙන්නේ කියලා දන්න කේ.පී. හුරතල් කරගෙන කන්ටේනර් පිටින් එන්නේ ඒ හරහාද කියලා අපට ලොකු සැකයක් තිබෙනවා. මේ ආණ්ඩුවේ අනුදැනුම මත, ආණ්ඩුවේ ආශිර්වාදය මත, ආණ්ඩුවේ නීතියේ කඩතුරාවලින් ඇතුළට ගිහිල්ලා කරනවාද කියලා අපට සැකයක් තිබෙනවා. අන්න ඒ නිසා තමයි පැහැදිලිව කියන්නේ, මේ මොහොතේ මොන පක්ෂයක් බලයේ හිටියටත්, ආණ්ඩුවයි වග කියන්න ඕනෑ. ආණ්ඩු කරන උදවියයි වග කියන්න ඕනෑ. නීතිය ක්‍රියාත්මක කරන්නේ විපක්ෂය නොවෙයි. නීතිය ක්‍රියාත්මක කරන ආයතන මෙහෙය වන්නේ විපක්ෂය නොවෙයි. නීතිය ක්‍රියාත්මක කරන ආයතන මෙහෙය වන්නේ ආණ්ඩුව. ඒ නිසා ආණ්ඩුව පැහැදිලිවම වග කියනවා. අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා, ඒ කාලේත් වුණාද කියලා. මෙපමණ, කන්ටේනර් පිටින්, කිලෝ ගණන් පිටින් අහු වුණේ මේ ආණ්ඩුව කාලේ. මේ පසුගිය අවුරුදු දෙකේ අහු වුණේ. කලින් අහු වුණේ නැහැ. අනෙක් එක තව ප්‍රශ්නයක් තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අහු වුණේ නැහැ. ඇල්ලුවා.

[සභාවේ ඝෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

කුඩ්ඩෝ කෑගහනවා. කෑගහන්න එපා. ඒ නිසා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒ කාලේ ඇල්ලුවේ නැහැ. දැනුයි කුඩු අල්ලන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අපි පැහැදිලිව කියන්න ඕනෑ ඔය අල්ලන ටික -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීවරු නිශ්ශබ්ද වෙන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ප්‍රශ්න කරනවා. අපි ප්‍රශ්න කරන්නේ නොඅල්ලන කුඩු කොහේද කියලා සහ අල්ලපු කුඩුවලට මොකද වුණේ? ඒවා පෙන්නුවාද? ඒවාට මොනවද කළේ කියලා කවුද දන්නේ? ඒවා කවුද දන්නේ? ඒක නිසා එකක් දෙකක් පෙන්නලා (බාධා කිරීමක්) අපි දන්නවා. ඒකක දෙකක් පෙන්නනවා. ඉතුරු ඒවා යටිමඩි ගහනවා. ඒ නිසා තමයි අද අපට මේක කථා කරන්න වෙලා තියෙන්නේ. විශේෂයෙන්ම අපි පැහැදිලිව කියන්න ඕනෑ, මේ යෝජනාවේ තිබෙන ප්‍රධානතම වටිනාකම තිබෙන්නේ ඒ කාලේ ළමයින් ඉස්කෝලයට ගියාම දෙමව්පියෝ බලාපොරොත්තු වුණේ ළමයා තරගකාරිව ඉගෙන ගෙන විභාග පාස් වෙන්නේ කොහොමද කියලා. අද මොනවාද කරන්න වෙලා තියෙන්නේ? දරුවෝ ඉස්කෝලයට ගියාම දෙමව්පියෝ හයේ ඉන්නේ. ඉස්කෝලයෙන් එළියට එනකොට තාප්ප වටේ ඉන්න මත්කුඩු රාක්ෂයා තමන්ගේ දරුවෝ ගිල ගනීද කියලා. උගන්වනවා වෙනුවට කුඩු කාරයින්ගෙන් බේරා ගන්න රටක් බවට මේක පත් වෙලා තිබෙනවා. අන්න ඒ නිසා තමයි පාලකයෝ මේ වගකීම භාර ගන්න ඕනෑ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

කවුද මේ රටට කුඩු ගෙනාවේ?

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අපට හරි කනගාටුයි කුඩුකාරයින්ට ඔයගොල්ලෝ සපෝර්ට් කරන එක ගැන. කුඩුවලටයි, කුඩුකාරයින්ටයි ඔයගොල්ලෝ සපෝර්ට් කරන එක ගැන අපට හරි කනගාටුයි.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මේ ආණ්ඩුවෙන් තමයි කුඩු අල්ලන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔයගොල්ලෝ තමයි කුඩු ගෙනාවේ.

[සභාවේ ඝෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගිලගන්න බලාගෙන ඉන්නේ. ඒ නිසා මම කියනවා කුඩ්ඩන්ට Support කරන කුඩ්ඩෙක් වෙන්න එපා කියලා. කුඩ්ඩන්ට Support කරන කුඩ්ඩෙක් වෙන්න එපා කියලා මම පැහැදිලිව ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මූලාසනයට කථා කරන්න. බාධා කිරීම්වලට උත්තර දෙන්න යන්න එපා. ඒ නිසා හර්ෂණ රාජකරුණා සංවිධායකතුමා ගෙනාපු යෝජනාවට ගරු කරලා ඒකට ගැළපෙන්න මූලාසනයට කථා කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඒ යෝජනාවට අදාළව තමයි කථා කරන්නේ. මෙතුමන්ලා බාධා කරන කොට ඒවාට උත්තර දෙන්න ඕනෑ. නැත්නම් මෙතුමන්ලා එක්සත් ජාතික පක්ෂය පැත්තට නිකම් බොරුවට චෝදනා කරනවා. (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අපි දිහා නොවෙයි. කැමරාව දිහා බලන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම කියන්න ඕනෑ -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

එතුමා බලන්නේ සිරසේ කැමරාව දිහා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරසේ කැමරාව දිහා බලාගෙන කථා කරන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට බාධා කරනකොට කථා කරන්න බැහැ. මට කාලය දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා එතුමාට බාධා කරන්න එපා. ඔබතුමා කථා කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

විශේෂයෙන්ම අපි දන්නවා, අපේ ශ්‍රී ලංකාද්වීපයට විශාල හානියක් කරන්න බලාගෙන හිටපු ජයලලිතා ජයරාම් කෝටි 66 ක් හොරකම් කරලා මොකද වුණේ කියලා. අපි දන්නවා කෝටි 45 හොරකම් කරපු ඇමැතිවරුන්ට අද මොකද වෙලා තියෙන්නේ කියලා. (බාධා කිරීමක්) අල්ලස් කොමිසමට එන්නේ නැහැ -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

කවුද සතොස විකුණුවේ?

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එහෙම රටක මේ කුඩු නවත්වන්නේ කොහොමද? කියලා අපි ප්‍රශ්න කරනවා. ඒ නිසා තමයි අපට ප්‍රශ්නයක් තිබෙන්නේ, දේශපාලන අධිකාරියේ අශිර්වාදය සහ උවමනාව මත මේක සිද්ධ වෙනවාද කියලා. එහෙම ආණ්ඩුවේ දේශපාලන අධිකාරියේ උවමනාව සහ ආශිර්වාදය මත පදනම්ව මේක කරනවා නම්, අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය විනාශ වෙලා තිබෙන්නේ, මේ අධිකාරියේ උවමනාව මත කියලා පැහැදිලිව කියන්න ඕනෑ. අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වෙලා තිබෙන්නේ, සමාජයේ සාරධර්ම පිරිහිලා යන්නේ මේ දේශපාලන අධිකාරියේ උවමනාව සහ ආශිර්වාදය මතය කියලා අපට කියන්න සිද්ධ වෙනවා. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ, අපි සබුද්ධිකව කල්පනා කළොත් තේරුම් ගන්න ඕනෑ ඇයි අද අපට මෙහෙම කථා කරන්න වෙලා තිබෙන්නේ? අපේ රටේ කුඩු නැත්නම්, එන කුඩු ටික පොලීසියෙන් අල්ලනවා නම් ආණ්ඩුව නීතිය ක්‍රියාත්මක කරනවා නම් සමාජයේ ඉන්න දෙමව්පියන්ට තමන්ගේ දරුවන් ගැන බය වෙන්න ඕනෑත් නැහැ, මන්ත්‍රීවරු හැටියට මේ පළාත් සභාවේ අපට මේ ගැන කථා කරන්නත් කිසිම උවමනාවක් මතු වෙන්නේ නැහැ. මේ ප්‍රශ්නය තිබෙන්නේ කුඩු තියෙන නිසා. කුඩු වැඩි වෙන නිසා. කුඩු අල්ලනවාට වඩා නොඅල්ලන ප්‍රමාණය වැඩියි.

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලේ කුඩු ගේන්න පටන් ගත්තු නිසා මේ කථා කරන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ව්‍යාප්ත වන හින්දා. අන්න ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ, -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලේ ගෙනාපු නිසයි කථා කරන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මේ වාගේ චෝදනා තිබුණේ නැහැ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලේ කුඩු ව්‍යාප්ත වුණේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මොකද නැත්තේ?

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලේ දරුවෝ මෙපමණ -

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඇල්ලුවේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අන්න ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉතාම කනගාටු වෙනවා. මුහුදු මාර්ගයෙන් එනවා කියපු කුඩු, කන්ටේනර් පිටින් එනවා කියපු කුඩු, ඒ මුහුදු මාර්ගයෙන් එන කුඩු මුහුදු පළාත්වල විතරක් නොවෙයි, අනෙක් පළාත්වලටත් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙනවා. මම ඉතාමත් කනගාටු වෙනවා. අපේ පළාත් සභාවේ මේ කුඩුවලට විරුද්ධව විශාල සටනක් කරපු මන්ත්‍රීතුමිය අද කොලොන්නාවේ රාජසිංහ පරපුරෙන් එන වික්‍රමාන්විත ජනතාව බේරා ගන්න මෙතැන නැති එක ගැන. මාධ්‍යවලට ඇවිල්ලා එතුමිය කුඩු ගැන කථා කරනවා. කොලොන්නාවේ කුඩු තියෙනවා කියනවා. කොලොන්නාවේ ජනතාව කුඩුකාරයෝ කියලා ඒකෙන් මතයක් ඇවිල්ලා තිබෙනවා. මා ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. එදා මුල්ලේරියාව සටන ජයග්‍රහණය කරපු පරපුරකින් පැවත එන කොලොන්නාවේ ජනතාව කුඩුකාරයෝ නොවෙයි. හැබැයි, මේ ආණ්ඩුවේ අනුදැනුම මත සිදු වන කුඩු ප්‍රවර්ධනය හරහා කොලොන්නාව කුඩු ව්‍යාපාරිකයන්ගේ කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. මම හිතන්නේ එතුමිය කොලොන්නාවේ ජනතාව බේරන්න මේ වෙලාවේ මේ සභාවට නොපැමිණීම සම්බන්ධව මගේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතුමියගේ ගෙදර දානයක්.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

එතුමිය අසනීපයෙන් ඉන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒ වගේම කියන ඕනෑ, දැන් අපි මේ ගැන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

කථා කළා. මේ දේ ගැන රටේ ජනතාව දන්නවා. දේශපාලඥයෝ දන්නවා. අපි මේ ගැන කථා කළා. අපට ඕනෑ මේවාට විසඳුම්. ඒ නිසා පැහැදිලිව කියන්න ඕනෑ, ලබන ජනවාරි මාසයේ පැවැත්වෙන ජනාධිපතිවරයෙන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජය ගත්තාම -

[සභාවේ ඝෝෂා]

මුළු ලංකාවේත් ඉතාම -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

30 වැනි වතාවටත් පරදිනවා.

[සභාවේ ඝෝෂා]

30 වැනි වතාවටත් පරදිනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

හැබැයි හොරකම් කරන අයගේ සියලු දේපලත් -

[සභාවේ ඝෝෂා]

ඒ නිසා බය වෙන්න එපා. අපි තමුන්නාන්සේලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවාම ඔබතුමන්ලාට ගහන්නේ නැහැ. අපි අනුකම්පා කරනවා. සාමයේ දෑත් දිගු කරනවා. එන්න රට දියුණු කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අපිත් එක්ක එකතු වෙන්න එන්න කියමින් -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

[ අ.භා. 12.33 ]

**ගරු රොයිස් ප්‍රනාන්දු**
Hon. Royce Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සභාව පාලනය කරන්න බැරිද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. මම හිතන්නේ මෙතුමාගේ මංගල කථාව වෙන්න ඕනෑ.

**ගරු රොයිස් ප්‍රනාන්දු**
Hon. Royce Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෞරවනීය මන්ත්‍රීවරුනි, ප්‍රථමයෙන්ම මාව පළාත් සභාවට පත් කරන්නට එදා 30 වැනිදා උදේ පාන්දර කහට කෝප්පයක් බීලා ඡන්ද පොළට ආපු 30,000 ක් වූ කෘතහස්ථ ජනතාවට මගේ ගෞරවනීය ස්තූතිය මේ සභාවේදී මම පුද කරනවා. ඒ වාගේම මීගමුව ආසනයේ සියලු අපේක්ෂකයින් අභිබවා වැඩිව මනාප සංඛ්‍යාවක් දීපු මීගමුව ජනතාවටත්, මේ අවස්ථාවේදී මගේ දෑත් එකතු කරලා ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම මගේ මංගල කථාව කාලෝචිත මාතෘකාවකින් ආරම්භ කරන්න ලැබීම සතුටු වෙනවා. අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳවත්, එම යෝජනාවට අදහස් ප්‍රකාශ කරන්නට ලැබීම පිළිබඳවත් මම හිතනවා, මම ලැබූ විශේෂ අවස්ථාවක් කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මිලිග්‍රෑම් එක ග්‍රෑම් එකට පත් වෙමින්, ග්‍රෑම් එක කිලෝ එක බවට පත් වෙමින්, කිලෝ එක ටොන් එක බවට පරිවර්තනය වෙමින් මේ මත්ද්‍රව්‍ය උවදුර අද මේ රට ගිල ගනිමින් සිටින බව ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ අපි කවුරුත් හොඳින් දන්නා කරුණක්. ග්‍රෑම් එක මිලිග්‍රෑම් එක සුළුවෙන් පරිහරණය කරන කෙනා නැත්නම් විකුණන කෙනා අද සිරගත වෙද්දී කිලෝ ගණන් විකුණන අය අධිසුඛෝපභෝගී වාහන පරිහරණය කරමින්, පාවිච්චි කරමින් ධනකුවේරයන් බවට පත් වෙලා රජ මැදුරුවල, සුවිසල් මැදුරුවල සැපවත් ජීවිත ගත කරද්දී අහිංසක දරු පවුල් බුරුතු පිටින් මේ රටේ විනාශ වන ක්‍රමයකට රට ක්‍රමක්‍රමයෙන් පරිවර්තනය වෙමින් යනවා. අද සිරගෙවල්වල - මීගමු සිරගෙදර මම විශේෂයෙන් ඉන්න නිසා දන්නවා. අන්තරාදායක මත්ද්‍රව්‍ය ආඥා පනත යටතේ 54 වගන්තිය ගහලා, ජාවාරම් ගහලා ග්‍රෑම් එකට මිලි ග්‍රෑම් 25 ට, 30 ට, 40 ට මාස ගණන් අවුරුදු ගණන් හිරගෙවල්වල ගාල් කරලා තිබෙනවා. ඒ වාගේම ඒ අයගේ දරු පවුල්, ඒ දරුවෝ ඒ අයගේ ජීවිත මේ කර්තව්‍යයන් නිසා විනාශ වෙමින් පවතිනවා. පසුගිය කාලයේ අපි දැක්කා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කන්ටේනර්වල කුඩු කිලෝ බුරුතු පිටින් මේ වරාය හරහා රට තුළට ඇතුල් වෙනවා. ග්‍රීස් ටින් හරහා කුඩු කිලෝ 300 ක් ආවා. ඒක අවසානයේ 263 බවට පත් වුණා. අද ඒක 163 බවට පත් වෙලා. කිලෝ 100 කට වුණු දෙයක් නැහැ. අන්න මැගසින් බන්ධනාගාරයේ ෆ්‍රීෂෙල් එකේ ඉන්නවා, ඒ පකිස්ථාන් ජාතිකයා. ඔහු අද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනවා, කුඩු කිලෝ 300 කට මම වැරැදිකරුවෙක් මිසක් කුඩු කිලෝ 163 කට මම වැරැදිකාරයෙක් නොවෙයි කියලා. අල කන්ටේනර්ස්වල ආවා. ඊට පස්සේ යන්ත්‍රෝපකරණ බහලුම් කන්ටේනර්ස්වල ආවා. ඒ විතරක් නොවෙයි. ඒ ආපු කන්ටේනරයක් මුදා හැරීම සඳහා මේ රටේ අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලය හරහා රේගුවට ලිපියක් යනවා. අහවල් කන්ටේනරය මැතක ලියාපදිංචි කරපු

සමාගමක් නිසා ඒ සමාගමට බහලුම් ගාස්තු නැත්නම් මේ කන්ටේනරය තියා ගත්තු කාලය සඳහා ගෙවන බිම් ගාස්තු ගෙවන්න බැරි නිසා මේක මුදා හරින්නේ නම් ස්තූතිවන්ත වෙමි කියලා. නමුත් අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලයෙන් ඇරපු ලිපිය පසෙකට තියලා රේගුවත් තමන්ගේ කාර්ය අකුරට ඉෂ්ට කරගෙන යද්දී කිලෝ 93 ක් ඒ ඇඹරුම් යන්ත්‍රයේ තිබිලා අහු වෙනවා. එකක් තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊට පස්සේ අග්‍රාමාත්‍යවරයාට සිද්ධ වෙනවා මගේ අනුදැනුමකින් තොරවයි මේ ලිපිය ගියේ කියලා කියන්න. අපට ප්‍රශ්නයක් පැන නැගෙනවා මේ වාගේ වැදගත් ලිපියක් අග්‍රාමාත්‍යවරයා නොදැන ලේකම්වරයාට අරින්න බලයක් තිබෙනවාද? අග්‍රාමාත්‍යවරයා -

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

අග්‍රාමාත්‍යතුමා පිළිබඳව මෙතැන කථා කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම කිව්වොත් බාධා කරනවා.

**ගරු රොයිස් ප්‍රනාන්දු**
Hon. Royce Fernando

එවැනි ලිපියක් අරින්නට ඔහුට එවැනි ශක්තියක් නොමැති නම් එතුමා ඇරියේ එතුමාගේ තනි මතය මතද? එවැනි ලිපියකට රේගුව නොසැලකුවේ ඇයි? ඒ වාගේම අලුත් සමාගමකට එහෙම කන්ටේනරයක් ගෙන්නුවාට පස්සේ ඒ සමාගම අලුතෙන් ලියාපදිංචි කරපු නිසා මේ රටේ අලුතෙන් ලියාපදිංචි කරපු සියලු සමාගම්වලට එවැනි බහලුම් ගාස්තු, නැත්නම් බිම් ගාස්තු නොගෙවා මුදා හරින්නට මේ රටේ නීතියක් තිබෙනවාද කියන එක. එතැනින් නතර වෙන්නේ නැහැ. මේක අද ආසියාකරයේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ තෝතැන්නක් බවට පත් වෙලා ඉවරයි. රට තුළට ගලාගෙන ආවාට පස්සේ පාසල් දරුවන් පමණක් නොවෙයි. යුරෝපයට, වෙනත් රටවල්වලට මේ කුඩු බෙදා හරින මරමස්ථානය බවට ලංකාව පත් වෙලා. මෑතකදී කටුගස්තොටදී, කන්ද උඩරටදී අපි දැක්කා කිලෝ 63 කට වැඩි ප්‍රමාණයක් අත්අඩංගුවට ගත්තා. මේ රටේ ජාත්‍යන්තරව යුරෝපයේ නමක් දිනාගෙන තිබෙන අපේ තේ ටික විනාශ කරන්නට, ඒ හරහා තේ පැකට්වලට දාලා යුරෝපයට කුඩු අරින ක්‍රමවේදයක් මේ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයෝ, මේ රටේ ව්‍යාපාරිකයෝ, දේශපාලනයට සම්බන්ධ අයත් එක්කලා අත්වැල් බැඳගෙන කටයුතු කරන්න පටන් අරගෙන තිබෙනවා කියන දේ අද රහස් ඔත්තු සේවා සහ බුද්ධි අංශ විසින් සොයාගෙන තිබෙනවා. පොල් ටික ඒ පැත්තෙන් ඉවරයි. ජාතික භෝග. රබර් ටික විනාශ වෙලා. කේඩෑ ගැහුණු තේ පදුරු ටිකෙන් පමණක් අද ජාත්‍යන්තරයේ කීර්ති නාමයක් දිනාගෙන තිබෙන මේ ලංකාවේ කීර්ති නාමය පවා විනාශ කරන්නට මේ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෝ ශ්‍රී ලංකාවේ ඉන්න ජාවාරම්කරුවන් සමග අත්වැල් බැඳගෙන තිබෙනවා. අපි කාටවත් කියන්න බැහැ මේකට දේශපාලනයේ සම්බන්ධතාවයක් නැහැයි කියලා. මේ ව්‍යාපාරිකයින්ට පමණක් මේ විධියේ මහ දැවැන්ත - සිමෙන්ති කොට්ටයක් ගත්තොත් කිලෝ 50 යි. පිටි කොට්ටයක් ගත්තොත් කිලෝ 50 යි. හාල් මුට්ටමක් ගත්තොත් කිලෝ 50 යි. මේ වෙද්දී කිලෝ 600 ගණනකට වැඩිය අත්අඩංගුවට අරගෙන තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ ගත්තු කුඩු ටිකකට මොකද වුණේ කියලා මේ වනකල් කවුරුත් දන්නේ නැහැ. මම හිතන්නේ රජයක් හැටියට නීතිය තුළ තීන්දු තීරණ ගත්තා, මේ අත්අඩංගුවට ගන්නා කුඩු ඇළ දොළවල්වල දිය කර අරින්නට ඕනෑ කියලා. ඊට පස්සේ පාරිසරික හේතූන් මත ඒක අත්හැරලා දැම්මා. දෙවැනි පාර ඒ පුච්චලා, ගිනි දල්වලා කුඩු විනාශ කරන්න ඕනෑ කියලා තීරණය කළා. පරිසරයට හානි වෙන නිසා, දුමාකරය නිසා ඒකත් නරත වුණා. ඊට පස්සේ වළ දාන්න තීන්දු කළා. වළ දාන එකත් නතර කළා නැවත හාරලා ගොඩ ගනියි කියලා. හතර වෙනි එක තීන්දු කළා අධිකරණයේ විනිසුරුවරයා ඉදිරියේ රස පරීක්ෂක නිලධාරීන් ඉදිරියේ මත්ද්‍රව්‍ය නාශක අංශයේ අධ්‍යක්ෂවරයා සහ ජ්‍යෙෂ්ට පොලිස් නිලධාරීන් ඉදිරියේ, මාධ්‍යවේදීන් ඉදිරියේ දිය කරලා අධිකරණයේ වැසිකිළි වලට හලන්න. නමුත් හලපු එකක් මේ වනකල් අපි දැක්කේ නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒක ඉතින් පෙන්න පෙන්න දාන්නේ නැහැ.

**ගරු රොයිස් ප්‍රනාන්දු**
Hon. Royce Fernando

ඒ මේක මම කියන දෙයක් නොවෙයි. අද සමාජගත වෙලා තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අල්ලන

[ ගරු රොයිස් ප්‍රනාන්දු ]

මත්ද්‍රව්‍ය නැවත වෙළඳ පොළට එනවාදෝ කියන මතයක් අද සමාජගත වෙලා තිබෙනවා. ඒක මම යෝජනා කරන දෙයක්, මම කියන දෙයක් නොවෙයි. ඒක අපි කවුරුත් දන්න දෙයක්. ඒ නිසා මීට වඩා විනිවිදභාවයකින් මේ ක්‍රියාදාමය සිදු වෙන්නට ඕනෑ කියලා මම මේ අවස්ථාවේ තමුන්නාන්සේගේ අවධානයට යොමු කරනවා. මේ සභාවේ අවධානයට යොමු කරනවා. ඒ වාගේම අද පොලීසියේ තියෙනවා, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට හා සමාන කුඩු. අද අහිංසකයෙක් අල්ලලා තර්ජනය කරනවා, ඇත්ත කියපන්. දීපු කෙනා කියපන්. නැත්නම් උඹට ග්‍රෑම් එකක් දානවා, දෙකක් දානවා කියලා. මම මේ සභාවේ ප්‍රශ්න කරනවා. ඒ කුඩු ආනයනය කරන්න පොලිස් දෙපාර්තමේන්තුව හරහා රජය යම්කිසි මුදලක් දීලා තිබෙනවාද කියලා. සැකකරුවෙකුගෙන් කුඩු අත්අඩංගුවට ගත්තා නම්, මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගත්තා නම් ඒ ප්‍රමාණය අධිකරණයට ඉදිරිපත් වෙන්න ඕනෑ. අතිරික්තයක් නොමැතිව. පොලීසියට කුඩු කොහෙන්ද අල්ලන අහිංසක සැකකරුවන්ට දාන්න. එහෙම නම් එතැනත් හිලක් තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එපමණක් නොවෙයි. අද මේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ කියලා මම කියන්නේ නැහැ. දේශපාලඥයින්ගේ කරට අත දාගෙන, ඒ දේශපාලඥයින්ගේ පැවැත්ම සඳහා කෝටි ගණන් මුදල් වියදම් කරනවා. ඒක අපි කාටත් පේනවා. දකිනවා. අපි කවුරුත් දේශපාලන පක්ෂ ආරක්ෂා කරන්න ඕනෑ නිසා ඒවා රැකගෙන ඉන්නවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. අහිංසක දරු පරපුර ඉවරයි. පාසල් දරුවන් ඉවරයි. දරු පවුල් ඉවරයි. මේ ව්‍යසනය අද පිළිකාවකට වඩා වේගයෙන් ව්‍යාප්ත වෙමින් යනවා. අවසාන වශයෙන් අපි කවුරුත් දන්න මේ වෙළරබඩතැන්න, මධ්‍යම කඳුකරය, සබරගමුව කඳුවැටිය, ගල්ඔය කඳුමිටියාවතෙන් සමන්විත වුණු බුදු රජාණන් වහන්සේ තුන් වතාවක් පය ගහපු, වැලි කුණාටු නැති, කාන්තාර නැති, ගිනි කඳු නැති, වියළුණු දණ්ඩයක් වුණත් පැළ වෙන සශ්‍රීක මහ පොළොවක් උරුම කර ගත්තු අපේ මේ දුවා දරුවන් විනාශ වන මේ ක්‍රමවේදය එදා L.T.T.E ත්‍රස්තවාදීන්ගේ ප්‍රධාන මූල්‍ය උපාය මාර්ගය වුණු මේ මත්ද්‍රව්‍ය ජාවාරමට, මතට තිත කිව්වාට මහින්ද චින්තනය යටතේ ජනාධිපතිතුමාගේ චින්තනය යටතේ, රාජ්‍ය අනුග්‍රහයක් ලැබිලා තිබෙනවා කියන සැකයක් අපට මතු වෙලා තිබෙනවා. මගේ කාලය අවසානයි. හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ගෙනෙන ලද යෝජනාව, කාලෝචිත යෝජනාවක්. මා වෙනුවෙන් එතුමා කාලය වෙන් කිරීම පිළිබඳවද ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා.

[ අ.භා. 12.44 ]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

කරුණාකරලා මට සවන් දෙන්න. බාධා කරන්න එපා. මම අලුත් මන්ත්‍රීවරියක්. පළමුවැනි කථාව නොවෙයි. දෙවැනි කථාව. මම කිසිම කෙනෙකුට බාධා කරන්නේ නැහැ. මම කියන කථාවට ඇහුම්කන් දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හෙළ උරුමයේ මතය?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

හරි. අපේ මතය අපි කියන්නම්. ඒක ඔබතුමන්ලා අහන් ඉන්න කෝ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා අපට මත්ද්‍රව්‍ය ගැන යම් පැහැදිලි කිරීමක් කළා. අපි විෂයයක් ගැන කථා කරනකොට ඒ විෂයයට අදාළ කරුණු පිළිබඳවත් දැනුවත්ව සිටින්න ඕනෑ. පිටරට හෝ ලංකාවේ. සම්පූර්ණ විස්තරය සම්බන්ධයෙන් අපි දැනුවත් වෙලා ඉන්න ඕනෑ. අපි හැම කෙනෙක්ම කථා කරනවා, කුඩු ගේනවා. කුඩු බොනවා. කුඩුවලට ඇබ්බැහි වෙලා තිබෙනවා කියලා. අපි මේ සඳහා මොනවාද මෙතැන කරන්න ඕනෑ යෝජනා. මේ වෙලා තිබෙන වින්නැහියට ගෙනෙන්න ඕනෑ යෝජනාව මොකක්ද? අපි ඒවායි කථා කරන්න ඕනෑ. මේවා නැති කරන්න පුළුවන් කොහොමද? අද අපේ රටේ දරුවන් කොපමණ අසරණ වෙලා තිබෙනවාද? අද කාන්තාවෝ කොපමණ අසරණ වෙලා තිබෙනවාද? (බාධා කිරීම්) උත්තර දෙන්න ඕනෑ නම් ඉල්ලන්න, මගෙන් විනාඩියක් මම දෙන්නම්. බාධා කරන්න එපා. කථා කරන්න ඕනෑ නම් කාට හරි මගේ කාලයෙන් විනාඩියක් හරි දෙන්නම්. ඒ නිසා කියන දේ කරුණාකරලා ඇහුම්කන් දෙන්න.

මේ මත්ද්‍රව්‍ය කිව්වාම කුඩු වාගේම මත්පැන් බීම නිසා අපේ රටේ පවුල්වලට විශාල හානියක් ඇති වෙලා තිබෙනවා. මත්ද්‍රව්‍ය නිසා විශාල වශයෙන් කාන්තාවෝ විනාශ වෙනවා. අපේ ආණ්ඩුව ගත්තොත් එහෙම ඇත්තටම මත්ද්‍රව්‍ය, මත් කුඩු, මත්පැන්වලට විරුද්ධව විශාල වැඩ කොටසක් කරගෙන යනවා. අපට කථා කරන්න මාතෘකාවක් තිබෙන්නේ, මත් කුඩු අල්ලන නිසයි. අපට කියන්න වචන තිබෙන්නේ මත් කුඩු අල්ලන නිසයි. මත් කුඩු අල්ලනවා කියලා, අපට කථා කරන්න, අපට විවාද කරන්න මේ පාර හදලා තිබෙන්නේ, අපේ ආණ්ඩුවෙන්. මොකද, ඒවාට යම් ක්‍රියා මාර්ග ගන්න නිසා. අපි දන්නවා, සමහර තැන්වල පොඩි පොඩි වැරැදීම් වෙනවා. ඕනෑම තැනකදී. මනුෂ්‍යයින් විධියට ඒක ස්වභාවිකයි. ඉතින් ඒ නිසා ඒවා ගැන අපට කථා කරන්න අවස්ථාවක් හදා දීම ගැනත් අපි සතුටු වෙනවා. (බාධා කිරීමක්) ගරු ශ්‍රීනාත් මන්ත්‍රීතුමා, ඔබතුමාට ඕනෑ නම් මම විනාඩියක් හරි දෙන්නම් කථා කරන්න. බාධා කරන්න එපා. ඔබතුමාට මම කිසිම බාධාවක් කළේ නැහැ. කථා කරන්න ඕනෑ නම් කියන්න. දෙන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමිය කථා කරන්න. කාථාවට බාධා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ කථාවට බධා කළේ?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔබතුමාට මම බාධා කළේ නැහැ. කරුණාකරලා කියන්න. ඕනෑ නම් වෙලාව දෙන්නම්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කාන්තා හිංසනය සිදු කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාවට බාධා කරන්න එපා. ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය එහෙට කථා කරන්න යන්න එපා. ඔබතුමියගේ අදහස් මූලාසනයට ඉදිරිපත් කරන්න.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාන්තාවක් විධියට මම මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වීම පිළිබඳව මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව කථා කරන්න ගියොත් මේක වළක්වා ගන්නේ කෙසේද? කියලා මගෙන් යෝජනා කිහිපයක් තිබෙනවා. අපට අවශ්‍යතාවය තිබෙන්නේ ඒකයි. මම දකින එක දෙයක් තිබෙනවා. අපේ රටේ කාන්තාවෝ පිටරට යෑම තුළ ඒ පවුල්වල දරුවන්, මහත්වරුන් මත්ද්‍රව්‍යයට, මත්කුඩුවලට ඇබ්බැහි වෙලා තිබෙනවා. අපි රජයක් විධියට, මහජන නියෝජිතයන් විධියට, පක්ෂ විපක්ෂ දෙකෙන්ම එකතු වෙලා මේ මත්ද්‍රව්‍ය නතර කරන්න ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. ඒක එකක් ලෙස මම දකින්නේ. අද අපේ රටේ ආර්ථිකය කඩන් වැටිලා තිබෙනවා. කඩන් වැටෙන්න හේතුවක් තමයි මත්ද්‍රව්‍යට ඇබ්බැහි වීම. අපට හරිම පහසුයි, විපක්ෂයේ සිට රජයට ඇඟිල්ල දික් කරන්න. හැබැයි, ඒ අය දන්නේ නැහැ, එක ඇඟිල්ලක් දික් කරනකොට ඇඟිලි හතරක් තමන්ට එල්ල වෙන බව. මහජන නියෝජිතයන් විධියට අපට කරන්න තිබෙන්නේ යෝජනාවක් ගෙනාවාම, ඒ යෝජනාවට කරන්න ඕනෑ මොකක්ද කියන එක ගැන කථා කිරීම මිසක්, හැම තිස්සේම චෝදනා කරන එක නොවෙයි. අපි හෘදය සාක්ෂියට එකඟව කථා කරන්න ඕනෑ. අපි මන්ත්‍රීවරු විධියට මේ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මොනවාද කරලා තිබෙන්නේ? අපි මහජන නියෝජිතයන් විධියට. හැම තිස්සේම එක එක්කෙනාට ඇඟිල්ල දික් කරනවා වෙනුවට අපි කරලා තිබෙන කාර්ය භාරය ගැන හිතන්න. මත්ද්‍රව්‍ය නිවාරණය ගැන කරලා තිබෙන වැඩ සටහන් මොනවද කියලා තම තමන්ම හිතලා බලන්න.

ඒ වාගේම මම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. අපි ඩෙංගු මර්දනය ගැන කථා කරනවා. යෝජනා ගේනවා. නමුත් අද අපේ රටේ ඩෙංගුවලට වඩා වැඩි වසංගතයක් බවට මත්ද්‍රව්‍ය පත් වෙලා තිබෙනවා. අපේ රජයෙන් ලොකු වැඩ කොටසක් කරගෙන යනවා. ඒ වාගේම මම ඉල්ලා සිටිනවා. ඩෙංගු වාගේම මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ සටහනක් මින් ඉදිරියට මන්ත්‍රීවරු විධියට අපට කරන්න ඉඩ දෙන්න

[ ගරු නිරෝෂා අතුකෝරල ]

කියලා. ඒ වාගේම රටේ ආර්ථිකය ගත්තොත් එහෙම, මේ රටේ ආර්ථිකය විශාල වශයෙන් කඩා වැටිලා තිබෙන්නේ මේ මත්ද්‍රව්‍ය නිසා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ආ ...... ඒක තමයි.

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

මම කියන එක අහන්න ගරු මන්ත්‍රීවරුනි. ඒකට හේතුව මේ රටේ දුප්පත් සහ පොහොසත් කියන හැම කොටසකම මිනිස්සු වැඩියෙන්ම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබෙනවා. දුප්පත් පවුල්වල අය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබෙනවා. ඒ වාගේම (බාධා කිරීම්) පොහොසත් පවුල්වල මහත්වරු, නෝනාවරු දෙගොල්ලෝම මේ මත්ද්‍රව්‍යයවලට ඇබ්බැහි වෙලා තිබෙනවා. අපි දළ වශයෙන් ගත්තොත් මේ රටේ ආර්ථිකය කඩා වැටෙන්න එක හේතුවක් - දළ වශයෙන් ගත්තොත් දුප්පත් පවුලක පිරිමි කෙනෙක් දවසකට සිගරට් 10 ක් බිව්වොත් මාසයකට රුපියල් 8400/- ක් යනවා. ඒ වාගේම සතියකට එක බෝතලයක් බිව්වොත් රුපියල් 1200/- යි. සති 04 ට රුපියල් 4800/- යි. රුපියල් 12400/- ක්. තමන්ගේ පවුලේ ආර්ථිකය අනිවාර්යයෙන් කඩා වැටෙනවා. අපි හැමතිස්සේම අනික් අයට ඇඟිල්ල දික් කරන්න ඉස්සෙල්ලා අපේ ආර්ථිකය හදා ගන්නේ කොහොමද කියන එක ගැන යෝජනා අනිවාර්යයෙන්ම ගෙනෙන්න ඕනෑ. ඉතින් ඒ නිසා අපේ පාසල් දරුවන්ගේ සිට සිදුවන මේ මත්ද්‍රව්‍යයෙන් සිදුවන විනාශය ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ඒවා කරමින් යනවා. මම ඉල්ලා සිටිනවා, තවත් මේවාට ඇබ්බැහි වන තත්ත්වය නැති කරන්න නම්, අපි අනිවාර්යයෙන්ම මේ ගැන මීට වැඩිය තව සාකච්ඡාවට භාජනය කරන්න ඕනෑය කියලා. අපි හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, ලෝකය දියුණු වෙනකොට, රටක් දියුණු වෙන කොට විවිධ විෂ බීජ රටවල් තුළට ඇතුල් වෙනවා. ඒක ස්වභාවිකයි. ඒක නැති කරන්න මන්ත්‍රීවරු විධියට, මහජන නියෝජිතයන් විධියට අපට යුතුකමක් තිබෙනවා, විවිධ යෝජනා ගෙනැල්ලා ඒවා සම්මත කරගෙන මේ සමාජය වෙනුවෙන් යමක් කරන්න.

විශේෂයෙන් අපි මන්ත්‍රීවරු විධියට, අප මහජන නියෝජිතයන් විධියට මේ පළාත් සභාව තුළ ඒ අය වෙනුවෙන් අපි වැඩ සටහනක් කරන්න ඕනෑ. අපට ඩෙංගු වාගේ යම් වැඩ පිළිවෙළක් ලබා දෙන්න, මේ මත්ද්‍රව්‍ය මර්දනය කිරීමට. ඒ වාගේම මම ඉල්ලා සිටිනවා. පාසල් දරුවන්ට අවස්ථාවක් ලබා දෙන්න. අපි රජයට ස්තුතිවන්ත වෙනවා. මොකද, අද මේ රටේ කඳවුරු තිබෙනවා. මත්ද්‍රව්‍ය භාවිතා කරන අය ඉන් නිදහස් වෙන්න මේ රටේ කඳවුරු තිබෙනවා. අපි ඒවා පාලනය කරන්න, මතට තිත හරහා මේ රටේ විශාල නිවාරණ වැඩ කොටසක් කරගෙන යනවා. මේවා මර්දනය කිරීම ගැන අපි විශාල වශයෙන් සතුටු වෙනවා. ඒ වාගේම අපි ඉල්ලා සිටිනවා, යම් වැඩ සටහනක් අපට ලබා දෙන්න. ඒ වාගේම මේ සියලුම අයට යම් වගකීමක් තිබෙනවා, මත්ද්‍රව්‍ය නැති කරන්න, මිනිස්සුන්ගෙන් තුරන් කිරීමට මතයක් ගෙනෙන්න. මත්ද්‍රව්‍යට ඇබ්බැහි වුණු, එක දවසක් හරි මත්ද්‍රව්‍ය ගත්ත කෙනෙකුගේ අදහසක් තිබෙනවා, අපි එක දවසක් බිව්වොත් හැමදාම බොන්න ඕනෑ කියලා, මේ සමාජයේ මතයක් මිනිස්සුන්ට හදලා තිබෙනවා. මේ මතය මිනිස්සුන්ගෙන් නැති කරන්න ඕනෑ. මොකද, ඒක මතයක් පමණයි. එක දවසක් බිව්ව කෙනා හැමදාම බොන්නේ නැහැ. අපි ඉස්සෙල්ලාම කන්ටේනර් ගණන් අල්ලනවා. අපට තවත් දෙයක් කරන්න තිබෙනවා. මත් ද්‍රව්‍ය අල්ලන්න අපේ රජය ලොකු වැඩ පිළිවෙළක් කරනවා. අද මෙතුමන්ලාට කථා කරන්න පුළුවන්. නමුත් අපේ පොඩි අඩුවක් තිබෙනවා. මේ මත්ද්‍රව්‍යවලට වෙන දේත් සමාජයට වැඩි වැඩියෙන් විශ්වාසවන්තව පෙන්වන්න ඕනෑ. මිනිස්සු වෙන දේ දන්නේ නැහැ. වෙන දේ පෙන්නලා පොලීසිය ගැන විශ්වාසයක් ගොඩනඟන්න ඕනෑ. අද පොලිසිය නැතිව මේ රටේ කිසි දෙයක් කරන්න බැහැ. එක දවසක් පොලිසියට නිවාඩු දුන්නා නම් තේරෙයි රටේ පොලිසියේ වටිනාකම කොච්චරද කියන එක. අපි මිනිස්සු විධියට මෙය පාලනය කරන්න නම් ඒ විශ්වාසය ගොඩනඟන්න ඕනෑ. ඉතින් මේ අවස්ථාව ලබා දීම ගැන ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. සියලුම දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

[ අ.භා. 12.54 ]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා යෝජනාව ගෙන ඒම ගැන බොහොම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඉතාම අමාරුවෙන් ගෙනාපු යෝජනාවක්. ඔබතුමා දකින්න ඇති මේ යෝජනාව විවාදයට ගත්තු මොහොතේ සිටම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අර නයාට අඳුකොළ වාගේ, භූමිතෙල් ගැවුණු ගැරඬියා වාගේ නලියන්න පටන් අරගෙන තිබෙන්නේ. මේ යෝජනාව සහා කටයුතු එකට දැම්මාට පස්සෙත් මෙහෙම්මම තමයි වුණේ. මේකේ වචන ගොඩක් වෙනස් කරන්න උත්සාහ කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක මේ ආණ්ඩුවට විරුද්ධව ගෙනෙන ලද යෝජනාවක් නොවෙයි. ඔබතුමන්ලා එහෙම ගන්න එපා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

අපි දන්නවා ඒක.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

අපි මෙහි කියලා තිබෙන්නේ මොකක්ද? මෙම සියලු තත්ත්වයන්ට රජය වගකිව යුතු අතර - Right. දැන් ඔබතුමා කියනවා නේ මැදිහත් විය යුතු අතර කියලා. කමක් නැහැ. අපි කියන්නේ, මේ රාජ්‍ය යාන්ත්‍රණය දැන් ජාතික ගැටලුවක් බවට පත් වෙලා තිබෙන මේ කුඩු වසංගතය මර්දනය කරන්න පියවර ගමුයි කියලා. දැන් බලන්න, දිය කිරට බළල්ලුත් සාක්ෂි වාගේ දැන් මේ ගරු මන්ත්‍රීවරු මේ යෝජනාවේදී ඇයි මෙතරම් විරෝධයක් ප්‍රකාශයට පත් කරන්නේ. මම දන්නවා, ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු 56 න් 98% ක්, ඔබතුමන්ලා මේ පළාත් සභා ඡන්දය ජයග්‍රහණය කළේ, කුඩු සල්ලිවලින් නොවෙයි. ඔබතුමන්ලා පෝස්ටර් ගැහුවේ, රැස්වීම් තිබ්බේ, එහෙම නැත්නම් ඡන්ද ව්‍යාපාරය කළේ කුඩු ජාවාරම්කාරයින්ගේ සල්ලිවලින් නොවෙයි. නමුත් එහෙම වෙලා තිබෙනවා. මම හොඳටම දන්නවා අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා එහෙම, එතුමා කුඩු ජාවාරම්කාරයන්ගේ තියා කසිප්පුකාරයන්ගෙන්වත් සල්ලි අරගෙන නොවෙයි ඡන්ද ව්‍යාපාරය කළේ. හැබැයි, එහෙම තිබෙද්දීත් ඇයි? ඔබතුමන්ලා මේ කුඩු ජාවාරම්කාරයන් වෙනුවෙන් මෙතරම් තදින් පෙනී සිටින්නේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද? කවුද?

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඔබතුමා නේ පෙනී සිටින්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

අහගෙන ඉන්න. පොඩ්ඩක් කියාගෙන එන අතරේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

සම්පූර්ණ වැරැදියි නේ ඔබතුමා කියන එක. කවුද පෙනී සිටියේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඔබතුමන්ලාගේ හිතේ අනියත සැක සංකාවක් තිබෙනවා, මේ කුඩු ජාවාරමට රටේ ඉහළම දේශපාලන අධිකාරියේ සම්බන්ධයක් තිබෙනවා කියලා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

අන්න ඒ සැක සංකාව තමුන්නාන්සේලාගේ ඔළුවේ වැඩ කරනවා. ඒ නිසා මේකට නිදහසේ යන්න දෙන්න භයයි. මේක නිදහසේ ගලාගෙන යන්න දෙන්න භයයි. නිකන් කල්පනා කරලා බලන්න. දැන් මේ කුඩු ජාවාරම ප්‍රමාණාත්මකව ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ගුණාත්මක පිම්මක් පැනලා තිබෙනවා. ගුද මාර්ගයේ ආපු කුඩු ගුදම් මාර්ගයෙන් එන්න පටන් ගත්තේ කොයි කාලයේද? ග්‍රෑම් ගණන්වලින් ආපු කුඩු, කිලෝ ගණන් ආවේ කොයි කාලයේද?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒ 77 න් පස්සේ. දැන් තමයි අල්ලන්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

එදා කන් හැන්දෙන් ගහපු කුඩු දැන් කිලෝ ගණන් අහුවෙන්න පටන් ගත්තේ කොයි කාලයේද? කුඩු ජාවාරම්කාරයන් ගෙනාපු කුඩුවලට අග්‍රාමාත්‍ය සම්බන්ධීකරණ ලේකම්වරයා ලියුම් දෙන්න පටන් ගත්තේ කොයි කාලයේද? මේ ආණ්ඩුව කාලයේ. එක්සත් ජාතික පක්ෂය 1977 විවෘත ආර්ථිකය පටන් ගත්තාට පස්සේ කුඩු එන්න පටන් ගත්තා තමයි. හැබැයි, ඒ කාලයේ කොහොමද තිබුණේ? ඒ දවස්වල තිබුණා -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒ කාලයේ ලියුම් නැතිව පිට කළා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

අහගෙන ඉන්න කෝ. තමුන්නාන්සේට මතක ඇති ඒ කාලයේ තිබුණා, පළිඟු මැණිකේ කියලා ටෙලි නාට්‍යයක්. ඔය පළිඟු මැණිකේ ටෙලි නාට්‍යයේ සූරසේන අර සූට්කේස් එකේ පල්ලෙහා කුඩු ගෙනැල්ලා තමයි පෝසතෙක් බවට පත් වුණේ. එහෙම සංස්කෘතියක් තිබුණු රටක්. හැබැයි දැන් මහා පරිමාණ කුඩු ජාවාරම්කාරයන් බවට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ, මේ කුඩු ජාවාරම නතර කරන්න බැරි ඇයි? මේ කුඩු කිලෝ 261 ක් එද්දී (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අර පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා ඉන්න පුටුව හරිද? පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා නියමිත පුටුවට යන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නියෝජ්‍ය සභාපතිතුමාට කියන්න කොන්ද පණ නැහැ පුටුවට යන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. හරි. ඒක අපි බලාගන්නම්. ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්නය අපි ජාතික ප්‍රශ්නය ලෙස ගන්න ඕනෑ. මේකෙන් විනාශ වන්නේ අපේ තරුණයන් හා ශිෂ්‍ය පරම්පරාවයි. ඒ නිසයි මේක මර්දනය කරන්න ඕනෑකම තිබෙන්නේ. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ මේ ගම්වල කුඩු ගහන කොල්ලෙක් දෙන්නෙක් අත්අඩංගුවට අරගෙන ගිහිල්ලා පොලිසියේ කුඩුවේ දාලා ඇට දෙක තලනවා වෙන්න පුළුවන්. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ කුඩු ජාවාරම්කාරයන් අත්අඩංගුවට ගන්නේ නැහැ. එහෙම අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ කවද්ද? කුඩු කිලෝ 261 ක් අහුවුණා. කුඩු කිලෝ 261 ක් කියලා කියන්නේ පාන්පිටි මුට්ට 5 1/2 ක්. මොකක්ද කළේ? මොකක්වත් කළේ නැහැ. මතක තියාගන්න. මම කියන්නේ ඒකයි. අගමැතිවරයා කුඩු ජාවාරමට සම්බන්ධ නැහැ. සම්බන්ධ නැහැ. හැබැයි, ඇයි? අගමැතිට කුඩු ජාවාරම්කාරයා කියලා පහර දෙන්න ඉඩ දීලා ආණ්ඩුව බලාගෙන සිටියේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 13 වැනි සාමාජිකයා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයා. එතුමා නොවෙයි ලියුම දුන්නේ. එතුමාගේ ලේකම්වරයෙක්. හැබැයි, එතුමාගේ ලේකම් දුන්නු ලියුමට රටේ ඉන්න ලොකුම කුඩු ජාවාරම්කාරයා බවට අගමැතිවරයාව පත් කළා. කාව ආරක්ෂා කරන්නද? කල්පනා කරලා බලන්න. අගමැතිට මඩ ගහන තුරු, අගමැති කුඩු ජාවාරම්කාරයෙක් කරන තුරු ඒකට ආණ්ඩුව ඉඩ දීලා බලාගෙන සිටියේ, ඊට වඩා ලොක්කෝ කුඩු ජාවාරමට සම්බන්ධයි. ඒ ගොල්ලෝ ආරක්ෂා කරන්න. මම ඔබතුමන්ලාගෙන් අහන්නේ, ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න. අපේ රටේ අධීක්ෂණ මන්ත්‍රීවරු ඉන්නේ මොන අමාත්‍යාංශවලටද? අධ්‍යාපන අමාත්‍යාංශයට අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් ඉන්නවාද? නැහැ. මුදල් අමාත්‍යාංශයට.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඉන්නවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

කවුද? කවුද?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

නැහැ. ශ්‍රේරු නැහැ. ශ්‍රේරු නියෝජ්‍ය ඇමැති. දන්නේ නැත්නම් කථා කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අයියෝ ඒක දන්නෙත් නැහැ තවම.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

වැඩක් නැහැ. වැඩක් නැහැ. මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රී කවුද? මහා මාර්ග අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රී කවුද? කවුරුත් නැහැ. ඉන්නවා දෙන්නෙක්. එක්කෙනෙක් විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රී. සජින් වාස් ගුණවර්ධන මන්ත්‍රීතුමා. මේ දවස්වල වුණු සිද්ධිය දන්නවා නේ? ඊළඟට ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රී. ඉන්නේ දෙන්නයි. මේ අධීක්ෂණ මන්ත්‍රීකම් දීලා තිබෙන්නේ මොකටද? කල්පනා කරලා බලන්න. පසුගිය කාලයේ ජනමාධ්‍ය වාර්තා කරනකොට, බොහෝ ජාවාරම්වලට ඒ අයගේ නම ගැවිලා ගියා. ඒ විතරක් නොවෙයි. මම කියන්නම්. මාළිගාවත්තේ උසාවියේ කුඩු කිලෝ 08 ක් ළඟ තියාගෙන හිටපු වැරැදිකාරයන් දෙන්නෙක් ඔප්පුවෙලා තිබෙද්දී නිදහස් කළා. කුඩු කිලෝ 08 ක් තියාගත්ත දෙන්නෙක්. පොල් ගෙඩි 08 ක් හොරකම් කළා කියලා දැරිවියක් උසාවි දාලා රුපියල් 25,000/- ක් දඩ ගහපු රටක්. කුඩු කිලෝ 08 ක් තියාගෙන සිටියා. නිදහස් කළා. නිදහස් කරන්න කියලා කවුද කිව්වේ? නීතිපතිවරයා. නීතිපතිවරයා අයිති කාටද? නීතිපති දෙපාර්තමේන්තුවට. නීතිපති දෙපාර්තමේන්තුව අයිති කාටද? ජනාධිපතිතුමාට. ජනාධිපතිතුමාගේ යටතේ තිබෙන නීතිපති දෙපාර්තමේන්තුවෙන් කුඩු කිලෝ 08 ක් තියා ගත්ත අය නිදහස් කරන්න කිව්වා.

ඒ විතරක් නොවෙයි. කුඩුවලට එරෙහිව පසුගිය කාලයේ විශේෂයෙන් මේ රටේ දෙරණ නාලිකාව "කුඩුවලට එරෙහිව දෙරණ" කියලා ප්‍රවෘත්ති විකාශනය වෙන්න පටන් ගත්තා. ප්‍රවෘත්ති. කොලොන්නාවේ කුඩු ගැන කිව්වා. මීගමුවේ කුඩු ගැන කිව්වා. මීගමුවේ කුඩු ගැන කියන කොට දෙරණින් කිව්වා, මේ බස්නාහිර පළාත් සභාවේ ඇමැතිවරයෙක් සම්බන්ධයි කියලා. මම ගරු මහ ඇමැතිවරයාට කිව්වා, ඔබතුමා නියෝජනය කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කය. ඔබතුමා පරීක්ෂණය කරලා මෙය නිවැරැදි කරන්නය කියලා. මෙය පළාත් සභාවටත් අපවාදයක් කියලා. එදා ඒක කියලා ගෙදර යනකොට මොකද? කුඩුවලට එරෙහිව දෙරණේ ඒ වැඩ සටහන අවලංගුයි. තහනම්. අවලංගුයි. දැන් එදා ඒ කියපු ප්‍රවෘත්තියම, එදා මීගමුවේ වැසියෙක් දෙරණ නාලිකාව ඉස්සරහාට ඇවිල්ලා කියපු ප්‍රවෘත්තියම, ඒ තොරතුර සරත් කුමාර ගුණරත්න ධීවර නියෝජ්‍ය ඇමැතිතුමා ඒ වචනවලින්ම කියනවා. ඔහු කියනවා. මොකක්ද? අද සමහර දේශපාලඥයන් -

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

පත්තරවල ඒවා කියන්න එපා ගරු මන්ත්‍රීතුමා. ඔය පෞද්ගලික තරහට දාන්නේ. පෞද්ගලික ප්‍රශ්න මෙතැනට ගෙනෙන්න එපා. පත්තරවල තිබෙන ඒවා. ඒවා දේශපාලන තරහවල්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා නීතිය පොඩ්ඩක් ඉගෙන ගෙන එන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

අපි හිතනවා මේක පව පත්තරයක් නොවෙයි. මේක මඩ පත්තරයක් නොවෙයි. එතුමාත් ඒ කථාවම කියනවා නේ. අපි කියන්නේ, ඔබතුමා නොවෙයි. මේ අවුරුදු ගණනක් පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රී කෙනෙක්. ධීවර නියෝජ්‍ය ඇමැති. මීගමුව ආසනයේ සංවිධායකයා.

[සභාවේ ඝෝෂා]

පෞද්ගලිකයි කියලා -

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

අද ඔය කියන ඇමැතිවරයා හොරට දින්නේ. මගේ ඡන්ද ටික අරගෙන. සරත් කුමාර දින්නේ නැහැ පාර්ලිමේන්තුව. මමයි දින්නේ. මගේ ඡන්ද ටික ගත්ත ඇමැතිවරයා තමයි ඔය කියන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන් වෙනවා. ඔබතුමා කථා කරන්න. තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂය විධියට කියනවා නම්, මේ සරත් කුමාර ගුණරත්න ගරු ඇමැතිතුමා බොරු කියන්නේ. පුද්ගලික මඩ ප්‍රහාරයක් කියලා. අපි පිළිගනිමු. ප්‍රශ්නයක් නැහැ. අපි කියන්නේ බස්නාහිර පළාත් සභාවේ ඇමැතිවරයෙකුට හෝ මන්ත්‍රීවරයෙකුට විශේෂයෙන් කුඩු ජාවාරම සම්බන්ධයෙන් චෝදනාවක් එල්ල වෙලා තිබෙනවා නම් ඒ ගැන මොකක් හරි පරීක්ෂණයක් කරලා එයා එහෙම නැහැයි කියන එක අපේ යුතුකමක්, වගකීමක් නේද? අපි හිතන්නේ නැහැ, ඔබතුමන්ලාගේ ඇමැතිවරු කවුරුවත් මේ කුඩු ජාවාරම්වලට සම්බන්ධයි කියලා. අපි එහෙම හිතන්නේ නැහැ. මොකද තවම Wikileaks එකකවත්, කොහෙවත් හෙළිදරව් කරලත් නැහැ. එහෙම හෙළිදරව් කරපු අයත් ඉන්නවා නේ? Wikileaks එකේ කිව්වා නේ? මාලක සිල්වා Ecstacy ගෙන්වන්නේ එයා කියලා. මර්වින් සිල්වා ඇමැතිතුමාගේ පුතා. දන්නවා නේ. ඒ කේබල් පණිවිඩය අපි ළඟ තිබෙනවා. එහෙම තමයි. මම කියන්නේ අපි හැමදෙනාම එකතු වෙලා -

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක මේ කාටවත් පුද්ගලිකව මඩ ගහන්න ගෙනාපු යෝජනාවක් නොවෙයි. මේ රට පත් වෙලා තිබෙන බරපතළ වසංගතයක්. අපි හැමදෙනාටම පුළුවන්නම් මේ යෝජනාව ඒකඡන්දයෙන් සම්මත කරලා බස්නාහිර පළාත් සභාව කොන්දේසි විරහිතව කුඩු ජාවාරම්කාරයින්ට විරුද්ධයි කියන්න. ඒක තමයි මේ පළාත් සභාවේ අපි ගන්න ඉහළම ජයග්‍රහණය. ඒ නිසා කරුණාකරලා තමුන්නාන්සේලා, මේ අපේ ජ්‍යෙෂ්ඨ ඇමැතිවරු වාගේ පසුපෙළ ගරු මන්ත්‍රීවරු කරුණාකරලා මේ කුඩුකාරයින්ට උදව් කරන්න, කුඩු ජාවාරම්කාරයින්ගෙන් ලකුණු ගන්න, කුඩු ජාවාරම්කාරයින්ගෙන් මොනවා හරි සන්තෝෂම් ගන්න බලාගෙන කෑ ගහන්න එපා. මේකට උදව් කරන්න එපා කියමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමාට විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා.

[සභාවේ ඝෝෂා]

[ අ.භා. 01.05 ]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශ්ශබ්ද වන්න. ගරු ඇමැතිතුමා, කථාව ආරම්භ කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉස්සර නම් අපි දන්න කාලයේ මම හිතන්නේ, හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ පියාණන්ගේ කාලයේ වාගේ, එහෙම නැත්නම් අපි පාසල් යන කාලයේ ඉස්සර ආණ්ඩු පෙරළියකදී මන්ත්‍රීතුමන්ලාට දෙන්න, එහෙම නැත්නම් ටිකක් හොඳට කැප වෙලා වැඩ කරපු ප්‍රබල ආධාරකරුවන්ට දෙන්න තියාගත්ත තෑග්ග තමයි මත්පැන් බලපත්‍රය. යූ.ඇන්.පී ආණ්ඩුව කාලයේත්, යූ.ඇන්.පී. ආණ්ඩුව දිනුවාම දෙන්න තිබෙන හොඳම තෑග්ග තමයි මත්පැන් බලපත්‍රය. වෙනත් ආණ්ඩුවක් ආවත් එහෙම තමයි. මත්පැන් බලපත්‍රය දුන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු ඇමැතිතුමා, වෙනත් ආණ්ඩු කියලා කියන්න එපා. අපේ ආණ්ඩුව කියලා කියන්න. මොකක්ද වෙනත් ආණ්ඩු? මේ රටේ වෙන කවුරුත් ආණ්ඩු හැදුවේ නැහැ නේ? ඔබතුමන්ලයි අපියි හැදුවේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාගේ ආණ්ඩුවද?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු ඇමැතිතුමා කියනවා, යූ.ඇන්.පී ආණ්ඩුව කාලයේ දුන්නාය කියලා. ඊට පස්සේ කියනවා වෙනත් ආණ්ඩු කාලයෙත් දුන්නා කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා. ගරු ඇමැතිතුමා කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට ගිය පළාත් සභාවේදී කිව්වා, සුසිල් ඔයගොල්ලෝ කොච්චර තප්පලැච්චත් ඌවේදී ඔයගොල්ලන්ට ලැබෙන ප්‍රතිඵලය මම මෙතැනදී කියලා යවන්නම් කියලා. ඉතින් බලන්න. ඌවේදී ලැබුණු ප්‍රතිඵලය සුසිල් දන්නවා නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ ප්‍රතිඵලය ගැනද ඔබතුමාට අමාරු. 20% ක් අඩු වුණු එක ගැන කථා කරන්න කෝ. ඔබතුමා අපේ ප්‍රතිඵලය ගැන අහන්නේ. 20% ක් අඩු වුණේ ඇයි? ඡන්ද ගන්න බෙදපු ටිකත් කියන්නම්. ඡන්ද හොරකම් කරපු හැටිත් කියන්නම්. ඡන්ද කොල්ල කාපු හැටිත් කියන්නම්. ඒවාත් අහ ගන්න එපා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සද්දේ තරමට වැඩ නැහැ.

[සභාවේ ඝෝෂා]

මට පොඩ්ඩක් කථා කරන්න දෙන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කුඹියාට උගේ මූත්‍ර ගංගාවක් වාගේ කියලා ප්‍රස්ථා පිරුළක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමියට මූත්‍ර බරද?

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු ඇමැතිතුමා, එළියේ වහිනවා. සීතලයි. ඒකයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මගෙන් වරදක් වුණා නම් සමාවෙන්න. මට බාධා කරන්න එපා. මම මේ කියන්නේ, කුඹියාට මූත්‍ර ගියාම ඌට ගංගාවක් වාගේ පේනවා. මේ ඌවේ පොඩි ත්‍රිලක් ආවාම කුඹියාට උගේ මූත්‍ර ගංගාවක් වාගේ මේක ඒ අයට මහ ලොකු ජයග්‍රහණයක් වෙලා. ප්‍රේමදාස ජනාධිපතිතුමා නොවෙයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා නොවෙයි. කවුරු ආවත් තව අවුරුදු 10 කට, 15 කට මේ ආණ්ඩුව හොල්ලන්න බැහැ කියන එක මතක තියාගන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

හොල්ලන්නේ නැහැ. එළියට දානවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තමුන්නාන්සේලා පිට පොට ගහගන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, මට ඔබතුමාගේ යෝජනාවට සාධාරණත්වය ඉෂ්ට කරන්න දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කුඹි ගැන නේ කථා කරන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ෆයිරුස් ගරු මන්ත්‍රීතුමා, මේ රටේ ගුදම් එන්නේ ඔබතුමන්ලා හරහා. අපි බඩු ගේන්නේ නැහැ. සීනි ගේනවද? අල ගේනවද? පරිප්පු ගේනවද? රට ළූණු ගේනවද? දෙවැනි, හතරවැනි හරස් වීදියේ බඩු තමයි ගෙනෙන්නේ. කුඩු ගේන්නෙත් ඒ ගුදම්වල. වෙළඳ ව්‍යාපාරිකයෝ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කුඩු ගේන කට්ටිය වෙනමයි. බඩු ගේන කට්ටිය වෙනමයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කුඩු වෙනයි. බඩු වෙනයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැබැයි සමහර අය කුඩුයි, බඩුයි දෙකම ගේනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට කථා කරන්න දෙන්න. දැන් ඒ නිසා මම කියන්න හැදුවේ යූ.ඇන්.පී. ආණ්ඩුවෙනුත් දුන්නා. අපේ ආණ්ඩුවෙනුත් දුන්නා මේ මත්පැන් බලපත්‍ර.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු ඇමැතිතුමා, මේ තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා වැදගත් මන්ත්‍රීවරයෙක් කියලා මම හිතුවා ගිය සභා වාරයේදී. ඔය වැදගත්කම නැති කරගන්න එපා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මේකේ තිබෙන විධිය.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා වැදගත් කෙනෙක් කියලා මම විශ්වාස කළා. ඔබතුමා මට බාධා කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

බාධා කරන්න එපා. ඒ කාලයේ ආණ්ඩු දෙකෙන්ම බලපත්‍ර දුන්නා. මතට තිත තියලා එකම මන්ත්‍රීවරයෙකුටවත් එකම බලපත්‍රයක්වත් දුන්නේ නැහැ, අපේ අතිගරු ජනාධිපතිතුමා පත් වුණාට පස්සේ කියලා මම බොහොම ආඩම්බරයෙන් කියනවා. ඒ නිසාවෙන් එක මන්ත්‍රීවරයෙකුටවත් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කුඩු බලපත්‍ර දීලා තිබෙන්නේ. මදැයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මතක තියාගන්න. ඉස්සර තිබුණේ හර්ෂණ රාජකාරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, LSD, මර්ජුවානා, අෂිස් වාගේ දේවල්. 1977 විවෘත ආර්ථිකය ආපු කාලය අපි මතක තියා ගන්න ඕනෑ. විවෘත ආර්ථිකය ගොඩනැඟුනු කාලයේ තමයි මේ මහා විනාශය වුණේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවුරුදු 20 ක්ම වූ ගැන කථා කර කර ඉන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පිටරටින් කුඩු විතරක් නොවෙයි. ඔක්කොම දේවල් ගෙනාවා. කුඩු ආවෙත් එහෙම තමයි. ඒ කුඩු ආපු ප්‍රවනතාවය තමයි අද වැඩි වෙලා තිබෙන්නේ. ඒ නිසා ජාත්‍යන්තර වශයෙන් මහා විශාල ජාලයක් කුඩු සම්බන්ධව තිබෙනවා. ඒ නිසාවෙන් අද මේ තරම් කෑ ගහන්න, මේ තරම් පෙනෙන්නේ, මේ තරම් දකින්නේ කුඩු අල්ලන නිසාවෙන්. ඔය අල්ලන කුඩු හැම එකක්ම විනාශ කරන්න

කියලා නීතිමය බලයක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. මම අහලා තිබෙනවා, අපරාධ විධිවිධාන සංග්‍රහය යටතේ නඩුවක් අවසන් වන තෙක් මේ කුඩු B Report එකක් හැටියට අධිකරණය යටතේ තබා ගන්න සිද්ධ වෙනවා කියලා. ඒ නිසා කුඩු විනාශ කරනවාද නැද්ද කියන එක, අධිකරණ භූමියේ හලනවාද නැද්ද කියන ඒවා විහිළු කථා. අද මේ අභියෝගය අපි ජයගන්නට ඕනෑ. මම හරි සන්තෝෂයි. හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මේ ගෙනෙන ලද යෝජනාවට. මොනවා ගෙනාවත් සංවිධායකතුමා එකක් තිබෙනවා. කිරි කළයක් දොවලා ගෙනැල්ලා ඔබතුමා මෙතැන තිබ්බත් මේකට ගොම දාන තුන් හතර දෙනෙක් ඔබතුමාගේ පැත්තේ ඉන්නවා. මොනවා කෙරුවත් වැඩක් නැහැ. මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා ඔබතුමා මොනතරම් වැදගත් යෝජනාවක් ගෙනාවත් වැඩක් නැහැ. අර ඉල් මැස්සා කියලා එකෙක් මම අහලා තිබෙනවා. අර පතෝලවලටද මොනවාටද විදින්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් කූඹියා ඉවරද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඉල් මැස්සා. හරි. ඒ නිසාවෙන් ඔබතුමන්ලා මොනතරම් හොඳ යෝජනාවක් ගෙනාවත් ටිකක් දුර යනකොට එක්කෝ JVP එකේ එක්කෙනෙක්, ඉල්මැස්සෙක් මේකට විදිනවා. නැත්නම් තමන්ගේම එක්කෙනෙක් විදිනවා මේකට. හැබැයි, මම හරි කනගාටු වෙනවා. මීගමුවේ අලුතින් ආපු මන්ත්‍රීතුමා අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට වැඩිය මනාප ගත්තා කිව්වාම මම කල්පනා කරලා බැලුවා මෙච්චර හැඩකාර, කටකාර ඉලන්දාරියාව යට කරගෙන අර හාදයා මනාප අරගෙන නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හොඳයි නේ. ඒ හාදයා ඔබතුමාගේ ඇමැතිවරයාටත් වැඩිය අර ගත්තා. ඒකත් කියන්න.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමා, එතුමා ප්‍රකාශ කළා වැඩිපුර ඡන්ද ගත්තා කියලා එක්සත් ජාතික පක්ෂයෙන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට වඩා වැඩියි නේ?

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

නැහැ. මම වැඩියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට වැඩිය වැඩියි.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මගේ ඇමැතිකමයි, තමුන්නාන්සේගේ මන්ත්‍රීකමයි අභියෝග කරලා ඔට්ටුවක් දාමුද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මොන වරප්‍රසාද යටතේද කථා කරන්නේ.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ මෝඩයා වාගේ ඉඳගන්නවා. අභියෝගය භාරගන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙන්නාම වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොන වරප්‍රසාද යටතේද කථා කරන්නේ.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

36(1) යටතේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඡන්දය ගත්තු හැටි අපි කියලා දෙන්නම්.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

රොයිස් ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේට වඩා ඡන්ද ගත්තා. ඒක පිළිගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු ඇමැතිතුමා, විසිල් ගැහුවාට වැඩක් නැහැ. බල්ටිය ගහන්න ඕනෑ. නිකන් විසල් ගහන්න එපා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මට විනාඩියක් දෙන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමා, 36(1) යටතේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. 36(1) යටතේ කථා කරන්න අවස්ථාව දෙනවා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමා ඉතාමත් පැහැදිලිව ප්‍රකාශ කළේ මීගමුවෙන් මැතිවරණය සඳහා තරග කරපු රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා මෙතුමාට වඩා මනාප ගත්තා කියන එක ගැන තමයි එතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක කවුරුත් දන්නවා. ඔබතුමා කියන්න ඕනෑ නැහැ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

36 (1) යටතේ - කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා වාඩි වෙන්න. 36(1) යටතේ කථා කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකක්ද වරප්‍රසාදය?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වරප්‍රසාදය අහන්න එපැයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙමනම් ඒ වාගේ 36(1) වරප්‍රසාද යටතේ අපටත් කථා කරන්න පුළුවන් නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක අහන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒක තමයි අපි කියන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමාට වරප්‍රසාද කියන්න, මොකක්ද වුණු හානිය?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වරප්‍රසාදය මොකක්ද කියලා ඇහුම්කන් දෙන්න ඕනෑ. ඔබතුමා ඇහුම්කන් දෙන්න, 36(1) යටතේ මොකක්ද වරප්‍රසාද ප්‍රශ්නය කියලා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒක තමයි කියන්න යන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොනවා ගැනද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අහනකම් මම දන්නේ නැහැ නේ මොකක්ද කියලා. ගරු ඇමැතිතුමා කථා කරන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා ඉතාමත් පැහැදිලිව අදහස් ප්‍රකාශ කරද්දී කිව්වා, මීගමුවෙන් ඡන්දය ඉල්ලපු රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා මෙතුමාට වැඩිය ඡන්ද ගත්තා කියන එක දැන ගත්තේ අද කියලා. මෙතුමා ඒ වාගේම පල්ලෙහාට ගියාද කියන එක. එතකොට මෙතුමා කියනවා. නැහැ, නැහැ එතුමා ගැන නොවෙයි කිව්වේ. මම ගැන කියලා. ඒ නිසා තමයි මම 36(1) යටතේ කියන්නේ එතුමා කිව්වේ එක්සත් ජාතික පක්ෂයේ මීගමුවෙන් වැඩිපුර ඡන්ද ගත්තා කියන එක. ආසනයක් විධියට ගත්තාම මම තමා වැඩිම මනාප අරගෙන තිබෙන්නේ. ඒ නිසා තමුන්නාන්සේ තොප්පිය දාගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක කියා ගන්න ඕනෑ වෙලා තිබෙන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔව්. මෙතුමාගේ තාත්තාට පළමුවැනි පාර 24000 යි. මෙතුමාට දෙවැනි පාර 8000 යි. අන්තිම පාර 2000 යි. මීගමුවෙන් එළවලා තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ගරු මන්ත්‍රීතුමා, වාඩි වෙන්න. රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා කථා කරන්න. ඉක්මන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ තාත්තාගේ නම කිව්වා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තාත්තාගේ නම කිව්වේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. නම කිව්වේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තාත්තා කියලා කිව්වා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා අන්ධ, ගොළු, බිහිරෙක් කියලා අපි දන්නවා. ඔබතුමාට නීතිය ක්‍රියාත්මක කරගන්න බැහැයි කියලා අපි

[ගරු ශ්‍රීනාත් පෙරේරා]

දන්නවා. මේ සභාවේ මට එක නීතියක්. මේ අයට එක නීතියක්. ඔබතුමා සභාවේ ඉඳගෙන ඉන්න ඔය පුටුවටත් අගෞරව කරමින් තමයි ඔබතුමා ඔතැන ඉන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ජොෂප් මයිකල් පෙරේරා මහත්මයා 24,000 ක් මනාප ගත්තා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට ඇහෙන්නේ නැහැ.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු මන්ත්‍රීතුමා, අසාධාරණ චෝදනා කරන්න එපා. තමුන්නාන්සේට කිව්වේ, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අවවාද දෙනවා නොවෙයි. මම චෝදනා කරන්නේ.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

රීති කඩ කරමින් කථා කරන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මෙතුමාගේ පියා මීගමුවෙන් ඡන්ද 24,000 ක් ගත්තා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඉස්සෙල්ලා කථාවට ඇහුම්කන් දෙන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ලැජ්ජා නැතිව කථා කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉස්සෙල්ලා ඔබතුමා ඉඳන් ඉන්න පුටුවට සාධාරණයක් කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය වාගේ ගෝඩ් ෆාදර්ලා කිව්වාට අපි වාඩි වෙන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සභාව මේ තරම් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේක විකාර මඩුවක්.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

තමුන්නාන්සේ වග කියන්න ඕනෑ. ඔබතුමාගේ වැරැදි තීන්දු තීරණ නිසා තමයි මේ සභාව මේ විධියට අරන් යන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වැරැදි තීන්දු නොවෙයි.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔය සභාපති පුටුවේ ගෞරවය ආරක්ෂා වන විධියට පක්ෂ විපක්ෂ හැම කෙනෙකුටම සාධාරණ විධියට තීන්දු ගන්න. එතකොට හරි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු විපක්ෂ නායකතුමා, මම -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මම අපේ ගරු මන්ත්‍රීවරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා. අපේ ගෞරවය ආරක්ෂා වන විධියට, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් තමන්ගේ ගෞරවය ආරක්ෂා කරගෙන ඉන්න. එච්චරයි කියන්නේ. අද මේ සභාව කෝලම් මඩුවක් බවට පත් වෙනවා. ඒ පත් වෙන එකේ වගකීම ඔබතුමා හරියට ක්‍රියා නොකිරීමේ හේතුව විධියට මම මතක් කරන්න කැමැතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපේ රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා ඉන්න කොට ඔහොම කථා කළේ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා තමයි මේ සභාවේ මාතෘකාවට පිටින් වැඩියෙන්ම කථා කරන්නේ. වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා නිසා තමයි අපට ඒක කරන්න වෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, විනාඩියක් ඉන්න. ගරු මන්ත්‍රීතුමා ගරු විපක්ෂ නායකතුමා කිව්ව කථාව මම පිළිගන්නවා. නමුත් මන්ත්‍රීතුමන්ලා, ඇමැතිතුමන්ලා අපි කවුරුත් සභාවේ ගරුත්වයක් ඇති වන ආකාරයේ ඒ කථාවට බාධාවක් නොවන ආකාරයට කටයුතු කරන්න සූදානම් වෙන්න ඕනෑ. 36(1) යටතේ තමන්ට වුණු යම්කිසි වරප්‍රසාදයක් ගැන කථා කරන්න නැඟිටිනවා කිව්වාම මූලාසනයෙන් ඒකට ඉඩ දුන්නාම ඒක මොකක්ද? 36(1) යටතේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නයටවත් අපි ඇහුම්කන් දෙන්න කලින් අර ගරු මන්ත්‍රීතුමා කෑ ගහන්න පටන් ගන්නවා. ඉතින් ඒක නිසා කවුරුත් ඒක වගබලා ගන්න ඕනෑ. සභාවේ මූලාසනයේ ගෞරවය රැකෙන ආකාරයෙන්, සභාවේ ගෞරවය රැකෙන ආකාරයෙන් කටයුතු කරන්න. ඒක නිසා රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමාගෙන් මම ඉල්ලනවා, තව ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා. කථාව අවසන් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 67(1) රීතිය අනුව ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාට ආසනයට යන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ආසනයට යන්න. ගරු ඇමැතිතුමා කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ වෙලාව හැමෝම උදුර ගත්තා. මම කෝකිලාටත් ආදරෙයි. රෝස්ට ආදරෙයි මම. මම දෙන්නටම ආදරෙයි. නිරෝෂටත් ආදරෙයි.

[සභාවේ ඝෝෂා]

මට කථා කරන්න දෙන්න කෝ. ඒක නේ මේ කියන්නේ. ශ්‍රීනාත්ටත් ආදරෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කථාව කරන්න.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැන් කථා කරන්න දෙයක් නැහැ. බලු වමනේ වගේ මේ වැඩේ දැන්. ඒ කියන්නේ බල්ලා කාලා කාලා හැමදේම කාලා වමනේ දැම්මාම කොහොමද? මේ සභාව දැන් බලු වමනේ වගේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

කියන විධියට මේකේ හැම අච්චාරුවක්ම දාලා තිබෙන්නේ. මේකේ ගන්න දෙයක් නැහැ. මේකේ දෙන්නෙක් තුන්දෙනෙක් හිටියාම ඇති සභාව ඉවර කරන්න. මේ තරම් වටිනා සභාවක්. මේ සභාව අපි ආරක්ෂා කළා. පාර්ලිමේන්තුවට වඩා හොඳට මේ සභාව තිබ්බා. වාඩි වෙනවා. නැඟිටිනවා. වාඩි වෙනවා. නැඟිටිනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කුඩු ගැන කථා කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, මාතෘකාවට කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමියට උපදෙස් දෙන්නේ අර ළඟ ඉන්න මල්ලි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා ඒවාට කථා කරන්න එපා. ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමැතිවරයා මේ රටේ අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය අනුව විශාල වෙනසක් කරලා තිබෙනවා, දුම්වැටි සම්බන්ධයෙන්. අධිකරණයට ගිහිල්ලා ලෝකයේ විශාල පෙරළියක් කරපු සෞඛ්‍ය ඇමැතිවරයෙක් ලංකාවේ ඉන්නේ. රූපමය අවවාද ඇති කරන්න බරපතළ ලෙස - ඒ පූර්වාදර්ශය පළාත් සභාවේ සෞඛ්‍ය ඇමැතිවරයාත් ගන්නවා. මම කිව්වා, ඩෙංගු සම්බන්ධව අපි ලොකු වැඩ සටහනක් කරනවා කියලා. අපට ඩෙංගු සම්බන්ධව අපේ රෝහල්වල වෛද්‍ය අධිකාරීතුමන්ලාටත් දඩ ගැහුවා. වෛද්‍ය අධිකාරීතුමන්ලාට දඩ ගැහුවා. නම් කියන්නේ නැහැ. විදුහල්පතිවරුන්ට දඩ ගැහුවා. අපි නැවැත්තුවේ නැහැ. දඩ ගහලා මේක කරන්න බැහැයි කියන එක දන්නවා. නමුත් ඉතින් දෙතුන් සැරයක් කියන දේ අහන්නේ නැත්නම් ශ්‍රීනාත් ගැන මොකක් හරි තීන්දුවක් ගන්න වෙනවා නේ. තරහ වුණත් නේද මල්ලී. හැබැයි මම එකක් කියනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ඉඳිද්දී මෙහෙමද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම ඉඳිද්දී කිව්වේ මොකක්ද? හොඳ ළමයා වාගේ වාඩි වෙන්න කිව්වාම ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා හොඳ ළමයා වාගේ වාඩි වුණා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

එක්සත් ජාතික පක්ෂයේ මේ වාගේ හරකෙක් නම් නැහැ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, සභාවේ තීරණයක් අරන් දොට්ට දාන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම මූලාසනයේ ඉන්නකොට ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමාගේ මුහුණ දිහා බලලා හොඳ ළමයෙක් වාගේ ඉන්න කිව්වාම හොඳ ළමයා වාගේ කීකරු වුණා. මම ඒක පිළිගන්නවා. ඉතින් ඒ ළමයාව අවුස්ස ගන්න එපා. ඒ ළමයාට ඉන්න දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා ඉක්මන් කරන්න. කථාව අවසන් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විශේෂයෙන් බස්නාහිර පළාත් සභාවේ තරුණ දරුවන්ට අපි වැඩ සටහනක් මේ 15 වැනිදා පටන් ගන්නවා. දැන් සූදානම් කරලා තිබෙන්නේ. මේ රටේ තවදුරටත් ඩෙංගු, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමනි, බෝ නොවන රෝග ඒ වාගේම බස්නාහිර පළාතේ මත්ද්‍රව්‍ය සම්බන්ධව විශේෂිත

වැඩ සටහනක්. මොකද, දැන් දරුවන්ව දැනුවත් කරනවාට වඩා දෙමව්පියන්ව දැනුවත් කරන්න වෙලා තිබෙනවා. මේ විෂම සමාජය තුළ තිබෙන මත්ද්‍රව්‍ය අපේ තරුණ දරුවන්ට ඇතුළත් වෙමින් තිබෙනවා. පාසල හරහා විවිධ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වෙළඳාම් හරහා, විවිධ නීති විරෝධී බෙහෙත් වෙළඳසැල් හරහා, විවිධ පුද්ගලයන් හරහා පාසල් ගේට්ටුවෙන් එළියට එනකොට අද ඒ තත්ත්වය තිබෙනවා. ඒ නිසා ජනාධිපතිතුමා බරපතළ විධියට නීති රීති පනවලා තිබුණත් අපි සියලු දෙනා එකඟ වෙන්න ඕනෑ. ඒකයි හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ යෝජනාවට අපි පක්ෂව කථා කළේ. ඉතින් ඒ යෝජනාවට මෙහෙන් කිරි දොවනවා. එහෙන් ගොම දානවා. ඉතින් කාටද මේක කියන්නේ? අද මම මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ අවස්ථාවේදී විශේෂ ස්තුතියක් කරනවා. අපේ රජය ලොකු වෙහෙස මහන්සියක් කරනවා හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමනි. මොකද, මේ කුඩු ගේන්න, මේ මත්ද්‍රව්‍ය ගේන්න අපි අතහිත දීපු ආණ්ඩුවක් නොවෙයි. මේවා ආවේ දෙයියනේ විවෘත ආර්ථිකයත් එක්ක. දැන් ඉතින් ඇවිල්ලා ඇවිල්ලා යුද්ධය ඉවර වෙනකොටම අපේ නිලධාරීන් දකුණට ආවා. නිලධාරීන් යොදවලා අපි මේ කුඩු අල්ලනවා. අල්ලනවා. අල්ලනවා. පුළුවන්තරම් උසාවි දානවා. වැඩියෙන්ම බස්නාහිර පළාතේ කුඩු අහුවෙනවා කියන්නේ රේගුව තිබෙන්නෙත් කොළඹ. ගුවන් තොටුපල තිබෙන්නෙත් කොළඹ. වරාය තිබෙන්නෙත් කොළඹ. ඒ නිසා මෙහේ අහු වෙනවා වැඩියි. මෙහේ තමා හතරවැනි හරස්වීදිය, දෙවැනි හරස්වීදිය තියෙන්නේ. අපේ ගරු මන්ත්‍රීතුමාගේ යාළුවෝ එහෙම ඉන්නවාද දන්නේ නැහැ. මේ ගොල්ලෝ තමයි මේ බඩු ගෙන්නේ ගුදම් අස්සේ දාගෙන. මොකෝ අපි අගලවත්තේ ඉඳලා ගේනවාද? එතුමා දොම්පේ ඉඳලා ගේනවද? නැහැ නේ? දොම්පේ කියන්නේ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහත්මයා හිටපු හොඳ ආසනයක්. ඒ නිසා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ නිසා අද මම මතක් කරන්න ඕනෑ. ලොකු එකමුතුවක් ඇතුවයි අද මේ ව්‍යාපාරය ගෙනි යන්න ඕනෑ. අනාගත පරපුර වෙනුවෙන් අපි සම්පූර්ණ සහයෝගය දෙනවා. පළාත් සභාවේ සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට මම විශේෂිත වැඩ පිළිවෙළක් කරගෙන යනවා. ආණ්ඩුව ආවාම මටත් දුන්නා මත්පැන් බලපත්‍රය. මම ආපසු දුන්නා. මම එක මත්පැන් හලක්වත් දාලා නැහැ. මම ආපසු දුන්නා. ගත්තේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද දැම්මේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම දන්නේ නැහැ, කවුරු දැම්මාද කියලා. අපට දුන්නා හිටපු මැතිනිය. අපි ආපසු දුන්නා ඔන්න තියාගන්න කියලා. ඒ නිසා භය නැතිව අද කියන්න පුළුවන්. මම මීට වැඩිය කථා කරන්නේ නැහැ. විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මේ මත්ද්‍රව්‍ය තත්ත්වය මැඩ පවත්වන්න එතුමා විශාල කැපවීමක්, මහන්සියක් කරනවා. ඒ වාගේම අපේ මෛත්‍රීපාල සිරිසේන ගරු ඇමැතිතුමාට විශේෂ ස්තුතියක් කරනවා. එතුමා විශාල වැඩ පිළිවෙළක් කරනවා. ඒ වාගේම අපි හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට විශේෂ ස්තුතියක් කරනවා. මේ වාගේ යෝජනාවක් ගෙනැල්ලා, මේ වැඩ පිළිවෙළ ශක්තිමත් කරන්න සහයෝගය ලබා දීම සම්බන්ධව.

අපේ මරික්කාර් ගරු මන්ත්‍රීතුමා හිටියා. කොහේ ගියාද දන්නේ නැහැ. ගමේ ජුණ්ඩා ගුඩු ගියා වාගේ කියලා කථාවක් තිබෙනවා, ගරු සභා නායකතුමනි. මොකද, ගුඩු ගහන්න ආවාම ගුඩු ගුඩු කියාගෙන එනවා. මේ කියනවා. මේ නැහැ. ජුණ්ඩා ගුඩු ගියා වාගේ මරික්කාර් ගරු මන්ත්‍රීතුමා මෙතැනින් ගිහිල්ලා තිබෙන්නේ. සියලු දෙනාටම බොහොම ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. මම මීළඟට ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා.

[ අ.භා. 01.25 ]

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතියි. බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙක් ලෙස තේරී පත් වෙලා මෙම සභාව ආමන්ත්‍රණය කරන ප්‍රථම අවස්ථාව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා පොඩ්ඩක් කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. ඒ මන්ත්‍රීතුමාගේ මුල්ම කථාව. මංගල කථාව. එතුමාට බාධා කරන්න එපා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ඒ නිසා මම ප්‍රථමයෙන්ම මගේ පක්ෂයේ නායක ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. නියෝජ්‍ය නායක පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත කැටගොඩ මැතිතුමාට. එමෙන්ම මාව මෙම ස්ථානයට එවීමට මා වෙත මනාපය ලබා දුන්, අප පක්ෂයට ඡන්දය ලබා දුන් ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ආසනයේ, දොම්පේ ආසනයේ ප්‍රමුඛ ජනතාවට මම ස්තුතිවන්ත වෙනවා. එමෙන්ම අපේ කණ්ඩායම් නායක සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, එතුමා තමයි අපේ පක්ෂයේ මේ මාතෘකාව ගැන කථා කරන්න සුදුසුම පුද්ගලයා. හැබැයි, මට එම අවස්ථාව ලබා දීම පිළිබඳවත් ස්තුතිවන්ත වෙනවා. මාතෘකාවට පිවිසෙන්න ඉස්සෙල්ලා අපේ කණ්ඩායම් නායකතුමන්ට අපේ රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා ගිය සභාවේදී කරපු අභියෝගයක් ගැන කිව්වා. ඇත්තටම ඒකට උත්තර බඳින්න අපේ සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, එතුමාගේ මනාප හොරකම් කිරීම පිළිබඳව. ඉතින් ඔන්න ඕකම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඌවේදී ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ඡන්දවලටත් වුණේ. ඒක පිළිඅරගෙන තිබෙනවා, ගරු මන්ත්‍රීතුමාම. මනාප ඡන්ද හරියට ගියා නම් අද මෙතැන ප්‍රධාන අමාත්‍ය ධූරයේ ඉන්න ඕනෑත් නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා කියන එකත් අපට කියන්න වෙනවා. මාතෘකාවට පිවිසෙද්දී (බාධා කිරීමක්) ඔබතුමාට මේකයි, මේක තිබ්බට මේක නැහැ නේ? පත්තරේ දාල තිබ්බා නේ. ඒක නිසා ඉන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ මිත්‍රයා හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මෙවැනි කාලීන, වැදගත් මාතෘකාවක් පිළිබඳ යෝජනාවක් ගෙන ඒම ගැන. ඇත්තටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියලා හඳුන්වපු අපේ රට, ධර්මද්වීපය කියලා හඳුන්වපු අපේ රට අද වන කොට මුළු ආසියාවටම මත්ද්‍රව්‍ය බෙදා හරින මධ්‍යස්ථානය බවට පත් වෙලා තිබෙනවා. ආසියාවේ ආශ්චර්ය බවට ලංකාව පත් කරනවා කිව්වාට අද ලංකාවෙන් ලෝකයේ රටවල් ගණනාවකට මත්ද්‍රව්‍ය බෙදා හරිනවා. ලංකාවට එන්නේ මේ හෙරොයින් කියන මත්ද්‍රව්‍යයේ මිල අධිකම එක. Brown Sugar. මෙන්න මේක තමයි ලංකාවට එන්නේ. දැන් එතකොට මේ මත්ද්‍රව්‍ය ලංකාවට ගලා එන්නේ ප්‍රධාන ගුවන් තොටුපලවල්, වරායවල් හරහා. රේගුව හරහා. ඒ වගේම කල්පිටිය මුහුදෙන්. විවිධ ක්‍රමවලිනුත් මේ දේවල් රට තුළට පැමිණෙමින් පවතිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මේ ආකාරයට මේ මත්ද්‍රව්‍ය බෙදාහරින්න අපේ රට තෝරාගෙන තිබෙනවා. සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපේ රට දියුණු වේගෙන යන රටක් නිසා අපේ රට තෝරා ගත්තාය කියලා. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් යම් රටක් කුඩු ඇතුළු මත්ද්‍රව්‍ය බෙදන්න මධ්‍යස්ථානයක් බවට පත් කර ගන්නේ එම රටේ දේශපාලන අධිකාරියේ ආරක්ෂක අංශවල හා කුඩු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පොඩ්ඩකට වාඩි වෙන්න. ගරු සභා කටයුතු ඇමැතිතුමා කාලය දීර්ඝ කරන්න.

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*සභාවේ වැඩ කටයුතු අවසන් වනතුරු සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කිය කියා සිටියේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ඒ මත්ද්‍රව්‍ය බෙදන්න අපේ රට තෝතැන්නක් බවට පත් කරගෙන තිබෙනවා. ඒ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් යම් රටක් කුඩු බෙදීමේ මධ්‍යස්ථානයක් හැටියට තෝරා ගන්නේ ඒ රටේ දේශපාලන අධිකාරියේ, එමෙන්ම ආරක්ෂක අංශවල, එමෙන්ම කුඩු මර්දනය පිළිබඳව ක්‍රියා කරන ඒකකවල පූර්ණ අනුග්‍රහය හා සහයෝගය ලැබෙනවා නම් පමණයි. ඒ නිසා තමයි මේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් එවැනි රටක් තෝරා ගන්නේ. මේ කථාව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඉන්දික බණ්ඩාර කියන කථාවක් නොවෙයි. අපේ වැඩ බලන ගරු මහ ඇමැතිතුමාගේ පක්ෂයේ මගේ සහෝදර මන්ත්‍රී නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මැතිතුමා තමයි මේ ප්‍රකාශය කරලා තිබෙන්නේ. අපි කනගාටු වෙන්නේ, මේ රට මත්ද්‍රව්‍ය බවට පත් වෙලා තිබෙන යුගය, මේ රටේ රාජ්‍ය නායකයා මත්ද්‍රව්‍ය විරෝධී තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පවා මතට තිත ගැන කථා කරන රාජ්‍ය නායකයෙක් ඉන්න යුගයක, ධර්ම රාජ්‍යයට යන රටක් ගැන කථා කරන උදය ගම්මන්පිල වැඩ බලන ගරු මහ ඇමැතිතුමා වාගේ අය ඉන්න යුගයක තමයි අපේ මේ උතුම් ධර්මද්වීපය මත්ද්‍රව්‍යවලින්, මත් කුඩු වලින් පිරුණු දේශයක් බවට පත් වෙලා තිබෙන්නේ. අපි නොවෙයි කියන්නේ, කුඩු ගේන මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ ඉන්නවා කියලා. ආණ්ඩු පක්ෂයේ ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු සියලුමදෙනා තමයි ප්‍රකාශ කරන්නේ ඔවැනි කතන්දර. දැන් කුඩු අල්ලනවා. රූපවාහිනියෙන් අපි දකිනවා. පත්තරවලින් දකිනවා. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා, ජනාධිපතිතුමා ඇතුළු රජය එය නවත්වන්න දැඩි උත්සාහයක් ගන්නවා කියලා. අපි එය විශ්වාස කරනවා, ඒ ආකාරයට කරනවා ඇති කියලා. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි එය සාර්ථක වෙලා තිබෙනවාද? එය සාර්ථක නැත්නම් එතැන ඒක Fail වෙලා. Fail නම් ඒක කරන්න බැරි තැනකට පත් වෙලා තිබෙනවා. එතකොට මේ ආකාරයට මේ අල්ලන කුඩුවලට, එතනෝල්වලට වෙන්නේ මොකක්ද කියන එක පිළිබඳව නියම පාරිශුද්ධ භාවයකින් එළියට පේන්න දෙන්නේ නැහැ. මම ඊයේ පෙරෙයිදා TV එකේ ගිය, ආණ්ඩු පක්ෂයේ ඇමැතිතුමන්ලා කියන කථා දැක්කාම මට හිතෙනවා ඉතිරි වුණු කුඩු ටික මේගොල්ලෝ ගහලාද මේ කථා කරන්නේ කියලා.

එතකොට අපේ දොම්පේ ආසනය ගැන කථා කරන්න ඕනෑ. ඊට ඉස්සෙල්ලා කියන්න ඕනෑ අද කුඩු ගැන කථා කරනකොට විශාල වශයෙන් කොළොන්නාව ආසනය කියන නම කියැවෙනවා. කොළොන්නාව ආසනයේ සුසිල් කිඳෙල්පිටිය අපේ කණ්ඩායම් නායකතුමා එදා කොළොන්නාවට ගිය මොහොතේ සිට පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස අද කටයුතු කරනවා. මමත් එතැනට සහභාගි වුණු නිසා දන්නේ. මේ පෞද්ගලිකවත්, පක්ෂයක් හැටියටත් කුඩු මර්දනයට එරෙහි අපි විශාල වැඩ පිළිවෙළක් කොළොන්නාව තුළ ගෙනි යනවා. කොළොන්නාවේ තත්ත්වය එහෙම වෙනකොට දොම්පේ ආසනය ගැන අපේ රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා කිව්වා. ගරු ඇමැතිතුමනි, කොළොන්නාවට පස්සේ වැඩිම කුඩු තිබෙන්නේ දොම්පේ. දොම්පේ අද ඉස්කෝලවල පවා, දොම්පේ ආසනයේ පොඩි ළමයින්ට පවා - මම හිතන්නේ, මගේ මිත්‍රයා යෝජනාව ගෙනැල්ලා තිබෙන්නෙත් ඒ හින්දයි කියලා. දොම්පේ ආසනයේ අද ඉස්කෝලවල, සිය නෑ විද්‍යාලයේ ගරු ඇමැතිතුමනි, ළමයින් අතේ කුඩු තිබිලා අහු වුණා. මේ පිළිබඳව ගත්තු ක්‍රියා මාර්ගයක් නැහැ. ඒ වගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොළඹ ඉඳලා කුඩු ගෙනැල්ලා බෙදන පුද්ගලයෙක් මීට දින කිහිපයකට ඉස්සෙල්ලා දොම්පේ නගරයේදී අත්අඩංගුවට ගත්තා. මේ පුද්ගලයා ළඟ ග්‍රෑම් 30 කට වැඩිය ප්‍රමාණයක් තිබිලා තිබෙනවා. ඒ තිබිලත් පොලිස් ඇප මත මේ පුද්ගලයාව දින දෙකක් ඇතුළත නිදහස් කළා. අපි දන්නවා, මේ පුද්ගලයා. මම වගකීමෙන් කියනවා. අදටත් ගෙදර ගහලා තිබෙනවා, අපි හිතමු කියලා. මේ පුද්ගලයාගේ, මේ කුඩු වෙළෙන්දාගේ ගෙදර අදටත් අපි හිතමු කියලා ගහගෙන තිබෙනවා. එතකොට තවත් දෙකටන සුරතලා කියලා පුද්ගලයෙක් අහුවුණා. මම කියන්නේ බොරු නම් අන්න ගිහිල්ලා බලන්න. අදටත් අපි හිතමු කියලා ගහගෙන ඉන්නවා. එතකොට මේවාට කවුද සම්බන්ධ? අපි හිතමු කියලා ගහගෙන ඉන්නවා ඒ පුද්ගලයාගේ ගෙදර. එතැනින් එහාට මම කියන්න යන්නේ නැහැ. අපි හිතමු 17 කියලා ගහගෙන තිබෙනවා. මෙන්න මේ ආකාරයට තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ තත්ත්වය විහිදී ගෙන යන්නේ. අපේ රටේ තරුණ පරම්පරාවට - අද සමහරු කිරි

[ගරු ඉන්දික මහීෂ බණ්ඩාර]

පිටි ටික ගන්න සල්ලි නැතිව ඉන්නවා. හැබැයි, දරුවන් එහෙම සිටියාට, කිරි බොන්න නැති වුණාට අද ඕනෑ තරම් කුඩු නම් බොන්න තිබෙනවා. අපි පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ සඳහා එක් විය යුතුයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

හරි. එසේ නම් අපේ හෙළ උරුමයේ ගරු මන්ත්‍රීතුමිය කිව්වා. ඒ වාගේම හෙළ උරුමයේ මතය මේ පත්තරේත් තිබෙනවා. අල්ලන කුඩු, එතනෝල් ප්‍රසිද්ධියේ විනාශ නොකිරීමෙන් ආණ්ඩුව ගැන විශාල සැකයක් සමාජයට ඇති වෙලා තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සඳහා විකල්ප අපි ඉදිරිපත් කරන්න ඕනෑ. අද මේක නියම විධියට සිද්ධ වෙන්නේ නැත්තේ මොකද? කුඩු ඇල්លුවාට - අපි දන්නවා, මේ රටේ රජයේ සුරාබදු කොමසාරිස් ජෙනරාල්වරයාගේ හා සුරාබදු විශේෂ මෙහෙයුම් ඒකකයේ ස්ථානාධිපතිගේ නිවෙස්වලට වෙඩි ප්‍රහාර එල්ල කරලා තිබෙනවා. මේ පිළිබඳව මොකක්ද වෙලා තිබෙන්නේ? හරියට තවම සිද්ධියක් සිදු වෙලා නැහැ. නිරෝෂා ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ මම කියන්නේ, රටේ මිනිස්සුන්ගේ ආර්ථිකය අද වැටිලා තිබෙනවා. කන්න, බොන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක නිසා කුඩු ගේන වෙළෙන්දා අර අල්ලන පොලිස් නිලධාරීන්ට කප්පම් දෙනවා. ඒ කප්පම් ගන්න සිද්ධ වෙනවා. අන්න ඒ නිසා තමයි මේ රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ. ඒක නිසා ක්‍රමානුකූලව, සියලුම දෙනාගේම ආර්ථිකය දියුණු වෙලා, අතට සල්ලි ගිහිල්ලා, අතේ තිබෙන මුදලින් වියදම් කරන්න පුළුවන් තත්ත්වයකට මේක හදන්න ඕනෑ. එතකොට කිසි කෙනෙක් තව කෙනෙකුට කොන්ද නමන්නේ නැතිව නියමකාරයෙන් රාජකාරි කරන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙනවා. ඒ තත්ත්වය ඇති වෙන්න ඕනෑ. අපි දන්නවා, අදාළ බල ප්‍රදේශවල ඒ ඇමැතිවරයාගේ රූප ගහගෙන වෙළඳාම් කරන අය ඉන්නවා. ඒ පිළිබඳව මම හිතන්නේ වැඩ බලන ගරු මහ ඇමැතිතුමනි ඔබතුමන්ලා සොයලා බලන්න. ඔබතුමන්ලාටමයි මේක හොඳ නැත්තේ. ඒ අවශ්‍ය දත්ත ලබා දෙන්න අපි ඕනෑම අවස්ථාවක සූදානම්. ඒ ආකාරයට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

තව විනාඩි භාගයක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ ආකාරයට අද මේ පාසල් ශිෂ්‍යයින්ට පවා කුඩු යන යුගයක් උදා වෙලා තිබෙනවා. Part time Job පවා දීලා තිබෙනවා, ඉස්කෝල ළමයින්ට මේ කුඩු විකුණන්න. එදා සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, කුඩු අවුට්ලට්ටුත් යයි කියලා කොළොන්නාවේ. කොළොන්නාවේ එහෙම වෙනකොට අද දොම්පේ කුඩු බෙදන්න දීලා තිබෙනවා, ඉස්කෝලේ යන ළමයින්ට. ගංජා පැකට්, කුඩු පැකට් ගෙනිහිල්ලා විකුණන්න. ඒකෙන් කොමිස් එකක් අරගෙන අන්න Part time Job. ඉතින් මෙන්න මේවා නවත්වන්න අපි සියලුදෙනාම එකතු වෙමු. එසේ ඉල්ලමින් මගේ මංගල කථාව කිරීමට බාධා නොකළ මගේ ආදරණීය ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා දොම්පේ සම්බන්ධයෙන් ඒ ආසනය නියෝජනය කරන දේශපාලන චරිතයට වක්‍රව එල්ල කළා. අපි දන්නවා, උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමා කවදාවක්වත් ඒ වාගේ වැරැදි වැඩ කරන මන්ත්‍රී කෙනෙක් නොවෙයි. ඒ නිසා මේ සභාවේ අන්‍යාකාරයකින් එතුමාව සඳහන් කිරීම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට අපි ඒ ප්‍රකාශය හෙළා දකිනවා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

එතුමා කථා කරන රීතිය මොකක්ද?

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මේ සභාවේ විවේචනය කරන්න දෙන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වාඩි වෙන්න.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

මොකක් ගැනද කථා කරන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාට, විනාඩි 06 ක කාලයක් ලබා දෙනවා.

[ අ.භා. 01.39 ]

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ හිතවත් හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඉතාමත් වැදගත් කාලෝචිත යෝජනාවක් ගෙනාවා. මොකද, අපි ආණ්ඩු පක්ෂයක් විධියටත්, තමුන්නාන්සේලා විරුද්ධ පක්ෂයක් විධියටත් මේ රටෙන් තුරන් වෙන්න ඕනෑ කියන දෙයක් තමයි මේ මත් කුඩු සහ මේකට සම්බන්ධ වෙනත් ව්‍යාපාර කරන සියලු දේවල්. ඒක අපි අවිවාදයෙන් පිළිගන්නවා. මම හිතන්නේ, මමත් අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාත් අපි සියලු දෙනා මේ යෝජනාව ඒකමතිකව - මොකද නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාත් ඉල්ලීමක් කළා, ඒකමතිකව මේක සම්මත කරන්න කියලා. ඉතින් ඒකට අපේ කිසි විවාදයක් නැහැ. නමුත් මේකේ තිබෙන ප්‍රශ්නය තමයි මේ රටේ ඔබතුමන්ලා දන්නවා මරණ දණ්ඩනය දෙන වැරැදි දෙකක් තියෙනවා. එකක් ගත්තොත් මිනී මැරුම් අපරාධය.

අනික් එක මත් කුඩු ව්‍යාපාරය. ඒ නිසා පැහැදිලිවම අපි ආණ්ඩුවක් විධියට මේ මත්කුඩු ව්‍යාපාර කරන අය මේවාවලින් නවත්වන්න මම හිතනවා පසුගිය කාලය තුළ විශේෂයෙන් ආරක්ෂක ලේකම්තුමා, මේ මත්කුඩු විශාල ප්‍රමාණයක් අල්ලන්න ගත්තු නිසා තමයි මත් කුඩු පිළිබඳව කථා කරන්න ගත්තේ. ඉතින් මට පුදුමයි ජෝෂප් මයිකල් මහත්මයා 1976 අතුරු මැතිවරණයෙන් ඇවිල්ලා, 1977 පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමාගේ කාලයේ තමයි මේ විවෘත ආර්ථිකය හඳුන්වලා දුන්නාම මේ මත් කුඩු මේ රටට එන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමන්ලා ටයි කෝට් අඳින්නෙත් ඒ නිසා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාරණාව කියන්න දෙන්න. මොකද, එතුමාට කථා කරන්න පුළුවන් නම් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ නම කියලා ඔබතුමාට කථා කරන්න බැහැ නේ? දැන් එතුමාත් කට වහගෙන ඉන්නවා නම් මමත් මොනවා හරි කියන්න ඕනෑ. මම කාගේ නමක් කිව්වත් එතුමා මට කියනවා, ඕක නවත්වන්න. කියන්න බැහැ කියලා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම කිව්වේ නැහැ නේ ඔබතුමාගේ තාත්තා කුඩු ගෙනවා කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙපැත්තම වගබලා ගන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම කිව්වේ ඔබතුමාගේ තාත්තා 1976 අතුරු මැතිවරණයෙන් ඇවිල්ලා, ඊට පස්සේ 1977 දී ඔබතුමාගේ තාත්තා හිටපු ආණ්ඩුවෙන් තමයි විවෘත ආර්ථික ක්‍රමය මේ රටට ඇති කරලා, ඔබතුමාගේ තාත්තා නියෝජනය කරන ආණ්ඩුව කාලයේ තමයි කුඩු මේ රටට එන්නේ. කුඩු අල්ලන්නේ කවදාද? 1982 පළමුවැනි පාරට අහු වෙනවා. කොයි කාලයේද? තමුන්නාන්සේගේ තාත්තා ආණ්ඩුවේ ඉන්න කාලයේ. ඒත් එක්කම අනික් පැත්තට කියන්න ඕනෑ. තමුන්නාන්සේගේ තාත්තා තමයි 2001 මීගමුවේ සංවිධායක. එදත් කුඩු අහු වෙනවා. ඒකට තමුන්නාන්සේගේ තාත්තා වග කියනවද? තමුන්නාන්සේගේ තාත්තා වග කියන්න ඕනෑද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මම පැහැදිලිව කියන්නේ අතිගරු ජනාධිපතිතුමාත්, ආරක්ෂක ලේකම්තුමාත් මේ රටේ පැහැදිලි වැඩ පිළිවෙළක් ගෙනියනවා. අපි බලාපොරොත්තු වෙනවා. ජනාධිපතිතුමා යුද්ධය අවසන් කරනවා කිව්වා. යුද්ධය ඉවර කළා. රට සංවර්ධනය කරනවා කිව්වා. රට සංවර්ධනය කළා. අතිගරු ජනාධිපතිතුමයි, ආරක්ෂක ලේකම්තුමයි පැහැදිලිව කියලා තිබෙනවා මේ රටෙන් කුඩු තුරන් කරනවා කියන එක. ඒක අපි පැහැදිලිව කියනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

55 ත් කුඩු ආවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අපි මේ රටේ කුඩු තියෙනවා කියලා සොයා ගත්තේ 1982. ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා පත්තර පිටුවක් පෙන්නලා මෙතුමා කියනවා, නියෝජ්‍ය ඇමැතිතුමාට තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමා වෙනත් ප්‍රශ්නයක්. නියෝජ්‍ය ඇමැතිතුමා ගෙදර යන ගමන් ඉන්නේ. නියෝජ්‍ය ඇමැතිතුමාට ජනතාවගේ ප්‍රසාදයක් නැහැ. ආකර්ෂණය නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කියන්නේ ඔබතුමාට නැහැයි කියලා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු මන්ත්‍රීතුමා ඡන්ද ප්‍රතිඵල දැක්කාම පේනවා නේ. මෝඩයෙක් වාගේ කථා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෝඩ කථා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොළේ තරමට කථා කරන්න කෝ. වැදගත් විධියට.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනතාවගේ ආකර්ෂණය නැත්නම් එක් ලක්ෂ හයදාහක් මම ගනිද්දී 24,000 ක් ගත්තු තමුන්නාන්සේලාගේ තාත්තාගේ ආසනයේ තමුන්නාන්සේ 3000 ට බහියිද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම 3000 ක් ගත්තේ මීගමුවට අඩියක්වත් තියන්නේ නැතිව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, මාතෘකාවට අදාළව කථා කළොත් හොඳයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම මීගමුවේ එක තැනකටවත් ගියාද? නැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමන්ලාගේ සහෝදර -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා කියනවා අපේ මීගමු සංවිධායකතුමාට ලොකු ජනතා ප්‍රසාදයක් තිබෙනවා කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කියන්නේ ඔබතුමාට නැහැයි කියලා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

පොඩ්ඩක් ඉන්න කෝ. මේක අහගන්න කෝ. මේ රටේ දේශපාලඥයින්ගේ -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමන්ලාගේ ප්‍රශ්න ඔබතුමන්ලා බේරගන්න. අපට වැඩක් නැහැ.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

මීගමුවේ සංවිධායකතුමා පාර්ලිමේන්තු ගියේ හොරට. කෝකිලා ගරු මන්ත්‍රීතුමියටත් වැඩිය යට හිටියේ. කෝකිලා ගරු මන්ත්‍රීතුමියටත් වඩා ඡන්ද අඩුයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු සංවිධායකතුමා නිශ්ශබ්ද වන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා පැහැදිලිවම කිව්වා ජනතා ප්‍රසාදය තිබෙන්නේ මට නොවෙයි. මීගමුව සංවිධායකතුමාට කියන එක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම නොවෙයි කියන්නේ. ඔබතුමන්ලාගේ සංවිධායකතුමා කියන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

හරි. සංවිධායකතුමා කියනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා සංවිධායකතුමාට ගිහිල්ලා කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා,-

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙමනම් පැහැදිලිව මම ඒක ඔප්පු කරලා පෙන්වන්න වෙනවා, මේ වාගේ මෝඩ තකතීරු මන්ත්‍රීවරුන්ට ජනතා ප්‍රසාදය තියලා ඡන්ද ආපු ක්‍රමවේදය. පළමුවැනි පාර මම මැතිවරණයට ඉදිරිපත් වුණා. ඡන්ද 4210 යි. මීගමුවේ දෙවැනියා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෝඩයින්ට කියලා වැඩක් නැහැ නේ?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

වගුව කියන්නම්. අහගෙන ඉන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම තර්කානුකූලව පෙන්වන්නම්. ඡන්ද වැඩි වුණේ කොහොමද? ජනතාව ආදරය කරන්නේ කාටද? ජනතාව ඡන්දය දෙන්නේ කාටද? කියන එක කියන්නම්. පළමුවැනි පාර ඡන්ද 4210 යි. දෙවැනි පාර ඡන්ද 12287 යි. තුන්වැනි පාර ඡන්ද 15300 යි. හතරවැනි පාර 15800 යි. පස්වැනි පාර 36000 යි. (බාධා කිරීමක්) ඊළඟ පාර 76000 යි. ඊළඟ පාර 106,000 ක් මේ පැත්තෙන් ගනිද්දී අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ ඡන්ද ප්‍රතිඵලය කොහොමද යන්නේ. මීගමුවේ තාත්තා 24000 ක් ගන්නවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි කුඩු දුන්නේ නැහැ. ඡන්දයට වියදම් කළේ නැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ජනතාවට කන්න බොන්න දීලා ඡන්ද ගන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එක ඡන්දයක වියදම රුපියල් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා මාතෘකාවට අදාළව කථා කරන්න. ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා මේ කථාවට අදාළව, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ නම කියලා කථා කරද්දී කටවහගෙන ඉන්න කියන්න බැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. මම දෙපැත්තට කථා කරන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ 2014 පළාත් සභා මැතිවරණයට පෙර මේ සභාවේ ගරු මන්ත්‍රීතුමා අභියෝග තුනක් කළා. මේ සභාවට මතක ඇති.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කුඩු ගැන කියන්න කෝ. ඒක හැමදාම මග හරිනවා නේ?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු මන්ත්‍රීතුමා, අපි කුඩුවලට විරුද්ධයි.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට ඔච්චර මීගමුවේ බලයක් තිබෙනවා නම්, මීගමුවේ කුඩු නවත්වන්න කෝ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම නොවෙයි නේ සංවිධායක. තමුන්නාන්සේලා බුර බුරා පැන පැන දෙන සරත් කුමාර ගුණරත්න තමයි සංවිධායක. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සභාවේ ගරු මන්ත්‍රීතුමා මාත් එක්ක 2014 පළාත් සභා මැතිවරණයට යන්න ඉස්සෙල්ලා අභියෝග තුනක් කළා. මොකක්ද අභියෝගය කළේ? ලැජ්ජයි අහන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු ඇමැතිතුමා, මට විනාඩියක් දෙනවාද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මගේ අවස්ථාව මේක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තත්පර පහක් දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, මන්ත්‍රීතුමා ඔබතුමන්ලා දෙන්නාගේ වාදය නොවෙයි. මාතෘකාවට අදාළව කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දෙන්නේ නැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මාතෘකාවට අදාළව,විෂයය පථයට අදාළව තමයි කථා කළේ. මෙතුමා තමයි කිව්වේ ජනතාවගේ අකාර්ෂණය අපට නැහැයි කියලා. ඒක ඔප්පු කරන්න තමයි යන්නේ. ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේට අපි පැහැදිලිව අභියෝග තුනක් කිව්වා. මතකද? -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මේ අභියෝග තුන අහගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා පස්සර ගිහිල්ලා මැෂින් 6000 ක් බෙදුවේ කාගේ සල්ලිවලින්ද කියන්න?

[සභාවේ සෝෂා]

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කියන්න කාගේ සල්ලිවලින්ද බෙදුවේ කියලා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම මේ කියන්නේ මේ සභාවේ මේ මැතිවරණය පවත්වන්න පෙර කරපු අභියෝග තුනක් පිළිබඳව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විෂයයට අදාළව කථා කරන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

විෂයයට අදාළව තමයි. මෙතුමා මතු කළා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මීගමුව නගර සභා මන්ත්‍රීවරු තුන්දෙනෙක් ගන්නවා කිව්වේ නැද්ද? කිව්වේ නැද්ද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අභියෝග ටික කියන්නම්. අහගහන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කිව්වේ නැද්ද? කිව්වේ නැද්ද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අභියෝග ටික කියන්නම්. අහගහන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපේ සියලුම මන්ත්‍රීවරුන්ගේ වැදගත් කාලය. වැදගත් යෝජනාවක් යටතේ කථා කරන්නේ. මේක එක එක පැතිවලට අරන් යනවා. පුද්ගලික ප්‍රශ්න මෙතැනට අදාළ නැහැ. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු (බාධා කිරීම්) කථා කරන්න දෙන්නේ නැහැ. මේ වාගේ විනයක් නැතිව, යෝජනාවට කථා කරන්න දෙන්නේ නැත්නම් නීත්‍යානුකූලව ඔබතුමා මූලාසනය හැටියට කටයුතු කරන්න. මන්ත්‍රීවරයෙකුට, ඇමැතිවරයෙකුට කථා කරන්න දෙන්නේ නැත්නම් එළියට දාලා හරි අපේ කාලය ආරක්ෂා කරලා දෙන්න. අපේ වැදගත් කාලය.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ඔබතුමාට අයිතියක් නැහැ, එහෙම කථා කරන්න. ඔබතුමා හැම තිස්සේම නැඟිටගෙන කෑ ගහනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට ඕනෑ විධියට සභාව ගෙනියන්න ඕනෑ නම් එහෙම කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක ඔබතුමාටත් අදාළයි.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න දෙන්න. ගරු ඇමැතිතුමා දෙකට සභාව අවසන් කරන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ඇයි අහගන්න ඕනෑද තාත්තා කුඩු ගෙනාපු හැටි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

කට වහගෙන ඉන්නවා ඕයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා යෝජනාව ගෙනාපුවාම අපි පක්ෂ විපක්ෂ ඔක්කෝම කැමැති වෙනවා කියලා තමයි කලින් කථාව පටන් ගත්තේ. මේක නවත්වන්න ඕනෑ කියලා කථාව පටන් ගත්තේ. මේවා තුරන් කරන්න ඕනෑය කියලා කථාව පටන් ගත්තේ. ඉතින් ඒ අස්සේ මෝඩයෙක් වාගේ ගරු මන්ත්‍රීතුමා කෑ ගහපුවාම අපටත් ආවේගයක් එනවා. ඔබතුමා කියනවා - (බාධා කිරීමක්) කථා කරන්න දෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට අදහස් ප්‍රකාශ කරන්න දෙන්න කියන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විෂයය ගැන කථා කරන්න.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

විෂයය ගැන කථා කරද්දී තමා තමුන්නාන්සේ මැදට ගෙම්බෙක් වාගේ පැන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මේ ගරු ඇමැතිතුමාගේ වේලාව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා මට නේ කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉතාමත් වැදගත් විධියට මේ ප්‍රකාශය කරගෙන එද්දී එතුමා මැදින් පැන්නා. එතකොට තමයි මම කිව්වේ මේ රටේ 1977 විවෘත ආර්ථිකය හඳුන්වලා දෙද්දී ඒකේ ප්‍රධාන පෙළේ ඇමැතිවරයෙක් මෙතුමාගේ තාත්තා. මෙතුමාගේ තාත්තාගේ කාලයේ තමා කුඩු මේ රටට පැමිණියේ. මම හිතන්නේ අපි ඉපදිලත් නැහැ. ඉපදිලා අවුරුද්දයි, දෙකයි කුඩු එද්දී. දැන් මේ මහ ලොකුවට කෑ ගහන, මත් කුඩු ගැන කෑ ගහන මෙතුමාගේ පියාගේ ආණ්ඩුව කාලයේ තමයි කුඩු මේ රටට ආවේ. ඒ නිසා අපි පැහැදිලිව පිළිගන්නවා. බරපතළම විනාශය කළේ තමුන්නාන්සේගේ තාත්තා ආණ්ඩුවේ හිටපු කාලයේ කියන එක. මේ රටේ බරපතළ විනාශය. තමුන්නාන්සේ අද කථා කරන -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මේක අසාධාරණයි.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ කරපු තාත්තාගේ වේදිකාවට මෙතුමා නැග්ගා 2010 යේ. 2010 බඩ ගාගෙන ආවේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න. මේ වැදගත් යෝජනාව අවසන් කරන්න හදන්නේ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

එතුමාගේ තාත්තාගේ කාලයේ තමයි ලංකාවට කුඩු ආවේ කියනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අසාධාරණයි මෙතුමාගේ කථාව. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් විධියට -

[සභාවේ ඝෝෂා]

සභාව නොමඟ යවනවා.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීගමුවේ හිටියා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මොනවා කිව්වත් දැනුත් කථා කරන්නේ ඇමැතිතුමා කියලා. ඕයි තමුසේ කියලා නොවෙයි. තමන්ගේ භාෂාව හසුරුව ගන්න පුරුදු වෙන්න.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මීගමුවේ හිටියා කුඩු ජෝෂප් කියලා එකෙක්. මෙයාව තමයි ඉස්සෙල්ලාම පොලීසියට අහුවෙන්නේ. කුඩු ජෝෂප් කියලා. 1982 දී. ජෝෂප් මයිකල් මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ අහු වෙන්නේ කාවද? කුඩු ජෝෂප් කියලා. මීගමුවේදී අහු වෙන්නේ. තමුන්නාන්සේගේ තාත්තා තමයි 2001 දී මීගමුවේ සංවිධායක. එදත් කුඩු අහු වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි නැහැයි කිව්වේ නැහැ නේ?

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ඇයි තමුන්නාන්සේලා මගේ නම කියලා පත්තර පෙන්න පෙන්නා කිව්වේ. මේකත් අහගන්න. අපි අහගෙන සිටියේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කුඩු ජෝෂප් තමුන්නාන්සේලාගේ තාත්තාගේ කාලයේ තමයි අහු වුණේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා කථාව අවසන් කරන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඔබතුමාගේ තාත්තාත් එතකොට යූ.ඇන්.පී. එකේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අල්ලපු එක හොඳයි නේ. අල්ලපු එක නරකයි කියලාද මෙතුමා කියන්නේ.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

කුඩු ජෝෂප් කියන්නේ ජෝෂප් මයිකල් මහත්මයාගේ දකුණු අත.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපේ තාත්තාගේ එහෙම දකුණු අතක් තිබුණේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා කථාව අවසන් කරන්න. කාලය අවසන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නිකම් මෝඩ කථා කියන්න එපා. තමුන්නාන්සේගේ චරිතේ ගැන මුළු මීගමුවම දන්නවා.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මේක එක පයින් අපි අනුමත කරනවා. ඊට පස්සේවත් දැනගන්න ගරු මන්ත්‍රීතුමා කරුණු නොදැන අසත්‍ය කරුණු මේ සභාවට කියන්න එපාය කියන ප්‍රකාශය කරමින්,

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි කරුණු දැනගෙන කියන්නේ. ඔබතුමාත් කරුණු දැනගෙන කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, කථාව අවසන් කරන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ගෙනාපු යෝජනාවට අපි සියලු දෙනා එක පයින් එකඟත්වය ප්‍රකාශ කරමින් මේ මත් කුඩු ව්‍යාපාරය මේ රටින් තුරන් කරන්න අපි සියලු දෙනා අත්වැල් බැඳ ගනිමුයි කියලා ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්. අපේ හර්ෂණ රාජකාරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ගෙනාවා. බොහෝ වාද විවාද කළා. කාල වේලාව ඉක්මවන නිසා මම ඉතාමත් කෙටියෙන් පිළිතුරු කථාව සඳහා විනාඩියක කාලයක් ඔබතුමාට ලබා දෙනවා.

[ අ.භා. 01.55 ]

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම පිළිබඳව පක්ෂ විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මම මෙම යෝජනාව ගෙනාවේ අද රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව වැදගත් කරුණු ටිකක් සාකච්ඡා කරන්න. වැදගත් කරුණු අස්සේ නොවැදගත් කරුණුත් ගොඩක් කථා වුණා. කෙසේ වෙතත් මම විශේෂයෙන්ම මෙම යෝජනාව ගෙනාවේ පෞද්ගලිකව කාටවත්, මෙතැන මීගමුවේ කුඩුවත්, කැලණියේ කුඩුවත්, එහෙම නැත්නම් වෙනත් තැනක කුඩු පිළිබඳවත් කථා කරන්න විතරක් නොවෙයි. මේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වයට අපි හැමෝම එකතු වෙලා විසඳුමක් ගෙන ආ යුතුයි කියන ඒ කාරණාව නිසා තමයි මෙම යෝජනාව ගෙනාවේ.

මම විශේෂයෙන්ම මේ ගැන වැඩි අවධානයක් යොමු කරනවා. මොකද, අපේ නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය යෝජනා කිහිපයක් ගෙනාවා. මම එතුමියට ස්තුතිවන්ත වෙනවා. අද ඇති වෙලා තිබෙන මම දකින තත්ත්වය තමයි Rehabilitation. පුනරුත්ථාපනය. මේ කුඩුවලට ඇබ්බැහි වන අයට අද පුනරුත්ථාපනය කරන ප්‍රමාණය, එහෙම නැත්නම් පුනරුත්ථාපන කඳවුරු ප්‍රමාණය, ඒවාට ලැබිලා තිබෙන සම්පත් ප්‍රමාණයේ ගැටලුවක් තිබෙනවා. අද කුඩුකාරයා හිර ගෙදරට ගිහිල්ලා, පුනරුත්ථාපනයට ගිය ඔහු ආපසු බරපතළ කුඩුකාරයෙක් බවට පත් වෙනවා. නැත්නම් ඒ ඇබ්බැහියෙන් එළියට එන්නේ නැහැ. මේ වාගේ වැදගත් කටයුතු ප්‍රමාණයක් පිළිබඳව අපි සාකච්ඡාවේ යෙදෙන්න ඕනෑ. මේ ගැන විශේෂ අවධානයක් යොමු කරලා මම හිතන්නේ අපේ රටේ ඇති වෙලා තිබෙන මේ තත්ත්වය තුරන් කරන්න, මේ පිළිබඳව විශේෂ කමිටුවක් දමලා හෝ මේ බස්නාහිර පළාත - අද බස්නාහිර පළාතේ මෙය විශාලතම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ විශාලතම ප්‍රශ්නයෙන් එළියට එන්න අපි හැමෝම එකතු වෙලා මේ සඳහා කටයුතු කරමුයි කියන ඒ ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ගෙනෙන ලද යෝජනාව පිළිබඳව මම හිතන්නේ සභාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා එකඟයි. බෙදීමක් නැහැ. යෝජනාව සම්මතයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට දෙවැනි යෝජනාව ඊළඟ න්‍යාය පත්‍රයට යොමු කරනවා. කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන්න තිබෙන ප්‍රශ්න මාලාව ඉදිරිපත් කිරීමට ජගත් විතානගේ ගරු මන්ත්‍රීතුමාට මම අවස්ථාව ලබා දෙනවා.

****සභාව කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්නය***
*Question asked at the time of Council Adjournment.*

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ඇමැතිතුමාට ප්‍රශ්න ඉදිරිපත් කරන්න කියලා ඔබතුමාගෙන් උපදෙස් ලැබිලා තිබෙනවා.

1. බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සඳහා බස්නාහිර පළාත තුළට පැමිණෙන හා පිටවනු ලබන දුරගමන් සේවා එසේ නොමැති නම් ගමනා ගමන කොමිෂන් සභාවට (NTC) අයත් බස් රථ පරීක්ෂා කිරීමට බලය තිබේද?

   අ. එසේ බලය නොමැති නම් අනෙකුත් පළාත් සභා මගින් එම පළාත් සභා බල ප්‍රදේශයට බස් රථ ඇතුළුවීමේදී හා පිටවීමේදී පරීක්ෂා කිරීම, දඩ පත්‍රිකා නිකුත් කිරීම, පිවිසුම් ලබා ගැනීම සිදු කරන්නේ කෙසේද?

2. බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් මෙලෙස මෙම බස් රථ පරීක්ෂා නොකිරීම නිසා බස්නාහිර පළාත් ප්‍රවාහන අධිකාරියට අයත් බස් හිමියන් දැඩි අපහසුතාවයකට පත්ව ඇති බව ඔබතුමා දන්නෙහිද?

3. බැස්ටියන් මාවත බස් පර්යන්තයෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට පිවිසුම් ගාස්තු ලැබී තිබේද?

   අ. මීට ඉහත සිටි පළාත් ප්‍රවාහන අමාත්‍යවරයා හා ප්‍රවාහන අධිකාරියේ සභාපතිවරයා විසින් මෙකී අධිකාරියේ බලතල අත්තනෝමතිකව කප්පාදු කර ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

   ආ. නැවත මෙම අධිකාරිමය බලය පළාත් ප්‍රවාහන අධිකාරිය සතු කිරීමට ඔබතුමා කටයුතු කරන්නේද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු මන්ත්‍රීතුමා, මම අද ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න බලාපොරොත්තු නැහැ. මා ළඟ පිළිතුරු නැහැ. විශේෂයෙන් NTC එක පිළිබඳව අහලා තිබෙන නිසා. න්‍යාය පත්‍රයට දාලා ප්‍රශ්නාවලියක් විධියට අහන්න. එතකොට මම උත්තර දෙන්නම්. ඊළඟ න්‍යාය පත්‍රයට දමන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඊළඟ න්‍යාය පත්‍රයට දමන්න. මෙම අවස්ථාවේදී සභාවේ වැඩ කටයුතු අවසන් වෙනවා.

# කල් තැබීම
## ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.00 ට, 2014 ඔක්තෝබර් මස 21 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 02.00 p.m till 9.30 a.m. on 21.10.2014*